
2019 අප්‍රේල් 21 – 2026 අප්‍රේල් 21
මතකය, වේදනාව සහ බලාපොරොත්තුව
වසර 07කට පසුත් යුක්තිය සොයා !
සමාජය හා සාමයික කේන්ද්‍රය

**2019 අප්‍රේල් 21 - 2026 අප්‍රේල් 21**

# මතකය, වේදනාව සහ බලාපොරොත්තුව

## වසර 07කට පසුවත් යුක්තිය සොයා !

**සමාජය හා සාමයික කේන්ද්‍රය**

**2026 අප්‍රේල් 17 වැනිද**

**2019 අප්‍රේල් 21 - 2026 අප්‍රේල් 21**

**මතකය, වේදනාව සහ බලාපොරොත්තුව**

**වසර 07කට පසුවත් යුක්තිය සොයා !**

**ප්‍රකාශනය**

2026 අප්‍රේල් 17 වැනිදා

**මගපෙන්වීම**

රොහාන් සිල්වා පියතුමා

මානව හිමිකම් ක්‍රියාධර රුකී ප්‍රනාන්දු

නීතිඥ සුරේන් ඩී පෙරේරා

**සංස්කරණය**

තරිඳු ජයවර්ධන සහ පර්යේෂණ කණ්ඩායම, සමාජය හා සාමයික කේන්ද්‍රය.

**ප්‍රකාශනය**

සමාජය හා සාමයික කේන්ද්‍රය,

ලිපිනය - අංක 281, ඩීන්ස් පාර, කොළඹ 10.

# පටුන


- පෙරවදන
- විමර්ශන 08ක් - පාස්කු විමර්ශනවල කතාව
- නිලන්තත් සැක කළ හමුදා බුද්ධි අංශ බොරුව - විනිසුරු මළල්ගොඩ කමිටුවේ කතාව
- හමුදා බුද්ධි අංශ ක්‍රියාකාරිත්වය ගැන මෛත්‍රීපාලත් ප්‍රශ්න කරයි - පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ කතාව
- රොහාන්ගේ අබු-හින්ද් කතාව සම්පූර්ණයෙන් පිළිනොගනී - විනිසුරු ජනක් ද සිල්වා කමිටුවේ කතාව
- චූදිතයන්ගෙන්ම සාක්ෂි අසා චූදිතයන් නිදහස් කරලා - විනිසුරු එස් අයි ඉමාම් කමිටුවේ කතාව
- සහරාන් - පිල්ලෙයාන් ගැන මුල්ම තොරතුර ලැබුණේ 2019 මැයි මාසයේ - 2019 අප්‍රේල් සිට 2019 නොවැම්බර් දක්වා වූ අපරාධ විමර්ශනයේ කතාව
- වසර දෙකට CID අධ්‍යක්ෂවරුන් 05ක් ! - 2019 නොවැම්බර් සිට 2024 ඔක්තෝබර් දක්වා අපරාධ විමර්ශනයේ කතාව
- යුක්තිය කෙරෙහි බලාපොරොත්තුව - 2024 ඔක්තෝබර්වලින් පසු විමර්ශනයේ කතාව
- නඩු 41ක් !
- තවදුරටත් විමර්ශනය කළ යුතු කරුණු

# පෙරවදන

කිතුනුවන්ට විශේෂ ම දිනයක් වන පාස්කු ඉරිදා දිනය උදා වූ 2019 අප්‍රේල් 21 වැනිදා කතෝලික දේවස්ථාන 02කත්, ක්‍රිස්තියානි දේවස්ථානයකත්, හෝටල් 03කත්, නවාතැන්පොළක සහ නිවසකත් බෝම්බ පුපුරුවා වසර 07ක් ඉක්ම යන මේ මොහොතේ එම ත්‍රස්ත ප්‍රහාරය ගැන විමර්ශන යම් සාධනීය දිශානතියකට යොමුවෙමින් තිබෙන බව පෙනේ.

වසර 07ක් තිස්සේ යුක්තිය වෙනුවෙන් කළ සියලු සටන්වල ප්‍රතිඵලයක් ලෙස විමර්ශන සාධනීය ඉදිරි ගමනක පැවතීමත් සමග ඊට බාධාකිරීමට විවිධ පාර්ශ්ව නොයෙක් උත්සාහයන් දරනු පෙනේ.

රටේ නැවත මෙවැනි ඛේදවාචක සිදුනොවීමට නම්, මෙම ප්‍රහාරය පිටුපස සිටින සියලුදෙනා අනාවරණය කරගැනීමත්, ඔවුන් නීතිය හමුවට පැමිණවීමත් අනිවාර්යයෙන් ම කළ යුතු ව ඇත. මෙම ප්‍රහාරය හුදු සහරාන් හෂීම් නම් අන්තවාදී ත්‍රස්තවාදියා විසින් පමණක් මෙහෙයවූවක් නොවන බවට නොයෙකුත් ඉඟි විජිත් මළල්ගොඩ විනිසුරුවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවේදී, පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාව හමුවේදී මෙන්ම ජනක් ද සිල්වා විනිසුරුවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් පරීක්ෂණ කොමිෂන් සභාවේදී ද ලැබිණි. එසේම ප්‍රහාරය සිදු වූ දා සිට විමර්ශනවල මූලික අදියරේ විමර්ශන අධීක්ෂණය කළ නිලධාරීන්ගේ ද අදහස වූයේ සහරාන්ට ඉහළින් යම් හස්තයක් තිබූ බවයි. එම හස්තය අනාවරණය කරගැනීම සහ නීතිය හමුවට පැමිණවීම මෙම අපරාධයට යුක්තිය ඉෂ්ඨ කිරීමේ කාර්යයේ ප්‍රධානතම අංගයක් වේ.

යුක්තිය යනු පුළුල් අර්ථකතනයක් සහිත මාතෘකාවකි. සත්‍ය දැනගැනීම, අපරාධ යුක්තිය, හානිපූර්ණය ද ඇතුළු ව යුක්තියේ කොටස් ගණනාවක් තිබේ. මෙම වාර්තාව මගින් අවධානය යොමුකර ඇත්තේ එම පුළුල් අර්ථකතනයට අදාළ අපරාධ යුක්තිය සහ සත්‍ය දැනගැනීම යන කොටස් දෙකට පමණි. යුක්තියේ තවත් එක් ප්‍රධාන අංගයක් වන හානි පූර්ණය ගැන මීට පෙර සමාජය හා සාමයික කේන්ද්‍රය විසින් ප්‍රසිද්ධ කරන ලද 'පාස්කු ප්‍රහාරයෙන් වින්දිතයන්ට සිදු වූ ආර්ථික සහ සමාජයීය බලපෑම' නම් වාර්තාවේ අන්තර්ගත වේ.

පාස්කු ප්‍රහාරයට යුක්තිය සොයා යන සත් වසරක ගමන් මගේදී ඊට යුක්තිය ඉෂ්ඨ කරන බවට පොරොන්දු දෙමින් විමර්ශන ගණනාවක් සිදු විය. ඒ ඇතැම් විමර්ශන තොරතුරු තවමත් සමාජයට විවෘත කර නැත. සමාජය හා සාමයික කේන්ද්‍රය 2024 ඔක්තෝබර් මාසයේදී ජනාධිපතිවරයාට ලිපියක් යොමුකරමින් අදාළ සියලු කමිටු / කොමිෂන් වාර්තා ප්‍රසිද්ධ කරන ලෙස ඉල්ලා සිටියේය. එසේම එම සියලුම විමර්ශන ගැන යළිත් සොයාබැලීමට විධිමත් යන්ත්‍රණයක් ස්ථාපිත කරන ලෙස ද ඉල්ලා සිටියේය. 2024 ඔක්තෝබර් 04 වැනිදා සමාජය හා සාමයික කේන්ද්‍රය ජනාධිපතිවරයාට යොමුකළ ලිපියේ සඳහන් කරුණු කිහිපයක් මෙසේ ය. අප විසින් යොමුකළ අදාළ ලිපියේදී විමර්ශකයන්ට එල්ල විය හැකි තර්ජන පූර්වානුමාන කිරීම ගැන පවා සඳහන් ව තිබේ. කෙසේ වෙතත් එම ලිපියෙන් ඉල්ලා සිටි බොහෝ ඉල්ලීම් මේ වන තෙක් ඉටු වී නැති අතර, එහි එක් ප්‍රතිඵලයක් ලෙස විමර්ශකයන්ට දිගින්-දිගටම එල්ල වන බලපෑම් සහ තර්ජන උදාහරණ ලෙස දැක්විය හැකිය. ජනාධිපතිවරයාට යොමුකළ ලිපියේ කොටස් කිහිපයක් පමණක් පහත සඳහන් වේ.

I. පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරය සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කළ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සහ විනිසුරු මළල්ගොඩ කමිටුවේ මේ වන විට ප්‍රසිද්ධියට පත් කර ඇත්තේ අවසන් වාර්තාව පමණි. එසේම චැනල් ෆෝ නාලිකාවේ අනාවරණය ගැන සෙවූ ජනාධිපති කමිටුව සහ විනිසුරු ජයකි ද අල්විස් කමිටුවේ අවසන් වාර්තාව හෝ වෙනත් ලියවිල්ලක් හෝ මේ වන තෙක් ප්‍රසිද්ධියට පත් කර නැත. එසේ හෙයින් උනන්දුවක් ඇති පාර්ශ්වවලට පරිශීලනය කිරීම සඳහා ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ සියලුම වෙළුම් සහ සෙසු පරීක්ෂණ කමිටුවල සියලුම වෙළුම් ප්‍රසිද්ධ කරන ලෙස ඉල්ලා සිටිමු. සියලුදෙනාගේ පහසුව සඳහා මෙම වෙළුම්වල / ලේඛනවල මෘදු පිටපත් පහසුවෙන් බාගත කළ හැකි පරිදි ජනාධිපති ලේකම් කාර්යාල වෙබ් අඩවියේ හෝ රජයේ වෙනත් වෙබ් අඩවියක පළකිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.

II. ප්‍රහාරය සම්බන්ධයෙන් මේ වන තෙක් කළ සියලුම පරීක්ෂණවලට (ජනාධිපති කොමිෂන් සභා / විනිසුරු මළල්ගොඩ කමිටුව / අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ ත්‍රස්ත මර්දන ඒකකයේ පරීක්ෂණ / චැනල් ෆෝ කමිටුව සහ විනිසුරු ජයකි ද අල්විස් කමිටුව) අදාළ සියලුම කටඋත්තර, පොත්පත් ඇතුළු සියලු ලේඛන සුරක්ෂිත කිරීමට අදාළ පියවර ගත යුතුය. ලේඛන වශයෙන් පවතින සාක්ෂි ස්කෑන් කොට ඩ්‍රයිව් (Drive) එකකට අප්ලෝඩ් කර ආරක්ෂා කළ යුතු අතර, සමහර ලේඛන පවතින්නේ එක් පිටපතක් ලෙස නම්, එම ලේඛනවලින් පිටපත් කිහිපයක් තබාගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.

III. විමර්ශනයේදී සොයාගන්නා ලද නඩු භාණ්ඩ නිශ්චිතව කුමන නිලධාරීන්, කුමන ආයතන මගින් අත්අඩංගුවට ගත්තේද යන්න සහ ඒවා කුමන නිලධාරීන් මගින් දැනට පවතින ස්ථානවලට ගොස් ඇත්ද යන්න නිවැරදිව හඳුනාගෙන ඒ සම්බන්ධව තොරතුරු නිවැරදිව ලේඛනගත කර සාක්ෂිවල ආරක්ෂාව සහ අධිකරණ කටයුතුවලට භාවිත කළ හැකි ලෙස විශ්වාසනීයභාවය සහතික කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

IV. මූලික විමර්ශනවලට සම්බන්ධ වූ හෝ අධීක්ෂණය කළ නිලධාරීන් විශ්‍රාම ගොස් ඇත්නම් විමර්ශන අවසන් වන තෙක් ඔවුන් නැවත සක්‍රීය සේවයට කැඳවිය යුතු අතර, මූලික විමර්ශනයට සම්බන්ධ වූ හෝ අධීක්ෂණය කළ නිලධාරීන් කලින් සේවය කරමින් සිටි ස්ථානයෙන් වෙනත් ස්ථානයකට මාරුවීම් ලැබ ගොස් ඇත්නම් ඔවුන් යළි කැඳවිය යුතුය.

V. පාස්කු සිදුවීම ගැන මෙතෙක් කළ විමර්ශනවල ප්‍රගතිය ගැන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් විස්තරාත්මක නිවේදනයක් නිකුත් කළ යුතු අතර, දැනට කළ විමර්ශනවලට අදාළ ගැටලුවලට පිළිතුරු සැපයීම සඳහා විශේෂ මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්විය යුතුය.

VI. පාස්කු ප්‍රහාරය ගැන සොයාබැලීමට පූර්ණ බලැති කොමිෂන් සභාවක් පත්කරන බව ජාතික ජන බලවේගය 2023 අප්‍රේල් 17 වැනිදා ප්‍රසිද්ධියට පත්කළේය. ඒ අනුව මෙම සිදුවීම් ගැන සොයාබැලීම සඳහා පත්කළ යුතු දෙස් - විදෙස් සුදුස්සන්ගෙන් සමන්විත පූර්ණ බලැති මිශ්‍ර කොමිෂන් සභාවක් පත්කිරීමට අදාළ දේශපාලන අභිප්‍රාය ප්‍රකාශයට පත්කළ යුතු අතර, ඉදිරි මහ මැතිවරණයෙන් (2024 නොවැම්බර්)

පසු ඊට අදාළ ව අමාත්‍ය මණ්ඩල තීන්දු ගන්නා බව ප්‍රකාශයට පත්කළ යුතුය. එසේම එම කොමිෂන් සභාවේ කටයුතු විනිවිදභාවයෙන් සිදුවීම සහතික කිරීම පිණිස එහි කටයුතු දැකබලාගැනීම සඳහා දෙස් - විදෙස් නිරීක්ෂකයන්ට අවස්ථාව සැලසිය යුතුය.

VII. පාස්කු ඉරිදා එල්ල වූ ම්ලේච්ඡ ප්‍රහාරයට අදාළ ව පත්කරන කොමිසම ඇතුළු ඉදිරි කටයුතු සිදු කළ යුතු ආකාරය ගැන මහජන අදහස් විමසීමේ වැඩසටහනක් ආරම්භ කළ යුතුය.

VIII. විමර්ශන නිලධාරීන්ට සිදුවිය හැකි බලපෑම් සහ තර්ජනය පූර්වානුමාන කර ඊට අදාළ පියවර ගත යුතු අතර ඔවුන්ට අපක්ෂපාතීව විමර්ශන සිදුකරගෙන යා හැකි වටපිටාවක් සකස් කළ යුතුය.

අපරාධ යුක්තිය සහ විනය ක්‍රියාමාර්ග

i. පාස්කු ඉරිදා එල්ල කළ බෝම්බ ප්‍රහාරය පිටුපස සිටින මහමොළකරුවන් සහ සැලසුම්කරුවන් නීතිය ඉදිරියට ගෙන ඒම ජාතික ජන බලවේග ආණ්ඩුවේ ප්‍රමුඛතම කටයුත්ත බව 2023 අප්‍රේල් 17 දිනැති ප්‍රතිඥාවේ අංක 01 යටතේ සඳහන් කර තිබේ. ඒ අනුව අදාළ මහමොළකරුවන් සහ සැලසුම්කරුවන් අනාවරණය කර ගැනීමටත්, ඔවුන් අත්අඩංගුවට ගෙන අධිකරණ ක්‍රියාවලියකට යොමුකිරීමටත්, සාධාරණ නඩු විභාගයක් මගින් දඬුවමකට යටත් කිරීමටත් අවශ්‍ය කටයුතු සිදු කළ යුතු අතර, විමර්ශනවලදී එම කටයුත්ත සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

ii. දැනට පාස්කු ප්‍රහාරයට අදාළ විමර්ශන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාසය ඇතුළු විමර්ශන අංශ කිහිපයක් මගින් සිදුකරගෙන යයි. එම විමර්ශනවල විමර්ශකයන් ඉවත් කිරීම / මාරු කිරීම සහ පක්ෂග්‍රාහී විමර්ශකයන් ලවා විමර්ශනය කිරීම ඇතුළු චෝදනා ගණනාවක් පසුගිය කාලයේ එල්ල විය. එම නිසා මෙම අපරාධය ගැන සොයාබැලීම සඳහා විශේෂ විමර්ශන කාර්යාංශයක් ස්ථාපිත කළ යුතු අතර, එය පෙර කී පූර්ණ බලැති පරීක්ෂණ කොමිෂන් සභාවේ සහ අලුතින් ස්ථාපිත කරන අභියෝචක කාර්යාලයේ අධීක්ෂණයට යටත් කළ යුතුය.

iii. පාස්කු ප්‍රහාරයේ දැනට සොයාගැනීම්වලට අනුව අදාළ පුද්ගලයන්ට විනය ක්‍රියාමාර්ග ගැනීම - පාස්කු ඉරිදා ප්‍රහාරය එල්ලවීමෙන් පසු නීතිපතිවරයාගේ උපදෙස් මත එවකට වැඩබලන පොලිස්පති චන්දන වික්‍රමරත්න මහතා විසින් පොලිසියේ රාජකාරි පැහැර හැරීම ගැන මූලික විමර්ශනයක් කරන ලෙස පොලිස් විශේෂ විමර්ශන ඒකකයට දැනුම් දුන්නේය. එම ඒකකය මගින් කළ මූලික පරීක්ෂණය අනුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් පතිනායක, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඒ කේ සී අතුකෝරළ, පොලිස් අධිකාරි එල් එම් සංජීව බණ්ඩාර, සහකාර පොලිස් අධිකාරි කේ එම් ආර් එස් බී කුමාරසේන සහ සහකාර පොලිස් අධිකාරි (දැන් පොලිස් අධිකාරි) එච් බී එස් එස් සිසිර කුමාර යන උසස් පොලිස් නිලධාරීන් පිරිස ඇතුළු සියලුම නිලධාරීන්ට අදාළ ව චෝදනාපත්‍ර නිකුත් කර විනය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවට නිර්දේශ කර තිබිණි.

ඒ අනුව එම මූලික විමර්ශනය පාදක කරගෙන අදාළ විනය පරීක්ෂණ සිදුකිරීම ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.

iv. ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් අපරාධ නඩු පැවරීමට නිර්දේශ කර ඇති ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ, පොලිස් අධිකාරී සංජීව බණ්ඩාර, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී චන්දන අතුකෝරළ, පොලිස් අධිකාරී බී ඊ අයි ප්‍රසන්න, ප්‍රධාන පොලිස් පරීක්ෂක ආර් එම් සරත් කුමාරසිංහ, ප්‍රධාන පොලිස් පරීක්ෂක සාගර විලේගොඩ ලියනගේ ඇතුළු නිලධාරීන්ට සහ විනය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කර ඇති ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්, සහකාර පොලිස් අධිකාරී සිසිල කුමාර, පොලිස් පරීක්ෂක චමින්ද නවරත්න ඇතුළු නිලධාරීන්ට එරෙහිව චෝදනාපත්‍ර නිකුත් කර විනය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.

v. නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ 21 වැනි පරිච්ඡේදයේ කරුණු රැසක් අනාවරණය කර තිබේ. ඒ අනුව අදාළ නිලධාරීන්ට විනය පියවර ගැනීම සහ එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.

vi. චැනල් ෆෝ නාලිකාව අසාද් මවුලානා නම් පුද්ගලයකුගේ අනාවරණයක් පාදක කරගෙන වාර්තා කළේ මෙම ප්‍රහාරය පිටුපස සුරේෂ් සලේ නම් පුද්ගලයා සිටින බවයි. එසේම ප්‍රහාරයට සහ / හෝ ප්‍රහාරය වළක්වා ගැනීමට රාජ්‍ය බුද්ධි සේවයේ අසමත්කම ගැන ද චෝදනා එල්ල විය. මීට අදාළ සාක්ෂි රැසක් සහිත රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයා ලෙස 2019 ආණ්ඩු මාරුවෙන් පසු සුරේෂ් සලේ නමැත්තා පත්කරන ලදි. චැනල් ෆෝ නාලිකාවේ අනාවරණයට ලක්වී සිටින සුරේෂ් සලේ මහතා වහාම මෙම ප්‍රහාරයට අදාළ සාක්ෂි රැසක් සහිත රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ තනතුරෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.

vii. පාස්කු ප්‍රහාරය සම්බන්ධ මූලික පරීක්ෂණ පවත්වන ලද කණ්ඩායම් නැවත පත්කර, නැවත මූලික පරීක්ෂණ ආරම්භ කිරීම සහ ඒ සඳහා කඩිනම් පියවර ගැනීම.

viii. පාස්කු ප්‍රහාරයට සම්බන්ධ පරීක්ෂණ කටයුතු පෙර සඳහන් කළ පරිදි සිදු කළ යුතු අතර, ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ත්‍රිවිධ හමුදාවට විධාන කිරීමට සේනාධිනායකයා ලෙස ජනාධිපතිවරයාට හැකියාව ඇත.

ix. විදේශගතව සිටින පාස්කු ප්‍රහාරය හා සම්බන්ධ සාක්ෂිකරුවකු වන අසාද් මවුලානාගේ සාක්ෂිය කඩිනමින් වාර්තා ගත කළ යුතුය. එසේම විදේශගතව සිටින වෙනත් සාක්ෂිකරුවන්ට සහ තොරතුරුකරුවන්ට ද අපහසුතාවකින් තොරව වීඩියෝ කොන්ෆරන්ස් මාර්ගයෙන් හෝ වෙනත් ඒ හා සමාන ක්‍රමවේදයක් යටතේ හෝ පහසුවෙන් සම්බන්ධ වී සාක්ෂි හෝ තොරතුරු ලබාදීමට අවස්ථාව සැලසිය යුතුය.

x. නීතිපති දෙපාර්තමේන්තුවේ මෙම විමර්ශන සඳහා උපදෙස් ලබාගැනීමට ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයකු හෝ සොලිසිටර් ජනරාල්වරයකු ඇතුළත් කණ්ඩායමක් නම් කළ යුතුය. මීට පෙර අපගේ යෝජනාවලියේ සඳහන් කළ පරිදි නීතිපති

දෙපාර්තමේන්තුව ගැන ඇති මහජන විශ්වාසය බිඳවැටීම සහ ළබැඳියාවන් අතර ගැටුමක සිටින හෙයින් මහ මැතිවරණයෙන් (2024 නොවැම්බර්) පසු විමර්ශන අධීක්ෂණය කිරීමට සහ නඩු පැවරීමට අදාළ ව විශේෂ අභිචෝදක කාර්යාලයක් ස්ථාපිත කරන බව ප්‍රකාශයට පත්කළ යුතුය.

xi. විමර්ශනයේ අක්‍රමිකතා ඇති ඉහළ බලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතුය. මෙම විමර්ශනය කරගෙන යන අතරතුර සාක්ෂි වෙනස් කිරීමට හෝ සාක්ෂි විනාශ කිරීමට හෝ විමර්ශන නොමග ගෙනයෑමට උත්සාහ කළ පිරිස් සම්බන්ධයෙන් සොයා බලා විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට අදාළ මූලික කටයුතු ආරම්භ කළ යුතුය.'

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයට අදාළ ව මෙතෙක් කළ සියලු විමර්ශන ගැන මෙන්ම එම විමර්ශනවලදී සියලු පුද්ගලයන් දුන් ප්‍රකාශ ගැන නැවත අවධානය යොමුකිරීම අතිශයින් වැදගත් වන අතර, ඊට හේතුව වන්නේ එම ඇතැම් කමිටු සහ කොමිෂන්වලදී වැදගත් කරුණු අනාවරණය වී ඇතත් මේ වන තෙක් ඒ ගැන නිසි අවධානයක් යොමු නොවීම ය.

ඒ අනුව පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයට අදාළ ව මෙතෙක් කරන ලද විමර්ශන ගැන මෙම වාර්තාව මගින් කරුණු ඉදිරිපත් කරන අතර, මෙම වාර්තාවේ අරමුණ මෙම සියලු විමර්ශනවලට අදාළ සාක්ෂි සහ වෙනත් සාධක මේ වන විට කරගෙන යන විමර්ශනවලට දායක කරගැනීමට යම් බලපෑමක් කිරීම සහ එම ඇතැම් විමර්ශනවල සත්‍ය දේශපාලන අරමුණ හෙළිදරව් කිරීම ය.

යුක්තිය සොයා වසර 07ක් පියමන් කළ පසු, යුක්තිය ගැන යම් බලාපොරොත්තුවක් තබාගැනීමට පදනමක් දැන් සැකසෙමින් තිබේ. ඊට අත්තිවාරම වූයේ වසර 07ක් පුරා ඔබ, අප සියලුදෙනා කළ නොනිමි අරගලයයි. ඉතින්, අපි මෙවර අප්‍රේල් 21න් ඇරඹෙන වසර යුක්තියේ බලාපොරොත්තුව ඉටුවන වසරක් කරගැනීමට අවශ්‍ය බලපෑම් තවදුරටත් කරමු. දුක සහ විඩාව පසෙකලා තවදුරටත් සටන් කරමු. 2027 අප්‍රේල් 21 වන විට යම් තරමකට හෝ යුක්තියට ළඟා වූ සාර්ථක ගමනක් දෙස ආපසු හැරී බැලීමට හැකි තත්ත්වයක් ගොඩනැගේවා යැයි අපි ප්‍රාර්ථනා කරමු. එම ප්‍රාර්ථනාව ඉටු කර ගැනීමට යා යුතු මඟ තරමක් දුෂ්කර වනු ඇත. වසර 07ක් ගෙවා අප පැමිණි මාර්ගයේ යා යුතු ඉතිරි දුර ද තිර අදිටනින් යුතුව යෑමට එක් වන ලෙස අපි ඔබ සියලුදෙනාට ආරාධනා කරමු.

**පර්යේෂණ කණ්ඩායම**
**සමාජය හා සාමයික කේන්ද්‍රය**
2026 අප්‍රේල් 17 වැනි දා

# පළමු පරිච්ඡේදය

## විමර්ශන 08ක් - පාස්කු විමර්ශනවල කතාව

පාස්කු ඉරිදාවක් වූ 2019 අප්‍රේල් 21 දින එල්ල කෙරුණු ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් ගෙවුණු වසර 07ක කාලය තුළදී විමර්ශන කිහිපයක් සිදු විය.

1) විනිසුරු විජිත් මළල්ගොඩ කමිටුව
2) විනිසුරු ජනක් ද සිල්වා ජනාධිපති කොමිසම
3) පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව
4) විනිසුරු එස් අයි ඉමාම් කමිටුව
5) විනිසුරු ජයකි ද අල්විස් කමිටුව
6) 2019 අප්‍රේල් - 2019 නොවැම්බර් අපරාධ විමර්ශනය
7) 2019 නොවැම්බර් - 2024 සැප්තැම්බර් අපරාධ විමර්ශනය
8) 2024 ඔක්තෝබර් - මේ දක්වා අපරාධ විමර්ශනය

මෙම විමර්ශන අතරින් විනිසුරු විජිත් මළල්ගොඩ කමිටුව එවකට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් 2019 අප්‍රේල් මාසයේදී ම පත්කරනු ලැබීය. එය ජනාධිපති කොමිසමක් නොව ජනාධිපතිවරයා විසින් කරුණු සොයාබැලීමට පත්කරන ලද කමිටුවකි. මෙම කමිටුවට යම් නීතියක් යටතේ පැවරූ නිසි බලයක් නොතිබුණද, ප්‍රහාරයෙන් පසු සත්‍ය සොයා ගැනීම සඳහා ඔවුන් සැලකිය යුතු පිරිසකගෙන් ප්‍රකාශ ලබාගැනීම සිදු විය.

විනිසුරු ජනක් ද සිල්වා කොමිසම යනු පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත්කරන ලද ජනාධිපති කොමිසමකි. පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව පත්කරනු ලැබුවේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විශේෂ යෝජනා සම්මතයකින් පසුව වන අතර, එවකට ප්‍රධාන විපක්ෂය වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය මෙම කමිටුවේ සාමාජිකයන් ලෙස කටයුතු කිරීම ප්‍රතික්ෂේප කළේය.

බ්‍රිතාන්‍යයේ චැනල් ෆෝ නාලිකාව 2023 සැප්තැම්බර් මාසයේදී පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය ගැන ඉදිරිපත් කළ වාර්තා වැඩසටහනෙන් පසු විනිසුරු එස් අයි ඉමාම් කමිටුව පත්කෙරිණි. එය ජනාධිපතිවරයා විසින් යම් නීතියක් යටතේ නිසි බලතය පැවරීමක් රහිතව පත් කළ කමිටුවකි. පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයේ විමර්ශනවල මුල් අවධියේදී එම විමර්ශන අධීක්ෂණය කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිව සිටි රවී සෙනෙවිරත්න මහතා ජාතික ජන බලවේගයේ විශ්‍රාමික පොලිස් සාමූහිකය පිහිටුවීම සහ එහි ආරම්භක වැඩසටහනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂව සිටි ශානි අබේසේකර මහතා සහභාගිවීමෙන් පසු ජනාධිපතිවරයා විසින් විනිසුරු ජයකි ද අල්විස් කමිටුව පත්කරනු ලැබීය. එය ද යම් නීතියක් යටතේ පැවරූ බලතල සහිත කමිටුවක් නොවේ.

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය ගැන මූලික විමර්ශන 2019 වසරේ අප්‍රේල් සිට 2019 නොවැම්බර් දක්වා ක්‍රියාත්මක වූයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කේන්ද්‍ර කර ගනිමිනි. අදාළ දිනයේදී එල්ල කෙරුණු ප්‍රහාර අතරින් ට්‍රොපිකල් ඉන් ලැගුම්හලේ ප්‍රහාරය හැර සෙසු සියලු ප්‍රහාර ගැන විමර්ශනය කරනු ලැබුවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසිනි. කෙසේ වෙතත් 2019 නොවැම්බර් මාසයේ ජනාධිපතිවරණයෙන් පසු විමර්ශන අධීක්ෂණය කළ ප්‍රධාන නිලධාරියාත්, තවත් නිලධාරීන් පිරිසකුත් ඉවත් කර අලුතින් පත්කරන ලද නිලධාරීන් පිරිසක්

ලවා විමර්ශන සිදුකරනු ලැබීය. 2024 සැප්තැම්බර් ජනාධිපතිවරණයෙන් පසු එම විමර්ශන නැවතත් වෙනත් කෝණයකින් ආරම්භ විය. දැනට ක්‍රියාත්මක වන විමර්ශනයට පාදක වී ඇත්තේ සමාජය හා සාමයික කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ රොහාන් සිල්වා පියතුමා විසින් කරන ලද පැමිණිල්ලකි.

මෙම සියලු විමර්ශන / කරුණු සොයාබැලීම් ගැන ඉදිරියේදී වෙනම දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කරනු ඇත. එහෙත් රවී සෙනෙවිරත්න මහතා සහ ශානි අබේසේකර මහතා ජාතික ජන බලවේගයේ විශ්‍රාමික පොලිස් සාමූහිකයට එක්වීම 2024 ජුනි 09 වැනිදා ප්‍රසිද්ධියට පත්වීමෙන් පසු 2024 ජුනි 12 වැනිදා රනිල් වික්‍රමසිංහ මහතා විසින් ජයකි ද අල්විස් කමිටුව පත් කළ අතර, එය බැලූ බැල්මට ඒ දෙදෙනා ඉලක්ක කරගෙන නිර්මාණය කළ කමිටුවක් බැවින් මෙම වාර්තාවට එම කමිටුව ගැන තොරතුරු ඇතුළත් නොකෙරේ.

## දෙවැනි පරිච්ඡේදය

## නිලන්තත් සැක කළ හමුද බුද්ධි අංශ බොරුව - විනිසුරු මළල්ගොඩ කමිටුවේ කතාව

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය එල්ලවීමත් සමග ඒ ගැන සොයාබැලීම සඳහා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු විජිත් කේ මළල්ගොඩ මහතාගේ සභාපතිත්වයෙන් යුත් ත්‍රිපුද්ගල කමිටුවක් පත් කළේය. එම කමිටුව පත්කරනු ලැබුවේ ප්‍රහාරයෙන් පැය 24ක් යන්නටත් මත්තෙනි.[1i] එම කමිටුවේ සෙසු සාමාජිකයන් වූයේ විශ්‍රාමික පොලිස්පති නුගගහ කපල්ලේ ඉලංගකෝන් මහතා සහ විශ්‍රාමික පරිපාලන නිලධාරි පද්මසිරි ජයමාන්න මහතා ය.[2]

මෙම කමිටුව නීතියක් මගින් ස්ථාපනය කරන ලද බලයක් සහිත කොමිසමක් නොවේ. මෙය කරුණු සෙවීම (fact finding) සඳහා ජනාධිපතිවරයා විසින් ලිපියක් මගින් පත්කරන ලද කමිටුවකි. එම කමිටුව සාක්ෂි ලබාගැනීම සම්බන්ධයෙන් පුවත්පත් දැන්වීමක් ද පළ කළ අතර, 2019 අප්‍රේල් 25 වැනිදා සාක්ෂි විමසීම ආරම්භ කළේය. එතැන් සිට 2019 මැයි 31 වැනිදා වන තෙක් ආසන්න වශයෙන් 60 දෙනකුගෙන් පමණ සාක්ෂි (ප්‍රකාශ) සටහන් කරගැනීම සිදු විය.[3] මෙම කමිටුව සඳහා මූලිකව ලබා දී තිබුණේ සති 02ක කාලසීමාවක් වන අතර, පසුව තවත් සති 03ක කාලසීමාවක් කමිටුවේ කටයුතු සඳහා ලබාදීම සිදු විය.

මෙම කමිටුවේ වැදගත්ම සහ විශේෂිතම කාරණය වන්නේ පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් තමන්ගේ මතයක් ගොඩනගා ගැනීමට පෙර ම මෙම කමිටුව ඇතැම් පාර්ශ්වකරුවන්ගෙන් සාක්ෂි (ප්‍රකාශ) ලබාගැනීම ය. ඒ ගැන කමිටුවේ සභාපතිව සිටි එවකට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු විජිත් කේ මළල්ගොඩ මහතා 2019 අගෝස්තු 30 වැනිදා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව[4] ඉදිරියට පැමිණ මෙසේ ප්‍රකාශ කළේය.[5]

"අපි ඉදිරියට පැමිණ සාක්ෂි දුන් සමහර සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සම්බන්ධයෙන් කල්පනා කරන කොට සිද්ධිය සිදුවූ සැණින් ඔවුන් අපි ඉදිරියට ගෙන්වා ඔවුන් හිතන්න ඉස්සර වෙලා අපට ඔවුන්ගෙන් ප්‍රශ්න අහන්න සිදු වුණු නිසා ඔවුන්ට උණු-උණුවේ යම්-යම් දේවල් කියන්න සිදු වුණා."

මෙම කමිටුවේ තවත් එක් විශේෂත්වයක් වූයේ එසේ ලබා දුන් සාක්ෂි පටිගත කිරීම ය. ඒවා සංයුක්ත තැටිවල ගබඩා කර ජනාධිපති ලේකම් කාර්යාලයට බාර දීම සිදු විය.

විධායක සාරාංශය, ප්‍රධාන වාර්තාව, නිරීක්ෂණ, නිර්දේශ වැනි කොටස් කිහිපයකින් එම කමිටුව විසින් සකස් කරන ලද වාර්තාව සමන්විත විය. එය දළ වශයෙන් පිටු 140කට ආසන්න වූ බව

---

[1]1296 පිටුව, සාක්ෂ්‍ය සටහන් 2 වන වෙළුම, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.

[2]2019 අප්‍රේල් 22, අද දෙරණ

[3]1297 පිටුව, සාක්ෂ්‍ය සටහන් 2 වන වෙළුම, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.

[4]2019 අප්‍රේල් 21 වන දින ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාර පිළිබඳ සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තාකිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව.

[5]1297 පිටුව, සාක්ෂ්‍ය සටහන් 2 වන වෙළුම, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.

කමිටු සභාපති විනිසුරු විජිත් කේ මලල්ගොඩ මහතා 2019 අගෝස්තු 20 වැනිදා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. ඊට අමතරව සටහන් කර ගත් සාක්ෂි, පටිගත කරන ලද සාක්ෂි, පරීක්ෂණ මණ්ඩලය පරීක්ෂණය අතරතුර සිය භාරයට ගනු ලැබූ ලේඛන ආදිය ද ජනාධිපති ලේකම් කාර්යාලයට බාර දෙනු ලැබූ අතර, පෙර සඳහන් කළ අවසන් වාර්තාව ජනාධිපතිවරයා වෙත බාරදීම සිදු වූයේ 2019 ජුනි 10 වැනිදාය.[6iiiii]



*(ඡායාරූපය ජනාධිපති මාධ්‍ය අංශය)*[iv]

කමිටුව විසින් වෙළුම් වශයෙන් සකස් කර බාරදෙන ලද සාක්ෂි, ලැබුණු ලිඛිත සැලකිරීම්, පරීක්ෂණ මණ්ඩලය සිය භාරයට ගනු ලැබූ ලියකියවිලි, සාක්ෂි පටිගතකිරීම් ඇතුළු සියලුම ලේඛන නිසි ආකාරයෙන් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට බාර දුන් බවට පරීක්ෂණ මණ්ඩලයේ ලේකම්වරයා 2019 ජූලි 02 දිනැති ලිපියක් මගින් මෙම පරීක්ෂණ කමිටුවේ සාමාජිකයන් තිදෙනාටම දැනුම් දුන්නේය.[7]

කමිටුව විසින් ජනාධිපතිවරයා වෙත බාර දෙන ලද වාර්තාව ප්‍රසිද්ධියට පත් නොකළ අතර, එය ප්‍රසිද්ධියට පත්කිරීම සිදු වූයේ වාර්තාව බාර දී වසර 04කට පසු ය. සමාජය හා සාමයික කේන්ද්‍රය වෙනුවෙන් එවකට එහි පරීක්ෂණ කණ්ඩායමේ සාමාජිකයකු වූ වර්තමානයේ නීතිඥවරයකු වන ධනුෂ්ක ද සිල්වා මහතා ජනාධිපති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමට එම කාර්යාලය ගත් තීන්දුවට එරෙහිව තොරතුරු කොමිසමට ඉදිරිපත් කළ අභියාචනයක[8] ප්‍රතිඵලයක් ලෙස 2023 වසරේදී මෙම වාර්තාවේ විධායක සාරාංශය සහ නිර්දේශ ඇතුළත් කොටස මුදාහැරීම සිදු විය.

එම වාර්තාවේ විධායක සාරාංශයේ ඇතුළත් එක් ප්‍රධාන නිරීක්ෂණයක් වූයේ 2015 වසරේ පමණ සිට ඉස්ලාම් අන්තවාදය ගැන තොරතුරු ලැබී ඇතත් වගකිවයුත්තන් සාම්ප්‍රදායික ඉස්ලාම් අදහස් සහ අන්තවාදය අතර පවතින වෙනස තේරුම්ගැනීමට අසමත් වී ඇති බවයි.[9] මෙහි සඳහන් තවත් වැදගත් නිරීක්ෂණයක් වූයේ ප්‍රහාරයට පෙර ලැබුණු බුද්ධි තොරතුරු බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ මහතාට ලැබුණු පසු ඒ මහතා විසින් ඔහු යටතේ

---

[6]2019 ජුනි 10, සිරස නිවුස් ෆස්ට්

[7]1297 පිටුව, සාක්ෂ්‍ය සටහන් 2 වන වෙළුම, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.

[8]CSR/RTI/002, RTIC/---/---

[9]2019 ජුනි, 2019 අප්‍රේල් මස 21 වන දින දිවයිනේ ස්ථාන කිහිපයක සිදුවූ පිපිරීම් ආශ්‍රිත සිදුවීම් මාලාව සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා වන විශේෂ පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාවෙහි විධායක සාරාංශය සහ එහි අඩංගු නිර්දේශයන්

සිටින නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට ලබා දුන් උපදෙස් මාලාවයි. ඒ ගැන අදාළ කමිටු වාර්තාවේ විධායක සාරාංශයේ සඳහන් කර ඇත්තේ මෙසේ ය. (සිදුවීම වන අවස්ථාවේදී බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස කටයුතු කරමින් සිටියේ නන්දන මුණසිංහ මහතාය. පොලිස්පති පූජිත් ජයසුන්දර මහතාගෙන් මෑතකදී එල්ල විය හැකි ප්‍රහාරයක් ගැන බුද්ධි තොරතුර ලැබුණු පසු මුණසිංහ මහතා තමා යටතේ සිටින නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට නියෝග 4ක් ලබා දුන් අතර එහි එක් නියෝගයක් වූයේ සහරාන් ඇතුළු පිරිසගේ ඡායාරූප සොයාගෙන ඔවුන් සැඟවී සිටින්නේද යන්න ගැන සියලුම නවාතැන්පොළවල් සහ කුලීනිවාස පරීක්ෂා කරන ලෙසයි.)

"අදාළ නියෝජ්‍ය පොලිස්පතිවරුන් වෙත යොමුකරන ලද ලිපියේදී ඔහු වැදගත් උපදෙස් කිහිපයක් ලබා දී ඇති අතර, එම උපදෙස් අදාළ පොලිස් ස්ථානයන් විසින් පිළිපදිනු ලැබුවේ නම්, 2019 අප්‍රේල් 21 වන දින සිදු වූ සිදුවීම් අවම කර ගැනීමට ඉඩ තිබූ බව පරීක්ෂණ මණ්ඩලය විසින් නිරීක්ෂණය කරන ලදි."

එසේම පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයෙන් මරණයට පත්වූවන් ගැන තිබූ සංඛ්‍යාත්මක පරස්පරයන් ද මුල් අවස්ථාවේදීජම මෙම කමිටුව නිරීක්ෂණය කර ඇත. කමිටු වාර්තාවේ විධායක සාරාංශයේ 009 ලෙස සටහන් පිටුවේ සඳහන් කර ඇත්තේ එවකට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා කමිටුව ඉදිරියේ ප්‍රකාශ ලබාදෙමින් 2019 මැයි 05 වන විට මෙම ත්‍රස්ත ප්‍රහාරය නිසා සිදු වූ මරණ ගණන 259ක් ලෙසත්, තුවාලකරුවන් ගණන 497ක් ලෙසත් සඳහන් කළ බවයි. කෙසේ වෙතත් පොලිසිය සතු වූ දත්ත ඊට වඩා වෙනස් විය.

කමිටු වාර්තාවේ 013 පිටුවේ ඉතා වැදගත් නිරීක්ෂණයක් සඳහන් කරමින් කමිටුව සඳහන් කරන්නේ ප්‍රහාරය සඳහා වගකිවයුත්තේ ජාතික තවුහිද් ජමාත් බව නිගමනය කිරීමට සහ ජාතික තවුහිද් ජමාත් නායකයා සහරාන් හෂීම් බවට නිගමනය කිරීම සඳහා සෑහීමකට පත්විය හැකි සාක්ෂි නොමැති බවයි. එම සඳහන් කිරීමේ උපුටනය මෙසේ ය.

"පරීක්ෂණ මණ්ඩලය විසින් පාස්කු ඉරිදා ප්‍රහාරය පිටුපස සිටින කණ්ඩායම හඳුනාගැනීමේ උත්සාහයක් ද සිදුකරන ලදි. පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් වූ සාක්ෂිවලින් මෙම ප්‍රහාරය සහරාන් හෂීම් විසින් මෙහෙයවනු ලැබූ කණ්ඩායම විසින් කළ බවට තහවුරු වුවද, ප්‍රහාරය සඳහා වගකිවයුත්තේ ජාතික තවුහිද් ජමාත් බව නිගමනය කිරීමට සහ ජාතික තවුහිද් ජමාත් නායකයා සහරාන් හෂීම් බවට නිගමනය කිරීම සඳහා සෑහීමකට පත්විය හැකි සාක්ෂි නොමැත."





එසේම මෙම ප්‍රහාරයට අදාළ ව අතපසුවීම් පරීක්ෂණ මණ්ඩලය විසින් ක්ෂේත්‍ර 05ක් යටතේ හඳුනා ගත්තේය.

1) බුද්ධි අංශ
2) විමර්ශන
3) සන්නිවේදන
4) මෙහෙයුම් ක්‍රියා පටිපාටිය
5) පරිපාලන ක්‍රියා පටිපාටිය

පරීක්ෂණ මණ්ඩල වාර්තාවේ විධායක සාරාංශයේ අවසන් ඡේදය මෙසේ ය.

"මෙම තත්ත්වයන් තුළ මහජනයා අපේක්ෂා කරන පරිදි යම්-යම් පුද්ගලයන්ගේ සබඳතා විමර්ශනය කිරීමට පරීක්ෂණ මණ්ඩලයට නොහැකි විය. මෙම කරුණු පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ තුළ ද සඳහන් කර ඇත."

එයින් පැහැදිලි වන්නේ පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සිදු වූ දින සිට සති 05ක කාලයක් වැනි ඉතා ආසන්නම කාලයකදී පවා මෙම ප්‍රහාරය පිටුපස යම්-යම් පුද්ගල සබඳතා ඇත්ද යන්න ගැන මහජනතාව තුළ කුකුසක් තිබූ බවයි.





පරීක්ෂණ කමිටුව මාතෘකා 24ක් යටතේ තම නිර්දේශ ඉදිරිපත් කළේය. මෙම කමිටු වාර්තාව ගැන වැඩි සමාජ අවධානයක් නොවූ හෙයින් කමිටු නිර්දේශ සියල්ලේම සංක්ෂිප්තයක් පහතින් සඳහන් කරමු.

1) ජාතික බුද්ධි සේවාවක් ස්ථාපිත කිරීම - කමිටුව නිරීක්ෂණය කර ඇත්තේ බුද්ධි තොරතුරු ලබාගැනීමේදී එකිනෙකා අභිබවා යෑමේ ප්‍රවණතාවක් මෙන්ම ඔවුන් සතු බුද්ධි තොරතුරු බෙදාගැනීමට දක්වන මැලිකමක් තිබූ බවයි. සහරාන් හෂීම් සහ ඔහුගේ ත්‍රස්තවාදී කණ්ඩායම පිළිබඳ රාජ්‍ය බුද්ධි සේවාව හා යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය සතුව තිබූ තොරතුරු එකිනෙකා අතර හුවමාරු කරගැනීමේ අඩුපාඩු කිහිපයක් දක්නට ලැබුණු බවත්, මෙය ඉතා භයානක තත්ත්වයක් බවත් කමිටුව සඳහන් කරයි. ඒ අනුව ජාතික ආරක්ෂාවට අදාළ බුද්ධි තොරතුරු එක්රැස් කිරීම හා බෙදාහැරීම සඳහා එක් ජාතික බුද්ධි සේවාවක් පමණක් ස්ථාපිත කර පවත්වාගෙන යෑමටත්, එය සම්පූර්ණයෙන්ම ස්වාධීන ආයතනයක් ලෙස පවත්වාගෙන යෑමටත් කමිටුව විසින් නිර්දේශ කර තිබේ. මෙම නිර්දේශය මෙතෙක් ක්‍රියාත්මක වී නැත.

2) ජාතික බුද්ධි සේවාව ව්‍යවස්ථාපිත පනතකින් පිහිටුවීම - දැනට ක්‍රියාත්මක වන බුද්ධි ආයතන කිසිවක් ව්‍යවස්ථාපිත නීතිමය රාමුවකින් ආවරණය නොවන හෙයින් පළමු නිර්දේශයේ යෝජනා කර ඇති බුද්ධි සේවාව පනතක් මගින් ව්‍යවස්ථාපිත කිරීමට කමිටුව නිර්දේශ කර තිබේ.
3) සන්නද්ධ හමුදා සහ පොලිස් බුද්ධි අංශ ප්‍රතිසංවිධානය කිරීම - ජාතික බුද්ධි අංශයක් පිහිටුවීමෙන් පසු ත්‍රිවිධ හමුදා සහ පොලිස් බුද්ධි අංශ ඔවුන්ගේ අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි ප්‍රතිසංවිධානය කළ යුතු බවට ද කමිටුව නිර්දේශ කර ඇතත්, එම නිර්දේශය ද මෙතෙක් ක්‍රියාත්මක කර නැත.
4) ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්, පොලිස්පති සහ ජාතික බුද්ධි ප්‍රධානී තනතුරු - මෙවැනි තනතුරුවලට නිලධාරීන් පත්කිරීමේදී එම විෂය පිළිබඳ පරිණතභාවයක්, ප්‍රවීණතාවයක් සහ කැපවීමක් සහිත නිලධාරීන් පමණක් පත්කිරීමට බලධාරීන් වගබලා ගත යුතු බවට මෙම කමිටුව නිර්දේශ කර තිබේ. මෙම කමිටු නිර්දේශය ලබාදුන් දිනයේ සිට මේ දක්වා ඉහත සඳහන් තනතුරු සඳහා පුද්ගලයන් පත්කිරීමේදී මෙම කරුණු සලකා බැලූ බවට පෙනෙන අවස්ථා ඉතා සුළු ප්‍රමාණයක් තිබේ. එහෙත් වැඩිම අවස්ථා ගණනකදී එම කරුණු සලකා බලා නැති බව අදාළ පත්වීම් ලද පුද්ගලයන්ගේ ක්‍රියාකාරිත්වය අනුව නිරීක්ෂණය වේ.
5) ශ්‍රී ලංකා පොලිසිය - මෙම කමිටු වාර්තාවේ සඳහන් පොලිසිය පාර්ශ්වයෙන් සිදුවී ඇති සියලු අඩුපාඩු මැනවින් අධ්‍යයනය කර ඒවා මගහැරීම සඳහා ක්‍රමවේද සකස් කිරීමට පොලිස් විෂය භාර අමාත්‍යවරයා විසින් කමිටුවක් පත්කිරීම සුදුසු බවට නිර්දේශ කර ඇතත්, එම නිර්දේශය ද ක්‍රියාත්මක වී නැත.
6) ඉස්ලාමීය අන්තවාදය තවදුරටත් ව්‍යාප්ත වීම වැළැක්වීම - ඒ වන විටත් අන්තවාදී ආගමික අදහස් දරන පුද්ගලයන්ගේ මනස සකස් කොට අවිහිංසාවාදී පුද්ගලයන් ලෙස නැවත සමාජගත කිරීමටත්, අලුතින් පුද්ගලයන් අන්තවාදය කරා යොමුවීම වැළැක්වීම සඳහාත් රජය වහාම මැදිහත් වී සක්‍රීය ක්‍රියාමාර්ග ගත යුතු බවට මෙම කමිටුව යෝජනා කර ඇත. එහෙත්, එවැනි සක්‍රීය වැඩපිළිවෙළක් සකස් කර ඇති බව හෝ ක්‍රියාත්මක කර ඇති බවක් හෝ පෙනෙන්නට නැත.
7) සමාජ මාධ්‍ය ජාලාවල ක්‍රියාකාරිත්වය - ආගමික අන්තවාදය තවදුරටත් ව්‍යාප්ත වීම වැළැක්වීමේ වැඩපිළිවෙළ තුළදී සමාජ මාධ්‍ය ජාලාවල මෙම ක්‍රියාකාරිත්වය පාලනය සඳහා ක්‍රියාමාර්ග ගත යුතු බවට සහ මෙවැනි සිදුවීමක් (පාස්කු ප්‍රහාරය වැනි) හටගත් අවස්ථාවකදී සමාජ මාධ්‍ය මෙන්ම විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය මගින් ද ජනතාවට ඉක්මනින් ම නිවැරදි මධ්‍යස්ථ තොරතුරු ඉදිරිපත් කළ යුතු බවට නිර්දේශ කර ඇත. එසේම මෙවැනි සිදුවීමක් හටගත් විගස ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ජනතාවට නිවැරදි තොරතුරු ලබාදීම උදෙසා පැය 24 මුළුල්ලේම ක්‍රියාත්මක වන විශේෂ මෙහෙයුම් මැදිරියක් ස්ථාපිත කළ යුතු බව ද, ත්‍රිවිධ හමුදා සහ පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරුන්ට ද එවැනි අවස්ථාවකදී විශාල කාර්යයක් පැවරෙන බැවින් වඩාත් නිවැරදි සහ නවතම තොරතුරු ජනතාවට නොපමාව ලබාදීම කළ යුතු බවට ද, රාජ්‍ය ආයතනවල මාධ්‍ය ප්‍රකාශවල පරස්පර තොරතුරු නොතිබිය යුතු බව ද මෙම කමිටුව යෝජනා කර තිබේ. 2019 වසරේදී කළ මෙම නිර්දේශය 2025 වසර වනතුරුත් ක්‍රියාත්මක නොවූ අතර ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව 2025 නොවැම්බර් සහ දෙසැම්බර් දිට්වා ආපදාව අවස්ථාවේ පැය 24ම සක්‍රීයව තොරතුරු බෙදාහැරීම සිදු කළේය. එහෙත් අනෙකුත් මාධ්‍ය ප්‍රකාශකවරුන් අතින් එය සාර්ථකව සිදු වූයේ නැත.

8) නීතිමය ප්‍රතිපාදන - ආගමික අන්තවාදය පැතිර යෑම වැළැක්වීමට නම් ඒ සඳහා ශක්තිමත් නීති පද්ධතියක් තිබිය යුතු බවට මෙම කමිටුව නිර්දේශ කර තිබේ. ආගමික අන්තවාදය වැළැක්වීම සඳහා අලුත් නීති ගෙනඒමක් සිදු වී නැත. සමාජය හා සාමයික කේන්ද්‍රයේ අදහස වන්නේ ආගමික අන්තවාදය වැළැක්වීමට දැනට තිබෙන නීති රාමුව ප්‍රමාණවත් බවයි. ප්‍රායෝගික සත්‍ය වන්නේ ආගමික අන්තවාදය තුළින් ප්‍රචණ්ඩත්වය කරා යන ගමන නතර කර ගත නොහැක්කේ නීති නොමැතිකම නිසා නොව, නීතිය නිසි ආකාරයට ක්‍රියාත්මක නොකිරීම නිසා බවයි.

9) 2019. 04. 21 දින ප්‍රහාරයට ලක්වූ වින්දිතයන්ගේ සුබසාධනය - මෙම ත්‍රස්තවාදී ප්‍රහාරය නිසා 259ක් මිය ගොස් 479ක් තුවාල ලබා ඇති හෙයින් මිය ගිය අයගේ පවුල්වල ඉතිරිව සිටින සාමාජිකයන්ගේ ඉදිරි දිවිපෙවෙත යහපත්ව ගතකිරීමට අවශ්‍ය පරිසරය හා පහසුකම් ඔවුන්ට ලබාදීම සඳහා ඉක්මන් වැඩපිළිවෙළක් දියත් කළ යුතු බවත්, තුවාලලැබූවන්ට බාධාවකින් තොරව ප්‍රතිකාර ලබාගැනීමට අවස්ථාව සැලසිය යුතු බවත්, පූර්ණකාලීන ආබාධිත තත්ත්වයට පත්වූවන් සඳහා ඉදිරි ජීවන මාර්ග සකසාදීමට වැඩපිළිවෙළක් සකස් විය යුතු බවටත්, ප්‍රහාරයෙන් මානසික කම්පනයට පත්ව සිටින පිරිසට (දරුවන් ද ඇතුළුව) මානසික තත්ත්වය නැවත ගොඩනැගීම සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත්, ප්‍රහාරයට ගොදුරු වූ පාසැල් දරුවන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු බාධාවකින් තොරව කරගෙන යෑමට හැකි පරිසරයක් නිර්මාණය කරදීමටත් මෙම කමිටුව නිර්දේශ කර තිබේ. මිය ගිය සහ තුවාලලැබූවන් වෙනුවෙන් යම් වන්දි මුදලක් ලබාදීම සිදු වුවද රාජ්‍ය පාර්ශ්වයෙන් ඔවුන්ගේ දීර්ඝකාලීන යහපැවැත්ම වෙනුවෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නැත.




10) ඉස්ලාම් දහම ඉගැන්වීමට ඇති පාසල් නියාමනය කිරීම - 1986 වසරට පෙර පැවැති පරිදි සියලුම මදුසා පාසල් නැවත අධ්‍යාපන අමාත්‍යංශය යටතට පවරා ගැනීමටත් සෙසු ආගමික පාසල් නියාමනය සඳහාත් විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතු බවට කමිටුව නිර්දේශ කර තිබේ. එවැනි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වූ බවක් නිරීක්ෂණය නොවේ.

11) මුස්ලිම් දේවස්ථාන අලුතින් ඉදිකිරීම පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් නොතිබීම - මේ සඳහා සුදුසු කාර්යපටිපාටියක් සකස් කරන ලෙස කමිටුව නිර්දේශ කර ඇතත්, එම නිර්දේශය ක්‍රියාත්මක වන බවක් නිරීක්ෂණය නොවේ.


12) සියලු ආගම් සඳහා ආගමික කටයුතු අමාත්‍යංශයක් පිහිටුවීම - එක් එක් ආගම් සඳහා වෙන-වෙනම අමාත්‍යංශ පිහිටුවීම වෙනුවට සියලු ආගම් සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට ආගමික කටයුතු අමාත්‍යංශය නමින් එක් අමාත්‍යංශයක් පිහිටුවා එහි ලේකම්වරයා යටතේ එක්-එක් ආගම් වෙනුවෙන් අධ්‍යක්ෂවරයකු බැගින් පත්කිරීම සුදුසු බවට කමිටුව නිර්දේශ කර තිබේ. එහෙත් වර්තමානයේ ද ඇත්තේ ආගමික කටයුතු අමාත්‍යංශය නමින් අමාත්‍යංශයක් නොව 'බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යංශය' නමින් වූ අමාත්‍යංශයකි.

13) ජාතීන් හා ආගම් අතර ස්ථිරසාර සහජීවනයක් ගොඩනැගීම - පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සමග බිඳී ගිය ජාතීන් අතර විශ්වාසය නැවත ගොඩනැංවීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක විය යුතු බවට මෙම කමිටුව නිර්දේශ කර තිබේ. එහෙත් ඉන්පසු ජනාධිපතිවරණ සමයේ

මෙන්ම කොවිඩ් සමයේ ද ජාතීන් අතර ඇති විරසකය උත්සන්න වන ආකාරයේ කටයුතු රැසක් සිදු විය. එය යම් තරමකට හෝ 2022 අරගල සමයේදී යටපත් වුවද, ඉන්පසු විවිධ ආකාරවලින් ජාතීන් අතර අසමගිය වර්ධනය කරන ආකාරයේ කටයුතු ක්‍රියාත්මක විය.

14) සාම්ප්‍රදායික මුස්ලිම් ජනතාවගේ ආරක්ෂාව - අන්තවාදයට යොමු වූ ඉතා සුළු පිරිසක් වූ මුස්ලිම් කණ්ඩායමෙන් අන්තවාදයට නැඹුරු නොවූ මුස්ලිම් ජනතාවට එරෙහිව විවිධ හිරිහැර අතීතයේදී සිදුවී ඇති හෙයින් සාම්ප්‍රදායික මුස්ලිම් ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට රජය වැඩපිළිවෙළක් දියත් කළ යුතු බවට කමිටුව යෝජනා කර ඇත. එවැනි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ බවක් නිරීක්ෂණය නොවූවද, පාස්කු ප්‍රහාරයෙන් පසු සාම්ප්‍රදායික මුස්ලිම් ජනාතාවට අන්තවාදී මුස්ලිම් කණ්ඩායම්වලින් යම් අකටයුත්තක් වූ බවක් නිරීක්ෂණ නොවේ.
15) පුපුරණ ද්‍රව්‍ය නිකුත් කිරීම විධිමත් කිරීම - පුපුරණ ද්‍රව්‍ය නිකුත් කිරීමේදී දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංවිධානය කොට වඩාත් කාර්යක්ෂම කාර්යපටිපාටියක් ඒ සඳහා අනුගමනය කළ යුතු බවට කමිටුව නිර්දේශ කර තිබේ. මෙම නිර්දේශය ක්‍රියාත්මක වී ඇත්දැයි යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය.
16) 2019. 04. 21 දින ප්‍රහාරයට යොදාගන්නා ලද බෝම්බ සෑදීමට උපයෝගී කරගත් අනෙකුත් ද්‍රව්‍ය නියාමනය - නයිට්‍රික්, යූරියා වැනි දෑ අලෙවි කිරීමේදී කිසියම් නියාමනයකට යටත්ව ඒවා සිදුකිරීමට යම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු බවට කමිටුව නිර්දේශ කර තිබේ. මෙම යෝජනාව ඉටුවූයේද, නැද්ද යන්න ගැන නොදනී.
17) කුඩා පරිමාණයේ රහසිගත රසායනාගාර - මෙවැනි රසායනාගාර ගැන ආරක්ෂක අංශ සහ ජනතාව දැනුවත් කිරීමට නිර්දේශ කර තිබේ. එම නිර්දේශය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වූයේ නැත.
18) වීසා සහ පුරවැසිභාවය ලබාදීමේ ක්‍රමවේදය - වීසා ක්‍රමවේදය විධිමත් කිරීම සහ ආගමන විගමන දෙපාර්තමේන්තුවත්, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවත්, ශ්‍රී ලංකා පොලිසියත් සතු දත්ත එකම පරිගණක ජාලයකට ගොනුගත කිරීම හා ඒ-ඒ ආයතන අතර තොරතුරු බෙදාගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට ද කමිටුව යෝජනා කර ඇත.
19) ප්‍රජා කමිටු ප්‍රතිසංවිධානය කිරීම - ශ්‍රී ලංකා පොලිසිය විසින් පොලිස් ස්ථාන මට්ටමින් පිහිටුවා ඇති ප්‍රජා කමිටු ප්‍රතිසංවිධානය කළ යුතු බවට කමිටුව නිර්දේශ කර තිබේ. එහෙත් ඇතැම් ප්‍රජා කමිටු තවමත් අක්‍රීය මට්ටමේ පවතී.
20) ආරක්ෂක අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම - සතිපතා පවත්වනු ලබන බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම විධිමත් ක්‍රමවේදයකට අනුව පැවැත්වීමට සහ එය නීතිමය ප්‍රතිපාදන යටතේ පවත්වාගෙන යනු ලබන ක්‍රමයක් සකස් කිරීමට කමිටුව නිර්දේශ කර තිබේ. එවැනි නීතිමය ප්‍රතිපාදනයක් මේ වන තෙක් සකස් කර නැත.
21) ආරක්ෂක මණ්ඩලය - ආරක්ෂක මණ්ඩලය නීතිමය ප්‍රතිපාදන යටතේ පවත්වාගෙන යනු ලබන ව්‍යවස්ථාපිත ආයතනයක් බවට අනිවාර්යයෙන්ම පත් කළ යුතු බවට කමිටුව නිර්දේශ කර තිබේ. මෙම නිර්දේශය ද ක්‍රියාත්මක වී නැත.
22) ජාතික ආරක්ෂාව - කුමන තත්ත්වයක් යටතේ වුවද ජාතික ආරක්ෂාව සුළු කොට නොතකා, ඊට ප්‍රමුඛත්වයක් ලබාදී කටයුතු කිරීමට ද කමිටුව නිර්දේශ කර තිබේ.
23) ත්‍රස්තවාදය සම්බන්ධ සංවිධාන සඳහා අනුබල දීම පිළිබඳව ඇතැම් මුස්ලිම් දේශපාලනඥයන්ට එරෙහිව ඉදිරිපත් වී ඇති චෝදනා සම්බන්ධයෙන් වන නිර්දේශ - මේ සම්බන්ධයෙන් එල්ල වන චෝදනාවල සත්‍ය-අසත්‍යතාවය පිළිබඳ නොපමාව පූර්ණ විමර්ශනයක් සිදු කළ යුතු බවට කමිටුව නිර්දේශ කර තිබේ. ඒ අනුව 2019 නොවැම්බර් මාසයෙන් පසු ගෝඨාභය රාජපක්ෂ මහතාගේ රජය යටතේ මුස්ලිම් දේශපාලනඥයන් පිරිසකට එරෙහිව විමර්ශනයක් පැවැත්වූ අතර, එහිදී අදාළ චෝදනා ඔප්පු නොවීය.

24) පූර්ණ බලැති ජනාධිපති කොමිෂන් සභාවක අවශ්‍යතාව - මෙම ප්‍රහාරය හුදෙක් මොහොමඩ් සහරාන් හෂීම් ඇතුළු තවුහිද් ජමාත් සංවිධානය සහ ඔවුන්ගේ හිතවාදීන් විසින් පමණක් සිදු කළ ක්‍රියාවක් ද, එසේ නැත්නම් මෙම ප්‍රහාරය පිටුපස වෙනත් අදෘශ්‍යමාන බලවේගයක් තිබුණේද යන්න කඩිනමින් අනාවරණය කරගැනීමට අවශ්‍යව ඇති බව සඳහන් කරන කමිටුව, සියලු ජාතීන් නියෝජනය වන පරිදි පූර්ණ බලැති ජනාධිපති කොමිෂන් සභාවක් පත්කිරීම සුදුසු බවට නිර්දේශ කර තිබේ. මෙම නිර්දේශය අනුව සියලු ජාතීන් නියෝජනය වන පරිදි නැතත් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් ජනාධිපති කොමිෂන් සභාවක් පත්කළේය. එය පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ ස්ථාපනය කරන ලද කොමිසමක් වන අතර, විශේෂ ජනාධිපති කොමිෂන් සභා පනත යටතේ ස්ථාපිත කළ කොමිසමක් නොවේ.



The Accountability Ledger: Years of Systemic Inaction

| Recommendation | Implementation Status |
|---|---|
| Establish a Unified National Intelligence Service | IGNORED ✗ |
| Provide Statutory Backing for Intelligence Agencies | IGNORED ✗ |
| Regulate Madrasas under the Ministry of Education | IGNORED ✗ |
| Appoint another Presidential Commission to investigate further | IMPLEMENTED ✓ |

The only major recommendation the state actively implemented was the bureaucratic step to investigate further. The structural reforms required to prevent another tragedy were entirely abandoned.

NotebookLM

කමිටු අවසන් නිර්දේශවලට ඇතුළත්ව නැතත් ඇතැම් නිලධාරීන්ගේ වගවීම ගැන බරපතළ සැක මතුකරන කාරණා මෙම කමිටුවේදී හෙළිදරව් වී ඇති බව එහි සාමාජිකයන් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව හමුවේ ලබා දුන් සාක්ෂි අනුව පෙනී යයි.

මෙම කමිටුවේ සභාපති විජිත් කේ මළල්ගොඩ මහතා තේරීම් කාරක සභාව හමුවේ එක් අවස්ථාවක[10] මෙසේ ප්‍රකාශ කළේය.

“බුද්ධි තොරතුරු ලැබීම සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ කටඋත්තරය, annexure එකක් විදිහට අපේ වාර්තාවට අපට ඇතුළත් කිරීමට සිද්ධ වුණා. එතුමා කිසිම දෙයක් දන්නෙ නැහැ කිව්වා. එතුමා කිව්වා එම ප්‍රදේශය ඉතා සාමකාමීයි කියලා. කිසිම දෙයක් සිදු වෙලා නැහැ කියලා. එවැනි උසස් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියකුගෙන් එවැනි ප්‍රකාශයක් අහන්න ලැබීමත් විමතියට කාරණාවක්. ඒ නිසා අපි එතුමාගේ කටඋත්තරය වාර්තාවට

[10]පිටුව 1306, සාක්ෂ්‍ය සටහන් 2 වන වෙළුම, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.

උපලේඛනයක් හැටියට ඇතුළත් කරලා කිව්වා, මෙන්න මේ වගේ නිලධාරීන් තමයි ඉඳලා තියෙන්නෙ කියලා.”

එසේම ත්‍රස්තවාදී ක්‍රියා විමර්ශන කොට්ඨාසයේ (TID) ක්‍රියාකාරිත්වය ගැන ද විනිසුරු මළල්ගොඩ මහතා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව හමුවේ සාක්ෂි ලබා දුන් අතර, ඔහු මෙසේ ප්‍රකාශ කළේය.

“විශේෂයෙන්ම TID කියන්නෙ DIG යටතේ එන Specialized unit එකක්. ඒගොල්ලන්ට report එකක් යවලා අත සෝදාගන්න බැහැ. දැන් අපේ වැඩේ කරලා ඉවරයි කියලා, ඒගොල්ලන්ට අත සෝදාගන්න බැහැ. TID එකේ අධ්‍යක්ෂ අපි ඉස්සරහටත් ඇවිල්ලා සාක්ෂි දුන්නා. නමුත් ඔහු කිව්වා, අපි වාර්තාවක් එවලා ඉවරයි, නීතිපති හමු වුණේ නැති නිසා අපි ගිහිල්ලා තව report එකක් file කළා කියලා. නැහැ, ඒගොල්ලෝ යවපු වාර්තාවේ තිබුණේ, උපදෙස් ඉල්ලලා. මගේ පළපුරුද්ද අනුව නීතිපතිවරයා ඒ උපදෙස් ලබාදීම අපි දකින්නේ, හරිම භයානක විදියට. මොකද, ඒකෙ වෙන මොකක් හෝ ලියලා එවලා තිබුණා නම්? සම්පූර්ණ උධෘතය අපේ අතට නොලැබී එහෙම දෙයක් කළොත්, අන්තිමට චෝදනාව එන්නේ කාටද? නීතිපති දෙපාර්තමේන්තුවට. ඒක එවපු පොලිස් දෙපාර්තමේන්තුව අත සෝදාගෙන යයි. ඒ නිසා අපි දකින්නේ, සම්පූර්ණ ගොනුව නොමැතිව නීතිපති දෙපාර්තමේන්තුවට කිසිම දෙයක් සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කරන්න බැහැ කියන එකයි.”

ත්‍රස්තවාදී ක්‍රියා විමර්ශන කොට්ඨාසය (TID) සහරාන් හෂීම් සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවට යවා ඇත්තේ සම්පූර්ණ ගොනුව නොව පිටු 10ක - 15ක වාර්තාවක් බව විනිසුරු මළල්ගොඩ කමිටුවේදී හෙළිදරව් වී තිබේ.[11]

මළල්ගොඩ කමිටුවට අදාළ තවත් විශේෂ කරුණක් වූයේ 60කට ආසන්න සාක්ෂිකරුවන් අතරින් අත්සන් නොකළ එකම කටඋත්තරය එවකට ආරක්ෂක අමාත්‍යංශ ලේකම්වරයාගේ කටඋත්තරය බවයි. ඔහු පැමිණ ප්‍රකාශ ලබාදීමෙන් පසු එය කියවා අත්සන් කිරීම සඳහා පසු දින පැමිණෙන ලෙස කමිටුව දැනුම් දී ඇති අතර, පසුදින පැමිණීමෙන් පසු පෙරදින ලබා දුන් කටඋත්තරය සම්පූර්ණයෙන්ම පාහේ වෙනස් කර තිබේ. කමිටුව දැනුම් දී ඇත්තේ ඔහුගේ ප්‍රකාශය පටිගත කර ඇති බැවින් එහි යම් වෙනස්කමක් අවශ්‍ය නම් එය දිවුරුම් ප්‍රකාශයක් මගින් ලබා දෙන ලෙසයි. එවැනි දිවුරුම් ප්‍රකාශයක් ඔහු ලබා දී නැත. මේ ගැන කමිටුවේ අදහස වූයේ ඔහු පසුව කිසිවකුගෙන් ලබා ගත් උපදෙස් මත මුල් ස්ථාවරය මුළුමනින්ම වාගේ වෙනස් කර ඇති බවයි.[12]

විනිසුරු විජිත් මළල්ගොඩ කමිටුවේදී තවත් වැදගත් කරුණක් ඔවුන් නිරීක්ෂණය කර තිබිණි. 2019 අප්‍රේල් 09 වැනිදා පැවැති බුද්ධි සමාලෝචන රැස්වීමේදී නිලන්ත ජයවර්ධන මහතා විසින් ඔහුට ලැබුණු බුද්ධි තොරතුර ගැන සාකච්ඡා නොකිරීම ගැන පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේදී මළල්ගොඩ කමිටුවේ අදහස් විමසා සිටියදී එම කමිටුවේ සාමාජික විශ්‍රාමික පොලිස්පති එන් කේ ඉලංගකෝන් මහතා මෙසේ[13] කියා තිබිණි.

“නිලන්ත 09 වැනිදා කතා නොකරපු එකේ මෙහෙම කාරණාවකුත් අපට පෙනුණා. සහරාන් සම්බන්ධයෙන් DMI එකේ ස්ථාවරයක් තිබුණා, සහරාන් ඉන්දියාවට ගියා කියලා. මේගොල්ලො

[11]පිටුව 1316, සාක්ෂ්‍ය සටහන් 2 වන වෙළුම, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.
[12]පිටුව 1325, සාක්ෂ්‍ය සටහන් 2 වන වෙළුම, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.
[13]පිටුව 1329, සාක්ෂ්‍ය සටහන් 2 වන වෙළුම, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.

ඒක deny කළා. සහරාන්නෙ පහරදීම කරනවා කියලා කියන්නෙ. මේ සහරාන් ගැනත් පොඩි පොඩි මත තිබුණා."

සහරාන් හෂීම් ලංකාවේ සිටියදී යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය (DMI) සහරාන් ලංකාවේ නොමැති බවට ස්ථාවරයක් ගැනීම ඉතාම බරපතළ තත්ත්වයක් වන අතර, පාස්කු ත්‍රස්ත ප්‍රහාරය ගැන සොයා බැලූ පළමු කමිටුව වූ මෙම කමිටුවට රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා ඉතා තීරණාත්මක සාක්ෂියක් ලබා දී ඇති බව කමිටුවේ සාමාජිකයන් තේරීම් කාරක සභාවේදී කළ කරුණු දැක්වීම්වලින් පෙනී යයි.

**මෙම කමිටුව ගැන සමාජය හා සාමයික කේන්ද්‍රයේ ස්ථාවරය**

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය ගැන මූලිකව කරුණු සොයා බැලූ මෙම කමිටුවට මුල් අවස්ථාවේදී අදාළ පාර්ශ්ව විසින් ලබා දෙන ලද සාක්ෂි මෙම කමිටුවේ සභාපතිවරයා සඳහන් කළ පරිදිම වෙනස් කිරීමකට ලක් නොකළ ඒවා විය හැකිය. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ද පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේදී ප්‍රකාශ කළේ[14] මෙම කමිටුවට ලබා දුන් සාක්ෂි, පසුව චෝදනාවලින් ගැලවීම සඳහා ඇතැම් නිලධාරීන් වෙනස් කළ බවයි. ඒ අනුව මෙම කමිටුවට ලබා දුන් සාක්ෂි අතිශයින්ම වැදගත් බව සමාජය හා සාමයික කේන්ද්‍රයේ අදහසයි. ජාතික තවුහිද් ජමාත් නායක ලෙස සැලකෙන සහරාන් හෂීම් ලංකාවේ සිටියදීත් ඔහු රටින් පිටවී ඇති බවට යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය මතයක් දරා තිබීම ගැන විනිසුරු මළල්ගොඩ කමිටුවේ නිරීක්ෂණ ඉතාම වැදගත් සහ සුවිශේෂී වන අතර, ඒ අනුව රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන වැනි පුද්ගලයන් මෙම කමිටුවට ලබා දුන් සාක්ෂි වර්තමාන අපරාධ විමර්ශනය සඳහා අධ්‍යයනය කිරීමට විමර්ශකයන් වෙත ලබාදීමේ සුවිශේෂී වැදගත්කමක් සමාජය සහ සාමයික කේන්ද්‍රය නිරීක්ෂණය කරයි.

ඒ අනුව මෙම කමිටුව හමුවේ ලබා දුන් සියලු කටඋත්තරත්, ඒවායේ හඬපටත්, කමිටුවට ඉදිරිපත් වූ ලේඛනත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට බාරදීම සඳහා ජනාධිපතිවරයා විසින් යළිත් ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් කැඳවිය යුතු බව සමාජය හා සාමයික කේන්ද්‍රයේ ස්ථාවරයයි. එසේම අවසන් වාර්තාව, විධායක සාරංශය සහ ප්‍රකාශ සහිත වෙළුම මහජනතාවට ප්‍රසිද්ධ කිරීම ද සත්‍ය දැනගැනීම සඳහා අතිශයින්ම වැදගත් වේ.

---

[14], සාක්ෂ්‍ය සටහන් 2 වන වෙළුම, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.

## 03 වැනි පරිච්ඡේදය

## හමුදා බුද්ධි අංශ ක්‍රියාකාරිත්වය ගැන මෛත්‍රීපාලත් ප්‍රශ්න කරයි - පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ කතාව




පාස්කු ඉරිදා එල්ල කෙරුණු ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් විජිත් මළල්ගොඩ විනිසුරුවරයාගේ ප්‍රධානත්වයෙන් පත්කෙරුණු කමිටුවෙන් පසු ඒ ගැන සොයාබැලීම කළේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් මගිනි. '2019 අප්‍රේල් 21 වැනි දින ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර පිළිබඳ සොයාබලා පාර්ලිමෙන්තුවට වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි' යෝජනාවක් 2019 මැයි 09 දින මන්ත්‍රීවරුන් 40කගේ අත්සනින් කතානායකවරයාට ඉදිරිපත් කරන ලද අතර, 2019 මැයි 22 දින එම යෝජනාව සංශෝධන සහිතව පාර්ලිමේන්තුවේදී සම්මත විය.[15]

මෙම යෝජනාව සඳහා අත්සන් කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර එවකට ආණ්ඩු පක්ෂය නියෝජනය කළ මන්ත්‍රීවරුන්ට අමතරව විපක්ෂය නියෝජනය කළ නලින්ද ජයතිස්ස සහ සුනිල් හඳුන්නෙත්ති වැනි ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ද, උදය ප්‍රභාත් ගම්මන්පිල, වාසුදේව නානායක්කාර වැනි එක්සත් ජනතා නිදහස් සන්ධාන මන්ත්‍රීවරු ද, ධර්මලිංගම් සිද්ධාර්ථන් වැනි දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරු ද වූහ.[16]

එම යෝජනා සම්මතයෙන් පසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හත්දෙනකුගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කරන බව කතානායකවරයා 2019 මැයි 23 දින නිවේදනය කළේය.[17] එම මන්ත්‍රීවරුන් හත්දෙනා මෙසේ ය.

1) නියෝජ්‍ය කතානායක ජේ එම් ආනන්ද කුමාරසිරි (සභාපති)
2) රවුෆ් හකීම්

---

[15]පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ වාර්තාව, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.

[16]1 වන පරිශිෂ්ටය, පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ වාර්තාව, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.

[17]2019 මැයි 23 වැනිදා, පාර්ලිමේන්තු විවාද (හැන්සාඩ්) නල වාර්තාව.

3) රවී කරුණානායක
4) ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා
5) කවින්ද හේෂාන් ජයවර්ධන
6) ආශු මාරසිංහ
7) ආචාර්ය ජයම්පති වික්‍රමරත්න
8) එම් ඒ සුමන්තිරන්

කාරක සභාවට පත්කරන ලද කවින්ද හේෂාන් ජයවර්ධන මහතා එම කාරක සභාවෙන් ඉල්ලා අස්වූ අතර, එම පුරප්පාඩුව සඳහා කතානායකවරයා විසින් රාජිත සේනාරත්න මහතා පත්කරන ලදි. එසේම නලින්ද ජයතිස්ස මහතා ද එම විශේෂ කාරක සභාවේ සාමාජිකයකු ලෙස කතානායකවරයා විසින් නම් කරන ලදි.[18]

මෙම කාරක සභාවේ විශේෂත්වයක් වූයේ එහි සාක්ෂි විමසීම්, සීමිත අවස්ථාවලදී හැර අනෙකුත් සෑම අවස්ථාවකදීම ජනමාධ්‍ය වෙත විවෘත කිරීමයි. කාරක සභාවේ මහ ලේකම් ලෙස පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් ටිකිරි කේ ජයතිලක මහතා පත්කරනු ලැබිණි.

මෙම කාරක සභාව 2019 මැයි මස 23 වැනිදා සිට 2019 සැප්තැම්බර් 20 දක්වා අවස්ථා 19කදී රැස් විය.[19]

කාරක සභාව ක්‍රියාත්මක වන කාලයේදී ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ව සිටි ජනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ සහ ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහතාගෙන් කාරක සභාව මුල්වරට සාක්ෂි ලබා ගත් අතර, එතැන් සිට 50කට ආසන්න පිරිසකගෙන් ප්‍රකාශ සටහන් කර ගත්තේය. අවසන් වශයෙන් ප්‍රකාශ සටහන් කර ගනු ලැබුවේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගෙනි.[20] එම වාර්තාව 2019 ඔක්තෝබර් 23 වැනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි.[21v]

### අනාවරණය කරගත් වැදගත් කරුණු

පාර්ලිමේන්තු විශේෂ කාරක සභා වාර්තාවේ සඳහන් එක් විශේෂ කරුණක් වන්නේ 2018 වසරේ ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකාවේ ඇතිවූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුදය ශ්‍රී ලංකාවේ පාලනය සහ ආරක්ෂක තත්ත්වය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කළ බවයි. තේරීම් කාරක සභාව වෙත ලැබුණු සාක්ෂි කොටස් 08ක්[22] යටතේ වර්ගීකරණය කර තිබේ.

1) ආරක්ෂක හා බුද්ධි රාමුව සහ ගැටළු
2) කාත්තන්කුඩි වැනි ප්‍රදේශවල ආගමික අන්තවාදයේ නැගීසිටීමක් සිදු වුවද, එය අධීක්ෂණය කිරීමට සහ පාලනය කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබීම
3) ආගමික අන්තවාදය නැගීසිටීම සහ එය පාලනය කිරීමට රජය පැත්තෙන් ක්‍රියා නොකිරීම ඉස්ලාම් අන්තවාදය වර්ධනය වීම, පෝෂණය වීමට ඉවහල්වීම
4) විවිධ පුද්ගලයන් විසින් ඉදිරිපත් කරන ලද පූර්ව අනතුරු ඇඟවීම් සහ පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා නොකිරීම

---

[18]2019 මැයි 24 වැනිදා, පාර්ලිමේන්තු විවාද (හැන්සාඩ්) නල වාර්තාව.

[1919]පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ වාර්තාව, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.

[20]පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ වාර්තාව, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.

[21]2019 ඔක්තෝබර් 23 වැනිදා, බීබීසී සිංහල.

[22]පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ වාර්තාව, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.

5) පොලිසිය, නීතිපති දෙපාර්තමේන්තුව වැනි නීතිය සහ සාමය සම්බන්ධ ආයතන අතර විශ්වාසය සහ සම්බන්ධීකරණය අඩුවීම සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් අන්තර් ආයතන සහ අන්තර් ආයතන සන්නිවේදන පරතර ඇතිවීම
6) කාත්තන්කුඩි ප්‍රදේශය තුළ වහාබ්වාදය සහ අරාබිකරණය පැතිරීම
7) පාස්කු දින ප්‍රහාරයට දේශපාලනඥයන්ගේ සම්බන්ධයක් ඇතැයි යන චෝදනාව
8) උපවදාතාවය (දඬුවම් ලැබිය යුතු බව) (Culpability)

පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව සඳහන් කරන්නේ ජාතික තවුහිද් ජමාත් සංවිධානය, සහරාන් සහ ඔහුගේ සහචරයන් විසින් එල්ල කළ හැකි තර්ජන පිළිබඳ පාස්කු ඉරිදා ප්‍රහාරයට පෙර බුද්ධි අංශ දැනුවත්ව සිටියේ යැයි සාක්ෂිවලින් පෙනී යන බවයි. එක් බුද්ධි අංශයක් පමණක් නොව බුද්ධි අංශ කිහිපයක්ම එය දැන සිටි බව එම වාර්තාවේ සඳහන් වේ. රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ ව සිටි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා මෙම තේරීම් කාරක සභාව හමුවේ ලබා දුන් සාක්ෂි අනුව රැඩිකල්කරණයට ලක්වූ පුද්ගලයන් 94 දෙනකුගේ ලැයිස්තුවක් රාජ්‍ය බුද්ධි සේවය 2017 ඔක්තෝබර් 31 වැනිදා ඉදිරිපත් කර ඇති අතර, නම් 129ක් සහිත තවත් ලැයිස්තුවක් 2019 වසරේ පෙබරවාරි මාසයේදී ඉදිරිපත් කෙරිණි. ට්‍රොපිකල් ඉන් ලැගුම්හලේදී මිය ගිය ජමීල් නම් පුද්ගලයා එම ලැයිස්තුවේ ඉහළින්ම සිට ඇති අතර, 2017 වසරේ ලබා දුන් පුද්ගලයන් 94 දෙනාගේ ලැයිස්තුවෙන් පුද්ගලයන් 6-7 දෙනකු පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මරණයට පත්වී තිබේ.[23]

සහරාන් හෂීම් සහ ඔහුගේ අනුගාමිකයන් විසින් නුදුරේදී ම මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් එල්ල කරන බවට 2019 අප්‍රේල් 04 වැනිදා වට්ස්ඇප් හරහා බුද්ධි තොරතුරක් ලැබුණු බවත්, ඒ හා සමාන බුද්ධි තොරතුරක් 2019 අප්‍රේල් 05 වැනිදා ලිඛිතව ලැබුණු බවත්, එකිනෙකට වෙනස් මූලාශ්‍ර දෙකකින් ම එකම බුද්ධි තොරතුර ලැබුණු බවත් නිලන්ත ජයවර්ධන මහතා විශේෂ කාරක සභාව හමුවේ ලබා දුන් සාක්ෂිවලින් කියැවිණි. මෙම බුද්ධි තොරතුරු ගැන යුද හමුදාව ප්‍රහාරය සිදුවන තුරු නොදැන සිටි බවට යුද හමුදාපතිවරයා කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. කෙසේ වෙතත් රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයා කාරක සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ අදාළ බුද්ධි තොරතුරු අප්‍රේල් 19 වැනි දින යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කළ බවයි. එසේ නම් රාජ්‍ය බුද්ධි සේවාව විසින් යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කළ අනතුරු ඇඟවීම ගැන ඔවුන් විසින් යුද හමුදාපතිවරයාට දැනුම් නොදීම සැකයට තුඩුදෙන්නකි. ඒ ගැන තේරීම් කාරක සභාව මෙසේ සඳහන් කර ඇත.

"එවැනි බුද්ධි තොරතුරක් පිළිබඳව හමුදාපතිවරයා දැනුවත් නොකිරීම සඳහා හමුදා බුද්ධි අධ්‍යක්ෂට හේතුවූ කරුණු කාරක සභාව ප්‍රශ්න කරයි. හමුදාව හෝ ඉන් බාහිර වෙනයම් අයකු යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ දැනුවත් කළේ දැයි නිසැකවම දැනගැනීම පිණිස මෙය තවදුරටත් විමසා බැලිය යුතුය. තවදුරටත් විමර්ශන අවශ්‍ය වන මේවා අතිශයින්ම බරපතළ කරුණු වේ. මෙය සිදුවූයේ ද 2019 වසරේදී ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා යුද හමුදාවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ අනතුරුව යුද හමුදාපති ලෙස පත්කිරීම සහ මේජර් ප්‍රභාත් බුලත්වත්ත මහතා හමුදා බුද්ධි අංශයේ යළි සේවයේ පිහිටුවීම යන යුද හමුදාවේ සිදුවූ වෙනස්කම් පසුබිම්මෙහි ය."

යුද හමුදා බුද්ධි අංශයේ ක්‍රියාකාරිත්වය ගැන විශේෂ කාරක සභාවේදී එවකට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ද විමතිය පළ කළේය. සිරිසේන මහතා මෙසේ ප්‍රකාශ කළේය.[24]

---

[23]පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ වාර්තාව, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.
[24]පිටුව 1355, සාක්ෂ්‍යා සටහන් 2 වන වෙළුම, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.

“...අපි කනගාටුවෙන් කියන්නට ඕනෑ, ලංකාවේ හමුදා බුද්ධි අංශයේ 7000ක් ඉන්නවා. රෙජිමේන්තු 7ක් තිබෙනවා. නමුත්, මේ සිද්ධිය ගැන අකුරක්වත් වාර්තා වෙලා නැහැ. එතකොට ඒගොල්ලො කළේ මොකක්ද කියන එකත් ප්‍රශ්නයක්. 7000ක් ඉන්නවා, රෙජිමේන්තු 7ක්. නමුත් මේ සිදුවීම පිළිබඳව කිසිම දෙයක් නැහැ. මම දැක්කා, හිටපු හමුදාපතිවරයා මේ තේරීම් කාරක සභාවට ගිහින් කියනවා, බුද්ධි අංශය එයාට වාර්තා නොකරපු එක ප්‍රශ්නයක් කියලා. බුද්ධි අංශ එයාටනෙ තියෙන්නෙ. රටේ ලොකුම බුද්ධි අංශය 7000ක් හමුදාපතිගෙනෙ. එතකොට ඒ 7000 මොකක්ද කළේ? අපි, අපි නිසයි මම මේක කතා කරන්නෙ. මේක එළියෙ කතා කරන්න හොඳ දෙයක් නෙමෙයි. එහෙම කතා කරන්න හොඳ නැහැ. නමුත්, ඒ කිසිම දෙයක් හමුදා බුද්ධි අංශයෙන් ආවෙ නෑ.”





පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාව යුද හමුදා බුද්ධි අංශය ගැන තම වාර්තාව මගින් විමතිය පළ කළේය. තේරීම් කාරක සභා වාර්තාවේ මෙසේ සඳහන් කර තිබේ.[25]

“ඉතා ශක්තිමත් වූ එමෙන්ම තොරතුරු ලබාදෙන්නන්ගෙන් ද සමන්විත වූ හමුදා බුද්ධි අංශයට මෙම බුද්ධි තොරතුරු එකතු කර ගැනීමට නොහැකිවීම පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව මවිතයට පත්වේ.”

තේරීම් කාරක සභාව මෙය සඳහන් කරන්නේ ඉතා බරපතළ සහ වැඩිදුර අවධානය යොමුවිය යුතු කරුණක් ලෙස ය.

[25] පිටුව 84, පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ වාර්තාව, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183.





පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සිදුවීමට ආයතනවල අතපසුවීම් පමණක් හේතු නොවූ බව විශේෂ කාරක සභාව නිරීක්ෂණය කළේය.

“2019 අප්‍රේල් 21 දින සිදුවූ ඛේදජනක සිද්ධිය සිදුවීමට, වසර ගණනක් තිස්සේ බුද්ධි අංශ සහ සැඟවුණු අභිලාෂයන් සහිත පාර්ශ්වයන් විසින් ගන්නා ලද පියවරයන් හේතුවී ඇති බව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් ඒ හමුවට ඉදිරිපත් කරන ලද සාක්ෂි විමර්ශනය කිරීමෙන් අනතුරුව නිගමනය කරන ලදි.” මෙසේ වාර්තාවේ සඳහන් කිරීමෙන් පෙන්නුම් කරන්නේ පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය පිටුපස සහරාන් හෂීම්ලාට එහා ගිය තවත් පිරිසක් සිටි බවයි.

සහරාන්, රිල්වාන් සහ අනෙකුත් පුද්ගලයන්ට එරෙහිව අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් තිබියදී සහ ඉහළ යමින් පවතින අන්තවාදී මට්ටම් පිළිබඳ විමර්ශන සිදුවෙමින් පවතිද්දී එම පුද්ගලයන් පොලීසිය මගහැර සිටියේ කෙසේදැයි විශේෂ කාරක සභාව තම වාර්තාවෙන් ප්‍රශ්න කළේය.

2019 ආප්‍රේල් 09 දිනැති ලිපියෙන් සහරාන්, රිල්වාන්, මිල්හාන් සහ ආමි මොහිදීන් ඇතුළු පිරිසක් ප්‍රහාරයක් දියත් කරන බවට රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂ ලබා දී ඇති වාර්තාවේ සඳහන් ආමි මොහිදීන් යුද හමුදාවේ සිටි අයකු බවත්, ආමි මොහිදීන් යුද හමුදා බුද්ධි අංශ ඔත්තුකරුවකු බවත්, නැගෙනහිර ප්‍රදේශයේ ශක්තිමත් ජාලයක් තිබූ යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ කාර්යාලය ප්‍රදේශයේ ඇතිවීමට ඉඩ තිබූ කලබලකාරී තත්ත්වය සහ සහරාන් සහ ආමි මොහිදීන් ඇතුළු ඔහුගේ සගයන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ අදාළ පාර්ශ්වයන්ට දැනුම්දීමට අපොහොසත් වූයේ හෝ එසේ නොකිරීමට කටයුතු කළේ මන්දැයි ප්‍රශ්න කළ යුතුව ඇති බවත් විශේෂ කාරක සභාව තම අවසන් වාර්තාවේ සඳහන් කර තිබේ.





පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාර සිදුවීම සහ ඊට ඉඩහැරීම සිරිසේන - වික්‍රමසිංහ රජයේ පාලනයක් නොමැතිකම ප්‍රදර්ශනය කර, පාලනයේ වෙනසක් ඉල්ලා සිටීම වර්ධනය කිරීමක්ද යන්න තේරීම් කාරක සභාව ප්‍රශ්න කර ඇත. මේ ගැන තවදුරටත් විමර්ශනය කළ යුතු බව තේරීම් කාරක සභාව අවධාරණය කරයි.

පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාව ප්‍රධාන මාතෘකා කිහිපයක් ඔස්සේ තම නිර්දේශ ඉදිරිපත් කර ඇත. ඒවා සාරාංශ ලෙස ගතහොත් මෙසේ ය.

1) ආරක්ෂක හා බුද්ධි අංශ ප්‍රතිසංස්කරණ - මේ යටතේ ජාතික ආරක්ෂාව සඳහා නීතිමය හා ව්‍යූහගත පද්ධතියක් පිහිටුවීම, ජාතික ආරක්ෂක කවුන්සිලය සඳහා නීතිමය පදනමක් ඇති කිරීම, ආරක්ෂක මණ්ඩල රැස්වීම් විධිමත් කිරීම, බුද්ධි අංශ අතර සම්බන්ධතා ශක්තිමත් කිරීම, බුද්ධි අංශවල වගකීම නිර්වචනය කිරීම වැනි නිර්දේශ ඉදිරිපත් කර තිබේ. මෙම නිර්දේශ මෙතෙක් ක්‍රියාත්මක වී නැති බව නිරීක්ෂණය වේ.
2) මූල්‍ය නිරීක්ෂණය ශක්තිමත් කිරීම - මූල්‍ය බුද්ධි ඒකකය ශක්තිමත් කිරීම, විශාල මුදල් ගනුදෙනු ඇඩි ලෙස නිරීක්ෂණය කිරීම, සැකසහිත ගනුදෙනු වාර්තා කිරීම වැනි නිර්දේශ කිහිපයක් කාරක සභාව මගින් නිර්දේශ කර තිබේ. මෙම මාතෘකාවට අදාළ ඇතැම් නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක වෙමින් තිබේ.
3) ආගමික අන්තවාදය පාලනය කිරීම - ආගමික අන්තවාදය පාලනය කිරීම ගැන ද නිර්දේශ ඉදිරිපත් කර තිබේ. මෙම නිර්දේශය නිසි ආකාරයට ක්‍රියාත්මක වන බවක් පෙනෙන්නට නැත.
4) නීතිපති දෙපාර්තමේන්තුව ප්‍රතිසංස්කරණය කිරීම - මේ සම්බන්ධයෙන් ද පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව ඇතැම් නිර්දේශ ලබා දී ඇතත්, මේ වන තෙක් එම ඇතැම් නිර්දේශ ක්‍රියාත්මක වී නැත.
5) මාධ්‍ය, ව්‍යාජ ප්‍රවෘත්ති සහ තොරතුරු පාලනය - මීට අදාළ නිර්දේශ කිහිපයක් ද ලබාදී තිබේ.

6) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ - මෙම නිර්දේශ අතරින් වැදගත්ම නිර්දේශයක් වන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ සිදුකිරීම ය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ යම් ප්‍රතිසංස්කරණ ඇතිකිරීමට මූලික පියවර ආරම්භ කර ඇතත්, එම ප්‍රතිසංස්කරණ මගින් මෙම ගැටලු ආමන්ත්‍රණය කරන්නේදැයි නොදනී.




**පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව සහ එහි නිර්දේශ ගැන සමාජය හා සාමයික කේන්ද්‍රයේ ස්ථාවරය**

මෙම කාරක සභාවේ හමුවේ වැදගත් කාරණා කිහිපයක් අනාවරණය වී ඇති බව සමාජය හා සාමයික කේන්ද්‍රය නිරීක්ෂණය කරයි. ඉන් ප්‍රධානම කරුණ වන්නේ යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයයි. අතිශයින්ම සැකයට තුඩු දෙන ආකාරයේ හැසිරීමක් යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයෙන් පෙන්නුම් කිරීම එවකට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ද කුකුසට හේතුවූ නිරීක්ෂණයක් බව මෙම වාර්තාව අධ්‍යයනය කිරීමේදී පෙනී යයි. බරපතළ ම ගැටලුව වන්නේ මෙම වාර්තාව ලබාදී වසර ගණනාවක් ගතවුවද, 2024 නොවැම්බර් වන තෙක් මේ ගැන නිසි අපරාධ විමර්ශනයක් සිදුනොවීම ය. යම් තරමකට හෝ ඒ ගැන විමර්ශනයක් ආරම්භ වූයේ චැනල් ෆෝ නාලිකාවේ හෙළිදරව්ව ගැන ආරම්භ වූ විමර්ශනයට සමගාමීව ය. මෙවැනි බරපතළ කාරණයක් ගැන වසර කිහිපයක් තිස්සේ විමර්ශනය නොවීම ද හමුදා බුද්ධි අංශ හැසිරීම හා සමානව ම බරපතළ කරුණක් බව සමාජය හා සාමයික කේන්ද්‍රයේ ස්ථාවරයයි.

යම්-යම් අලුත් නීති-රීති ගෙන ඒම ගැන විශේෂ කාරක සභාවේ අවධානය යොමුවී ඇතත් සමාජය හා සාමයික කේන්ද්‍රයේ ස්ථාවරය වන්නේ දැනට තිබෙන නීති-රීති පවා ඒවා පැනවූ අරමුණ සාක්ෂාත් කරගැනීමට භාවිත කරනවා වෙනුවට වෙනත් දේශපාලන වුවමනාවක් මුදුන්පත් කරගැනීමට සහ පුරවැසි අයිතිවාසිකම් මර්දනය කිරීමට යොදාගැනීම සිදුවන පසුබිමක නව නීති ගෙන ආවද, එම නීති ද අදාළ අරමුණ වෙනුවෙන් භාවිත නොකර වෙනත් අරමුණු මුදුන් පැමිණවීම සඳහා බලධාරීන් භාවිත නොකරන බවට විශ්වාසයක් නැති බවයි.

පවතින මර්දනීය නීති පවා වෙනස් කරගැනීමට සහ ඒවා අවභාවිත කිරීම නතර කිරීමට නොහැකි වී ඇති පසුබිමක නව නීති ගෙන ඒම මගින් භයානක තත්ත්වයක් ඇති විය හැකි බව සමාජය හා සාමයික කේන්ද්‍රයේ අදහසයි.

එසේම බුද්ධි අංශවල සිදු කළ යුතු සාධනීය ප්‍රතිසංස්කරණ සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැනි දෑ දිගින්-දිගටම ප්‍රමාද වීම මගින් නැවත ගැටලු සහගත තත්ත්වයන් ඇතිවීමේ ඉඩකඩක් තිබේ. එසේම මෙම සියලු ප්‍රතිසංස්කරණ කළ යුත්තේ අදාළ සියලු පාර්ශ්වවල අදහස් විධිමත් පරිදි ලබාගැනීමෙන් පසු, ඊට සුදුසු පුද්ගලයන්ගේ මැදිහත්වීමෙන් බව සමාජය හා සාමයික කේන්ද්‍රය අවධාරණය කරයි.

## 04 වැනි පරිච්ඡේදය

## රොහාන්ගේ අබු-හින්ද් කතාව සම්පූර්ණයෙන් පිළිනොගනී - විනිසුරු ජනක්ද සිල්වා කමිටුවේ කතාව

පාස්කු ප්‍රහාරයට අදාළ ව පත් කළ කමිටු සහ කොමිෂන් සභා අතරින් වැඩිම කාලයක් ගෙන, වැඩිම පිරිසකගෙන් සාක්ෂි ලබාගත් ව්‍යුහය වූයේ විනිසුරු ජනක් ද සිල්වා මහතාගේ සභාපතිත්වයෙන් පත් කළ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවයි.

ශ්‍රී ලංකාවේ පවතින නීතිය අනුව ජනාධිපතිවරයාට කොමිෂන් සභා වර්ග 02ක් පත්කළ හැකිය. ඉන් එකක් වන්නේ විටින්-විට සංශෝධිත 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතයි. දෙවැන්න වන්නේ 1978 අංක 04 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (විශේෂ විධිවිධාන) පනතයි. විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවකට එහි සොයාගැනීම් අනුව ප්‍රජා අශක්නුතා නියම ප්‍රකාශයට පත්කිරීම ඇතුළු පුළුල් බලතල ලබාදී තිබේ. පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයට අදාළ ව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් පත්කරනු ලැබුවේ විටින් විට සංශෝධිත 1948 අංක 17 දරන පනත යටතේ වූ පරීක්ෂණ කොමිෂන් සභාවකි.[26]

අංක 2141/88 දරන 2019 සැප්තැම්බර් 21 දිනැති ගැසට් නිවේදනය මගින් ප්‍රසිද්ධ කරමින් පත්කළ එම පරීක්ෂණ කොමිෂන් සභාවේ සාමාජිකයන් මෙසේ ය.

1) අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා (දැන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකි)
2) අභියාචනාධිකරණ විනිසුරු නිස්සංක බන්දුල කරුණාරත්න (දැන් විශ්‍රාමිකයි)
3) විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ
4) විශ්‍රාමික මහාධිකරණ විනිසුරු බන්දුල කුමාර අතපත්තු
5) විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව් එම් එම් ආර් අධිකාරි

කොමිසමේ ලේකම් ලෙස කටයුතු කළේ බුවනෙක හේරත් මහතා ය. මෙම කොමිෂන් සභාවේ බලතල නැවත වරක් පුළුල් කළ අතර, එම දැන්වීම 2019 ඔක්තෝබර් 22 දින අංක 2146 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ පළකරන ලදි.




[26]2019 සැප්තැම්බර් 21, අංක 2141/88 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය.

මෙම කොමිෂන් සභාව පත්කිරීමේදී ජනාධිපතිවරයා කොමිසම වෙත ප්‍රධාන නියෝග 13ක් ලබාදුන්නේය. 2019 අප්‍රේල් 21 ප්‍රහාරය සහ ඊට පෙර සිදුවීම්වලට අදාළ ව පැමිණිලි බාරගැනීම, සාක්ෂි කැඳවීම හා ලැබුණු තොරතුරුවලට අදාළ ව අපක්ෂපාතී විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීම, ඒවාට වගකිවයුත්තන් හඳුනාගැනීම, අන්තවාදය ගැන නිසි ක්‍රියාමාර්ග නොගත් අය හඳුනාගැනීම, අතපසුවීම් සහ රාජකාරි පැහැරහරින ලද පිරිස් හඳුනාගැනීම, රට තුළ ජාතිවාදී හා ආගම්වාදී ආරවුල් ඇතිවීමට හේතුවන්නා වූ සහ මහජනතාව කුපිත කරන්නා වූ ක්‍රියාදාමයක් ඇති කළ, අනුබල දුන් සහ අනුග්‍රහය දක්වන පුද්ගලයන් සහ සංවිධාන හඳුනාගැනීම, අප්‍රේල් 21 ප්‍රහාරයට හේතු වූ කරුණු සහ ස්වභාවය දැනගැනීම, ඉදිරියේදී මෙවැනි ක්‍රියා සිදුවීම වැළැක්වීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම ද එම නියෝග අතර විය.

කොමිෂන් සභාව තම අවසන් වාර්තාවේ සඳහන් කළේ විනිසුරු විජිත් මළල්ගොඩ කමිටුවේ නිර්දේශයක් ක්‍රියාත්මක කරමින් සහ මැල්කම් කාදිනල් රංජිත් කොළඹ අගරදගුරුතුමන්ගේ ඉල්ලීම මත මෙම පර්යේෂණ කොමිෂන් සභාව ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබූ බවයි. ඒ අනුව සාක්ෂි ලබාගැනීමේ මුළු කාල සීමාව තුළදීම කාදිනල් හිමියන් වෙනුවෙන් නීතිඥ නියෝජනයක් ලබාදීමට කොමිසම තීරණය කළ අතර, එය එසේ ම සිදු විය.

කොමිෂන් සභාව පත්කිරීමෙන් පසු නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කණ්ඩායමක් ද කොමිසමට සහයෝගය දැක්වීමට නම් කරනු ලැබූ අතර, කොමිසම ඉදිරියේ සාක්ෂි ලබාගැනීමට පෙර ප්‍රකාශ සටහන් කරගැනීමට සහ ඇතැම් විමර්ශන සිදුකිරීමට ශ්‍රී ලංකා පොලිසියේ කණ්ඩායමක් ද අනුයුක්ත කෙරිණි. නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් විශේෂ නියෝජනයක් කරමින් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා විරෝධතාවක් ප්‍රකාශ කළේය. එම විරෝධතාව පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවේ හෝ රැඳවුම් භාරයේ සිටින පුද්ගලයන්ගෙන් සාක්ෂි විමසීම සම්බන්ධයෙන් විය. කෙසේ වෙතත් කොමිෂන් සභා සාමාජිකයන්ගේ බහුතර මතය අනුව එම විරෝධතාව නිශ්ප්‍රභ කෙරිණි.[27]


කොමිෂන් සභාවේ මෙම කාර්යයේදී එහි පොලිස් ඒකකය විසින් ප්‍රකාශ 1,588ක් ලබා ගත් අතර, එම ප්‍රකාශ සලකාබැලීමෙන් පසු කොමිෂන් සභාව ඉදිරිපිටට සාක්ෂි ලබාගැනීම සඳහා 457 දෙනෙක් කැඳවනු ලැබූහ. ඔවුන්ගේ සාක්ෂි පිටු 37,314කට අධික සංඛ්‍යාවක සටහන් කළ අතර, පොත් 206ක්, ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීම් ඇතුළු ලේඛන 2,377ක් ද සාක්ෂි වශයෙන් ඉදිරිපත් කෙරිණි.[28] ඇතැම් ස්ථානවල (කොච්චිකඩේ, කටුවාපිටිය, නින්දවූර්, සමන්තුරේ, සයින්දමරුදු සහ කාත්තන්කුඩි ඇතුළු) ක්ෂේත්‍ර පරීක්ෂණ ද සිදු කෙරිණි. කොමිසමේ වාර්තාව අවසන් වාර්තාව ද සමග වෙළුම් 06කින් යුක්ත විය.

1) පළමු වෙළුම - අවසන් වාර්තාව (පරිච්ඡේද 32කින් සමන්විත ය.)
2) දෙවැනි වෙළුම - කොටස් තුනකින් සමන්විත ය.
   පළමු කොටස - විවෘතව ලබා දුන් සාක්ෂි
   දෙවැනි කොටස - රහසිගතව ලබා ගත් සාක්ෂි
   තුන්වැනි කොටස - කොටසක් විවෘතව සහ කොටසක් රහසිගතව ලබා ගත් සාක්ෂි
3) තුන් වැනි වෙළුම - කොමිසම C ලෙස ලකුණු කළ ලේඛන
4) හතර වැනි වෙළුම - කොමිසම X ලෙස ලකුණු කළ ලේඛන
5) පස් වැනි වෙළුම - සාක්ෂිකරුවන් හෝ ඔවුන්ගේ නීතිඥයන් පෞද්ගලිකව ඉදිරිපත් කරන ලද ලේඛන

[27]2021 ජනවාරි 31, විමර්ශන කොමිෂන් සභාවේ පළමු වැනි වෙළුම (අවසන් වාර්තාව)
[28]2021 ජනවාරි 31, විමර්ශන කොමිෂන් සභාවේ පළමු වැනි වෙළුම (අවසන් වාර්තාව)

6) හය වැනි වෙළුම - වෙළුමේ සලකුණු කළ ලේඛන දර්ශකය

මෙම කොමිසමේ පොලිස් ඒකකය විසින් ලබාගත් කටඋත්තර වෙළුමක් ලෙස ඇතුළත් කර නැත. කොමිෂන් සභාවේ ප්‍රධාන වෙළුම් 06 සහ පොලිස් ඒකකය ලබාගත් කටඋත්තර අතරින් දැනට මහජනතාව වෙත ප්‍රසිද්ධ කර ඇත්තේ පළමු වෙළුම වන කොමිෂන් සභාවේ අවසන් වාර්තාව පමණි. සමාජය හා සාමයික කේන්ද්‍රය විසින් කොමිෂන් සභාවේ දෙවැනි වෙළුමේ අන්තර්ගත ඇතැම් සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ ඉල්ලමින් ගොනු කළ තොරතුරු ඉල්ලීමකට අදාළ අභියාචනා 02කදී[29][30] තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව තීන්දු කළේ අදාළ පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ විවෘතව දුන් සාක්ෂි සහ කොටසක් විවෘතවත් කොටසක් රහසිගතවත් දුන් සාක්ෂිවල විවෘතව ලබා දුන් කොටස අභියාචක වෙත නිදහස් කළ යුතු බවයි. කෙසේ වෙතත් මෙම තීන්දුවට එරෙහිව ජනාධිපති ලේකම් කාර්යාලය සහ නීතිපති දෙපාර්තමේන්තුව අභියාචනාධිකරණයට අභියාචනා පෙත්සම් 02ක්[31] ඉදිරිපත් කර තිබේ.




ජාතික තවුහිද් ජමාත් නායක සහරාන් හෂීම් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ව්‍යුහය විවේචනය කිරීම ආරම්භ කළේ 2017 අගභාගයේ සහ 2018 මුල්භාගයේ බව පරීක්ෂණ කොමිෂන් සභාව සඳහන් කරයි.[32] එසේම සහරාන් හෂීම් 'අබු-හින්ද්' නම් ඉන්දියාවේ සිටියේ යැයි කියන පුද්ගලයා සමග සම්බන්ධ වන්නේ ද 2017 අගභාගයේදී බව කොමිසම සඳහන් කරයි. අබු-හින්ද්, නවුෆර් මවුලවි සමග ද සම්බන්ධ වූ අතර, ඔවුහු ත්‍රීමා සහ ටෙලිග්‍රෑම් යෙදුම් හරහා අබු-හින්ද් සමග දෙමළෙන් කතා කළ බව සඳහන් ය. සහරාන් විසින් පළමු පුහුණු කඳවුර පවත්වා ඇත්තේ ද 2017 වසරේ අගදී, එනම් නොවැම්බර් මාසයේදී ය. සහරාන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයන් විවේචනය කරන තැනට යෑමට සහ පුහුණු කඳවුරු පැවැත්වීමට අබු-හින්ද්ගේ සම්බන්ධතාව බලපෑවේද

[29]RTIC Appeal/442/2023
[30]RTIC Appeal/443/2023
[31] CA RTI 0004/2024 , CA RTI 0005/2024
[32]පිටුව 94, 2021 ජනවාරි 31, විමර්ශන කොමිෂන් සභාවේ පළමු වැනි වෙළුම (අවසන් වාර්තාව) - සිංහල පිටපත.

යන්න ගැන කොමිෂන් වාර්තාවේ පැහැදිලිව සඳහන් නොවේ. කෙසේ වෙතත් රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා විසින් කොමිසම හමුවේ කරන ලද ප්‍රකාශයක් උපුටා දක්වමින් කොමිසම අවසන් වාර්තාවේදී සඳහන් කරන්නේ[33] 'අබු-හින්ද්' නම් පුද්ගලයා මෙම ප්‍රහාරය අවුළුවාලීමට ඉඩ ඇති කොටස්කරුවකු ලෙස සඳහන් කර ඇති බවයි. නිලන්ත ජයවර්ධන මහතා කොමිසම හමුවේ එලෙස ප්‍රකාශ කරන්නට ඇත්තේ ඔහුට ඒ සඳහා ප්‍රමාණවත් හේතු තිබෙන නිසා විය හැකිය. කෙසේ වෙතත් කොමිසම ඉදිරියේදී 2021 ජනවාරි මස 19 වැනිදා සාක්ෂි ලබා දුන් (මහාචාර්ය) රොහාන් ගුණරත්න ප්‍රකාශ කළේ අබු-හින්ද් යනු ඉන්දියාවේ බුද්ධි අංශයක් විසින් නිර්මාණය කරන ලද බේත නාමයක් ලෙස ය.

ඔහු මෙසේ කීවේය.

*'I am not privy to what feedback Nilantha Jayawardena gave Q Branch but what I would like to share with you is what I have been informed by the Q Branch about the information that they developed and how they developed that information and intelligence.'*

*'Q Branch operated a virtual persona and I will explain what a virtual persona is. That is security and intelligence services have many methods of collecting information and intelligence. And one of the techniques that they are using is that they will create a virtual personality, that is they will put on the website and say a person who is a beautiful picture of a girl and they may get someone else to communicate as if that person is a girl. And that person will tell anyone they want to trap or lever o.k. like a girl look I really want to meet you please come to the airport and see me. And when that person comes to the airport that person will be arrested. So virtual persona is a person who is created by intelligence services to penetrate or infiltrate threat organizations or enemy organizations or opponents. So Q Branch created several personas that portray that project that they are terrorists or terrorist supporters or terrorist leaders, or terrorist ideologues or terrorist financiers so they will create these characters these virtual characters and these virtual characters are operated by intelligence officers. These intelligence officers know for example if they are penetrating Muslim terrorist organizations they know about Muslim prayer time. So during prayer was they will not communicate to anyone. Then they know when someone greets you say Assalam Aleikkum, then you will say Alaikum Salane Warahmatullahi Wabarakatuhalabas Wallabi. So they know all the ways to greet right. Then they know how to address them. So for example if they speak to Rilvan they will sometimes use his Abu name right. Say they may call him Abukithal. If they speak to Zaharan theywill use the word Abuveda. So they will know how to engage those people. So these are people who are highly trained to build relationships and to exploit those targets for information and intelligence. So sometimes they will adapt their virtual persona to engage their target meaning the person whom they are eliciting information and build a friendship, build a rapport and sometimes these relationships are very long term*

[33]පිටුව 245, 2021 ජනවාරි 31, විමර්ශන කොමිෂන් සභාවේ පළමු වැනි වෙළුම (අවසන් වාර්තාව) - සිංහල පිටපත.

*relationships. So that is the type of personality the Tamil Nadu Q Branch created in order to penetrate the Islamic State of Sri Lanka.'*

*'The name Abuhind. Abuhind is the name that was created by the Q Branch as a virtual persona in order to build contact, relationship with Zaharan and subsequently through Zaharan they were able to communicate with the following personalities. That is Abuhind communicated other than Zaharan, with Zahini Zahini Maulavi, with Rilvan also known as Jalal kithal then with Naufer although Naufer didn''t have the phone number of Abuhind, he spoke to Abuhind a few times, with Milhan. Milhan also didn''t have the phone number but spoke to Abuhind a few times.'*

*'Yes in fact when the Indian Service provided the information to the Sri Lankan Service they thought that Rilvan and Jalal kithal are two different people because it is because Zaharan didn''t tell everything to Abuhind. Zaharan was a very cautious man that is why he was so successful in the Easter attack he didn''t divulge say all the targets that he took, for example he mentioned I am going to attack a Church. I am going to attack a hotel. But he didn''t mention that I am going to attack Kingsbury I am going to attack Taj, I am going to attack Cinnamon Grand, I am going to attack Shangri-la. He also didn''t mention that he was going attack a Church in Batticaloa, another Church in Katuwapitiya, another Church in Colombo. So Zaharan didn''t comprehensively reveal his plan to Abuhind but he mentioned to him Abuhind I am going to mount attacks on this particular date.'*

නිලන්ත ජයවර්ධනට අනුව අබු-හින්ද් යනු ප්‍රහාරය අවුළුවාලීමට සම්බන්ධ අයකු වුවද, රොහාන් ගුණරත්නට අනුව අබු-හින්ද් යනු තමිල්නාඩුවේ කිව් ශාඛාව විසින් තොරතුරු ලබාගැනීමට භාවිත කළ නාමයකි. අබු-හින්ද් සිදු කළේ තොරතුරු ගැනීම පමණක් නම්, නුදුරේදීම එල්ල කරන ප්‍රහාරයක් ගැන අප්‍රේල් 04 වැනිදා ශ්‍රී ලංකාවට ඉන්දියාවේ බුද්ධි අංශයකින් තොරතුරු ලබාදී තිබියදී එරට ආරක්ෂක ලේකම්වරයා ඊට සතියකට පමණ පසු ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වේවිද යන්න ගැන බරපතළ සැකයක් ඇති වේ.

අබු-හින්ද් සම්බන්ධයෙන් මෙම පරීක්ෂණ කොමිෂන් සභාව අවසන් වශයෙන් සඳහන් කර ඇත්තේ අබු-හින්ද්ගේ අනන්‍යතාව ගැන පරීක්ෂණ ඉදිරියටත් කරගෙන යා යුතු බවයි. රොහාන් ගුණරත්නගේ ඉහත සාක්ෂිය ඒ අයුරින්ම කොමිෂන් සභාව පිළිගත්තේ නම්, තවදුරටත් විමර්ශනය කළ යුතු බවට සඳහන් කරන්නට අවශ්‍යතාවක් නැත. එයින් පෙනීයන්නේ අබු-හින්ද් සම්බන්ධයෙන් මෙම පරීක්ෂණ කොමිෂන් සභාවට යම් කුකුසක් තිබූ බවයි.




පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය ගැන සෙවීමට ජනාධිපතිවරයා විසින් පත් කළ මෙම පරීක්ෂණ කොමිෂන් සභාවේ තවත් එක් වැදගත් නිරීක්ෂණයක් වූයේ සාරා ජස්මින් සම්බන්ධයෙන් වූ නිරීක්ෂණයයි. සාරා ජීවතුන් අතර සිටින බවට සාක්ෂිකරුවන් දෙදෙනකුගේ සාක්ෂි කොමිසමට ලැබුණු බව කොමිෂන් සභාව අවසන් වාර්තාවේදී සඳහන් කරයි. එයින් එක් ප්‍රධාන සාක්ෂියක් වන්නේ සහරාන්ගේ බිරිඳ වන ෆාතිමා හාදියාගේ සාක්ෂියයි. අදාළ සාක්ෂි සැලකිල්ලට ගෙන සාරා පිළිබඳ පරීක්ෂණ දිගටම කරගෙන යන ලෙස කොමිසම නිර්දේශ කළේය.



මෙම කොමිසම හමුවේ සාක්ෂි ලබා දුන් ඇතැම් සාක්ෂිකරුවන්ගෙන් ඉතා වැදගත් කරුණු අනාවරණය වූ අතර, ඒ ගැන වෙනම වාර්තාවකින් සමාජය හා සාමයික කේන්ද්‍රය ප්‍රසිද්ධියට පත්කරනු ඇත.

මෙම පරීක්ෂණ කොමිෂන් සභාව විසින් සිය වාර්තාවෙන් නිර්දේශ ගණනාවක් ලබාදී තිබේ. එහි නිර්දේශ ලෙස වෙනම පරිච්ඡේදයක් ඇතත්, අනෙකුත් පරිච්ඡේද ඇතුළත පවා ඇතැම් වැදගත් නිර්දේශ අන්තර්ගත විය. එසේම පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය වළක්වා ගැනීමට කටයුතු නොකිරීමට අදාළ වගකිවයුතු පාර්ශ්ව සම්බන්ධයෙන් ගත යුතු පියවර ගැන ද නිර්දේශ එහි ඇතුළත්ව තිබේ. අදාළ සියලු නිර්දේශ මෙම වාර්තාවේ ඇතුළත් නොකරන අතර, තෝරාගන්නා ලද නිර්දේශ කිහිපයක් සංක්ෂිප්ත වශයෙන් මෙසේ ය.




1) ජාතික තවුහිද් ජමාත් නායක සහරාන් හෂීම් විසින් එල්ල කරනු ලබන ප්‍රහාරයක් සම්බන්ධයෙන් ලැබුණු තොරතුරු අනුව එය වළක්වා ගැනීමට කටයුතු නොකළ පිරිසට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම.
2) ත්‍රස්තවාදීන්ට අදාළ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සහ ඊට අදාළ පැමිණිලි විභාග කිරීමට වෙන්වූ නඩු පැවරීමේ ඒකකයක් නීතිපති දොපර්තමේන්තුවේ පිහිටුවීම සහ ඔවුන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා පුහුණුවක් ලබාදීම, අදාළ කණ්ඩායමට වෙනත් කාර්යයන් නොපැවරීම, ත්‍රස්ත විමර්ශන අංශය (TID) සහ අනෙකුත් අදාළ ආයතනවල ත්‍රස්තවාදය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන නිලධාරීන් අතර මාසික සමාලෝචන රැස්වීමක් පැවැත්වීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම
3) නීතිපති දෙපාර්තමේන්තුවේ සියලුම අංශවල කාර්තුමය ගොනු සමාලෝචන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම
4) ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පනත සංශෝධනය කිරීම සහ ඒ වෙනුවට ගෙනඒමට යෝජනා වී තිබූ ප්‍රති-ත්‍රස්ත පනත් කෙටුම්පත සංශෝධනය කිරීම
5) අන්තවාදීයැයි හඳුනාගත් සංවිධාන කිහිපයක් තහනම් කිරීම

6) සිංහල රාවය, මහ සොහොන් බලකාය, සිංහලේ ජාතික බලමුළුව, සිංහලේ ජාතික සංවිධානය, ශිවසේනා ව්‍යාපාරය වැනි තවත් සංවිධාන කිහිපයක ක්‍රියාකාරකම් සමීපව අධීක්ෂණය කරමින් යම් ආකාරයක අන්තවාදී ක්‍රියා සිදුවන්නේ නම් ඒ පිළිබඳ නීතිමය පියවර ගැනීම
7) වින්දිතයන් සඳහා ප්‍රමාණවත් වන්දි මුදලක් පිරිනැමීම, සුභසාධන පියවර ගැනීම සහ සහන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (මිය ගිය එක් අයකු වෙනුවෙන් රුපියල් මිලියන 02ක වන්දියක්)
8) පාස්කු ප්‍රහාරයෙන් පසු ඇතිවූ ප්‍රචණ්ඩ ක්‍රියාවලට සම්බන්ධ පාර්ශ්වවලට නඩු පැවරීම සහ වින්දිතයන්ට වන්දි ගෙවීම
9) ආගමික ස්ථාන ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් යම් නියාමනයක් ඇති කිරීම
10) මහජනතාවගේ ආරක්ෂාව සහතික කිරීම සහ මෙවැනි සිදුවීම් නැවත ඇතිවීම වැළැක්වීම
11) ඩ්‍රෝන කැමරා භාවිත කිරීම ඇතුළු ගුවන් අවකාශය රජය විසින් සම්පූර්ණයෙන් නියාමනය කළ යුතුය
12) ජනතාවට ප්‍රශ්න නැගීමට වේදිකාවක් ඇති කිරීම, ඵලදායී අධිකරණ පද්ධතියක් ඇති කිරීම සහ යහපාලනය ගොඩනැගීමට අදාළ ප්‍රායෝගික හා ඵලදායී පියවර ගැනීම
13) සමස්ත ලංකා ජමියාතුල්-උලමා ව්‍යුහය තුළ සූෆි මුස්ලිම් ප්‍රජාව ප්‍රමාණවත් ලෙස නියෝජනය වන බව සහතික කිරීම සඳහා 2000 අංක 51 දරන පනත සංශෝධනය කිරීම
14) සියලුම පුරාණ ආගමික ස්මාරක ආරක්ෂා කිරීම සඳහා පොලිසියේ විශේෂ අංශයක් ජාතික හා පළාත් මට්ටමින් නිර්මාණය කිරීම
15) ශ්‍රී ලංකා දූත මෙහෙවරකට හෝ ආයතනයකට නොපැමිණි සාක්ෂිකරුවකුගෙන් විදෙස් රටවල සිට සාක්ෂි ලබාගැනීමට හැකිවන පරිදි නීති සංශෝධනය කිරීම
16) පොලිස් සැරයන් සුමින්ද නිහාල් වීරසිංහ අප්‍රේල් 26 සයින්දමරුදු සිදුවීමේදී දැක්වූ නිර්භීතකම වෙනුවෙන් ප්‍රශංසාවට ලක්කිරීම.
17) සමාගම් පනතේ සමාගම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය නැවත සමාලෝචනය කර පනත සංශෝධනය කිරීම සහ සමාගම් පනත යටතේ ආගමික පාසල් ලියාපදිංචි නොකිරීම
18) මොහොමඩ් තස්ලීම්ට එක්සත් රාජධානියේ වැඩිදුර ප්‍රතිකාර සඳහා මූල්‍යාධාර සැපයීම සහ ඔහුට ආරක්ෂාව සැපයීම
19) මඩකලපුවේ සියොන් දේවස්ථානයේ අභාවප්‍රාප්ත රමේෂ් රාජු මහතා, සිද්ධියේ මරණ සංඛ්‍යාව අවම කිරීමට හේතු වූ ඔහුගේ නිර්භීතකම වෙනුවෙන් ඔහුගේ සමීපතම ඥාතියාට ත්‍යාග ගෙවීමක් සිදු කිරීම
20) මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ ව්‍යාපාර ඇතුළු සියලු දේපොළ රාජසන්තක කිරීම
21) නිශ්චිත අවසරයකින් තොරව විමර්ශන ආයතන 02ක් හෝ වැඩි ගණනක් එකම කාරණය විමර්ශනය නොකරන බවට සහතික වීම සහ විමර්ශන ආයතන අතර සම්බන්ධීකරණයක් තිබීම
22) අපරාධ පරීක්ෂණවලදී දේශපාලනඥයන් විසින් කිසිදු පොලිස් නිලධාරියකු සම්බන්ධ කරගැනීම වැළැක්වීම සඳහා නීතිමය විධිවිධාන ගෙනඒම
23) ආගමික හෝ ජනවාර්ගික අසමගිය ඇතිකිරීමට සම්බන්ධ බවට සැකකෙරෙන පුද්ගලයන් වරෙන්තු නොමැතිව අත්අඩංගුවට ගැනීම සඳහා විධිවිධාන සැලසීම
24) පාස්කු ඉරිදා ප්‍රහාරය මෙන්ම ත්‍රස්තවාදී නඩු සම්බන්ධ සියලු අපරාධ නඩු විභාග කිරීම සහ අවසන් කිරීමට වෙනම මහාධිකරණ පිහිටුවීම සහ විනිසුරුවන්ට විශේෂ රැකවරණයක් සහ පුහුණුවක් ලබාදීම, ඊට අදාළ නඩු දිනපතා විභාග කිරීම
25) සයිබර් අවකාශයේ අන්තවාදී ආගමික වෙබ් අඩවි සහ බ්ලොග් අඩවි ක්‍රියාත්මක කිරීම ගැන විමර්ශන කිරීම සහ නෛතික ක්‍රියාමාර්ග ගැනීම

26) සියලුම දහම් පාසල්, ඉරිදා පාසල, අහඩියා සහ තක්කියා පාසල් රජය විසින් එකම ආයතනයක් යටතේ නියාමනය කිරීම
27) ආරක්ෂක අමාත්‍යාංශය ජනාධිපතිවරයා යටතේ ම තිබීම සහ ජනාධිපතිවරයා විදේශගත වන්නේ නම් වැඩ බලන ආරක්ෂක අමාත්‍යවරයකු පත්කිරීම
28) ආගමික අන්තවාදීන් එයින් මුදවාගැනීමට සහ නිර්-රැඩිකලීකරණය කිරීම සඳහා කාර්යක්ෂම පුනරුත්ථාපන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම
29) බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හෝ ඉස්ලාම් ආගමික බෙදීම් අනුව ඇති පාසල් එම බෙදීම්වලින් නිදහස් කිරීම සහ සෑම පාසලකම රටේ ආගමික සංයුතිය නියෝජනය කරන ශිෂ්‍ය ජනගහනයක් සිටීම
30) සෑම පාසලකම සිසුන්ට ඔවුන්ගේ ආගම නොසලකා 'ආගමික අධ්‍යාපනය' යන නව විෂයක් ඉගැන්වීම. (බුද්ධාගම, ක්‍රිස්තියානි ධර්මය, හින්දු සහ ඉස්ලාම් යන මූලික කරුණු 1 සිට 10 දක්වා ශ්‍රේණි සඳහා අනිවාර්ය පදනමක් මත ඉගැන්වීම.)
31) ජාතික, පළාත් සහ ජාත්‍යන්තර පාසල් සිසුන්ගේ භාවිතය සඳහා ඇති සියලුම ආගමික පොත්වල අන්තවාදී හෝ ත්‍රස්තවාදී සාහිත්‍යයක් ඍජුව හෝ වක්‍රව ඇතුළත් කර ඇත්දැයි සොයාබැලීම
32) වයස අවුරුදු 5 සිට 18 දක්වා සියලුම දරුවන් රජය පිළිගත් රජයේ හෝ පෞද්ගලික අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලැබීම අනිවාර්ය කිරීම. (ළමුන්ට නිවෙස්වල පමණක් ඉගැන්විය යුතු නැත.)
33) සියලුම ළමුන්ට ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නොතකා 13 වැනි ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය අනිවාර්ය කරවීම
34) විෂය නිර්දේශ ප්‍රතිසංස්කරණය කිරීම
35) මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම
36) පුපුරණ ද්‍රව්‍ය සහ ආයුධ නියාමනය කිරීම
37) විදේශ රටවල ත්‍රස්ත සැකකරුවන් පිටුවහල් කිරීම සඳහා පියවර ගැනීමට පිටුවල් කිරීමේ නීති ශක්තිමත් කිරීම
38) මූල්‍ය පද්ධතියට අදාළ වෙනස්කම් සිදුකිරීම සහ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීම විධිමත් කිරීම
39) නිශ්චිත අවසරයක් නොමැතිව විදේශිකයන්ට කිසිදු ආගමික දේශනයක්, සාකච්ඡාවක් හෝ සම්මන්ත්‍රණයක් සිදුනොකළ යුතු බවට වීසා කොන්දේසි පැනවීම
40) ආගමික ස්ථානවලට විදේශීය අරමුදල් ගලාඒම නියාමනය කිරීම
41) ජාතික බුද්ධි ඒජන්සියක් පිහිටුවීම සහ බුද්ධි අංශවල අවශ්‍ය ප්‍රතිසංස්කරණ කිරීම
42) ශ්‍රී ලංකා පොලිසියේ අවශ්‍ය ප්‍රතිසංස්කරණ කිරීම
43) ආගමික හේතු සහ විශ්වාසයන් මත පදනම්ව දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම තහනම් කිරීම ඇතුළු පක්ෂ ලියාපදිංචි කිරීමට අදාළ ක්‍රමවේද සකස් කිරීම
44) ජනවාර්ගික හා ආගමික වෛරය අවුළුවාලීම වැළැක්වීම සඳහා පුළුල් නීතිමය රාමුවක් නිර්මාණය කිරීම
45) සියලුම රජයේ ඉඩම් පිළිබඳ විගණනයක් සිදුකිරීම සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් පත්කිරීම
46) ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන පනත සංශෝධනය කිරීම

## පුද්ගල වගවීම සහ නිර්දේශ: දේශපාලන සහ විධායක

| නම | තනතුර | කොමිසමේ නිරීක්ෂණය | නිර්දේශිත ක්‍රියාමාර්ගය |
|---|---|---|---|
| මෛත්‍රීපාල සිරිසේන | හිටපු ජනාධිපති | ක්‍රියාවන් සහ අතපසුවීම් මත සාපරාධී වගකීමක් ඇත. | දණ්ඩ නීති සංග්‍රහය යටතේ අපරාධ නඩු පැවරීමට සලකා බැලීම. |
| රනිල් වික්‍රමසිංහ | හිටපු අග්‍රාමාත්‍ය | ඉස්ලාම් අන්තවාදය කෙරෙහි දැක්වූ ලිහිල් ප්‍රවේශය රජයේ අසාර්ථකත්වයට එක් ප්‍රධාන හේතුවකි. | ක්‍රියාමාර්ග නිර්දේශ කර නැත. |
| රිෂාඩ් බදියුදීන් | හිටපු අමාත්‍ය | හමුදාපතිවරයාට කතා කර සැකකරුවකු ගැන තොරතුරු සෙවීම. | අපරාධ චෝදනා ගොනු කිරීමට සලකා බැලීම. |
| අසාද් නවාවි | නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් | TID ලිපිගොනු නිසි ලෙස අධීක්ෂණය නොකිරීම. | රාජ්‍ය සේවා කොමිසම හරහා විනය ක්‍රියාමාර්ග ගැනීම. |

NotebookLM

එක් එක් පුද්ගලයන්ගේ වගවීම ගැන නිර්දේශ

1) ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන - වාර්තාවේ සවිස්තරාත්මකව දක්වා ඇති ක්‍රියාවන් හෝ අතපසුකිරීම් හෝ සම්බන්ධයෙන් සිරිසේන මහතාට අපරාධ වගකීමක් ඇති බව කොමිෂන් සභාවේ අදහස වන බැවින් නීතිපතිවරයා විසින් දණ්ඩ නීති සංග්‍රහය යටතේ අපරාධ නඩු පැවරීමට සලකා බැලිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.
2) අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ - වික්‍රමසිංහ මහතා අගමැති ලෙස ඉස්ලාම් අන්තවාදය කෙරෙහි දැක්වූ ලිහිල් ප්‍රවේශය එවකට රජය ක්‍රියාශීලි පියවර ගැනීමට අපොහොසත්වීමට එක් ප්‍රධාන හේතුවක් බව කොමිසමේ මතයයි. එහෙත් වික්‍රමසිංහ මහතාට එරෙහිව ගත යුතු ක්‍රියාමාර්ග ගැන නිර්දේශයක් ඉදිරිපත් කර නැත.
3) ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් හේමසිරි ප්‍රනාන්දු - වාර්තාවේ විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු කිරීම් සම්බන්ධයෙන් හේමසිරි මහතාට සාපරාධී වගකීමක් ඇති බව කොමිෂන් සභාවේ අදහසයි. දණ්ඩ නීති සංග්‍රහය යටතේ ඔහුට අපරාධ නඩු පැවරීමට නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.
4) ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් - වාර්තාවේ විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු කිරීම් සම්බන්ධයෙන් මෙන්ඩිස් මහතාට සාපරාධී වගකීමක් ඇති බව කොමිෂන් සභාවේ අදහසයි. දණ්ඩ නීති සංග්‍රහය යටතේ ඔහුට අපරාධ නඩු පැවරීමට නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.
5) රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන - වාර්තාවේ විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු කිරීම් සම්බන්ධයෙන් ජයවර්ධන මහතාට සාපරාධී වගකීමක් ඇති බව කොමිෂන් සභාවේ අදහසයි. දණ්ඩ නීති සංග්‍රහය යටතේ ඔහුට අපරාධ නඩු පැවරීමට නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## පුද්ගල වගවීම සහ නිර්දේශ: ආරක්ෂක සහ බුද්ධි අංශ

| නම | තනතුර | කොමිසමේ නිරීක්ෂණය | නිර්දේශිත ක්‍රියාමාර්ගය |
|---|---|---|---|
| හේමසිරි ප්‍රනාන්දු | හිටපු ආරක්ෂක ලේකම් | ක්‍රියාවන් සහ අතපසුවීම් මත සාපරාධී වගකීමක් ඇත. | අපරාධ නඩු පැවරීමට නීතිපතිවරයා සලකා බැලීම. |
| සිසිර මෙන්ඩිස් | හිටපු ජාතික බුද්ධි ප්‍රධානී | ක්‍රියාවන් සහ අතපසුවීම් මත සාපරාධී වගකීමක් ඇත. | අපරාධ නඩු පැවරීමට නීතිපතිවරයා සලකා බැලීම. |
| නිලන්ත ජයවර්ධන | හිටපු රාජ්‍ය බුද්ධි සේවයේ (SIS) අධ්‍යක්ෂ | ක්‍රියාවන් සහ අතපසුවීම් මත සාපරාධී වගකීමක් ඇත. | අපරාධ නඩු පැවරීමට නීතිපතිවරයා සලකා බැලීම. |
| එම්. ආර්. ලතීෆ් | STF අණදෙන නිලධාරී | ලැබුණු බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් තම කොට්ඨාසවලට උපදෙස් නොදීම පුදුම සහගතය. | ක්‍රියාමාර්ග නිර්දේශ කර නැත. |

NotebookLM

6) පොලිස්පති පූජිත් ජයසුන්දර - වාර්තාවේ විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු කිරීම් සම්බන්ධයෙන් ජයසුන්දර මහතාට සාපරාධී වගකීමක් ඇති බව කොමිෂන් සභාවේ අදහසයි. දණ්ඩ නීති සංග්‍රහය යටතේ ඔහුට අපරාධ නඩු පැවරීමට නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.
7) පොලිස් විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරි එම් ආර් ලතීෆ් - ලැබුණු බුද්ධි තොරතුරු ගැන ක්‍රියාකිරීමට ඔහු සිය බුද්ධි කොට්ඨාසවලට උපදෙස් නොදුන්නේ මන්ද යන්න පුදුම සහගත බව කොමිෂන් සභාව සඳහන් කරයි. එහෙත් කොමිසම ඔහුට එරෙහි ක්‍රියාමාර්ගයක් නිර්දේශ කර නැත.
8) බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ - වාර්තාවේ විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු කිරීම් සම්බන්ධයෙන් මුණසිංහ මහතාට සාපරාධී වගකීමක් ඇති බව කොමිෂන් සභාවේ අදහසයි. දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ පොලිස් ආඥා පනතේ 82 වගන්තිය යටතේ හෝ ඔහුට අපරාධ නඩු පැවරීමට නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.
9) කොළඹ උතුර භාර නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් - ඔහු හුදෙක් පණිවුඩකරුවකු ලෙස කටයුතු කර ඇති අතර, ඔහුගේ රාජකාරි ඉටුකිරීමට අපොහොසත් වී ඇති බව කොමිසම සඳහන් කරයි. ඒ අනුව ඔහුට විරුද්ධව විනය පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට කොමිසම නිර්දේශ කරයි.
10) කොළඹ උතුර පොලිස් අධිකාරි සංජීව බණ්ඩාර - වාර්තාවේ විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු කිරීම් සම්බන්ධයෙන් (ව්‍යාජ ලේඛන සකස් කිරීමට සහාය වීම ඇතුළු) බණ්ඩාර මහතාට සාපරාධී වගකීමක් ඇති බව කොමිෂන් සභාවේ අදහසයි. දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ පොලිස් ආඥා පනතේ 82 වගන්තිය යටතේ ඔහුට අපරාධ නඩු පැවරීමට නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.
11) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි චන්දන අතුකෝරළ - වාර්තාවේ විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු කිරීම් සම්බන්ධයෙන් අතුකෝරළ මහතාට සාපරාධී වගකීමක් ඇති බව කොමිෂන් සභාවේ අදහසයි. දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ පොලිස් ආඥා පනතේ 82 වගන්තිය

යටතේ හෝ  ඔහුට අපරාධ නඩු පැවරීමට නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

12) බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාසයේ පොලිස් අධිකාරි බී ඊ අයි ප්‍රසන්න - වාර්තාවේ විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු කිරීම් සම්බන්ධයෙන් ප්‍රසන්න මහතාට සාපරාධී වගකීමක් ඇති බව කොමිෂන් සභාවේ අදහසයි. දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ පොලිස් ආඥා පනතේ 82 වගන්තිය යටතේ හෝ ඔහුට අපරාධ නඩු පැවරීමට නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

13) සහකාර පොලිස් අධිකාරි සිසිල කුමාර - ඔහුට ලැබුණු තොරතුරුවලට අනුව ඔහු යටතේ ඇති පොලිස් ස්ථාන නිසි ලෙස පාලනය කර නොතිබුණු බව කොමිසම සඳහන් කරයි. ඒ අනුව ඔහුට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්විය යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරයි.

14) කොළඹ, කොටුව වැඩ බලන ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ආර් එම් සරත් කුමාරසිංහ - වාර්තාවේ විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු කිරීම් සම්බන්ධයෙන් කුමාරසිංහ මහතාට සාපරාධී වගකීමක් ඇති බව කොමිෂන් සභාවේ අදහසයි. දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ පොලිස් ආඥා පනතේ 82 වගන්තිය යටතේ හෝ  ඔහුට අපරාධ නඩු පැවරීමට නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

15) කොළඹ, කොටුව ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එම් සාගර විලේගොඩ ලියනගේ - වාර්තාවේ විස්තර කර ඇති ක්‍රියාවන් හෝ අතපසු කිරීම් සම්බන්ධයෙන් ලියනගේ මහතාට සාපරාධී වගකීමක් ඇති බව කොමිෂන් සභාවේ අදහසයි. දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ පොලිස් ආඥා පනතේ 82 වගන්තිය යටතේ හෝ  ඔහුට අපරාධ නඩු පැවරීමට නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

16) කටාන පොලිස් ස්ථානාධිපති චමින්ද නවරත්න - ඔහු රාජකාරි ඉටුකිරීමට අපොහොසත්වී ඇති බව කොමිෂන් සභාව සඳහන් කරයි. ඒ අනුව ඔහුට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට කොමිසම නිර්දේශ කරයි.

17) නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් අසාද් නවාවි - ඔහු ත්‍රස්ත මර්දන කොට්ඨාසයෙන් ලබා දුන් ලිපි ගොනුව අධීක්ෂණය කළ යුතුව තිබුණු බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. ඒ අනුව අසාද් නවාවි මහතාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව සලකා බැලිය යුතු බවට කොමිසම නිර්දේශ කරයි.

18) පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර හිමි - මුස්ලිම් තරුණයන් රැඩිකලීකරණයට අර්ධ වශයෙන් ඥානසාර හිමියන් ද දායක වී ඇති බව කොමිෂන් සභාවේ අදහසයි. ඒ අනුව 2013 පෙබරවාරි 17 දින මහරගමදී සහ 2014 ජුනි මාසයේදී අලුත්ගමදී කරන ලද කතාවලට එරෙහිව ICCPR පනත යටතේ ඥානසාර හිමියන්ට එරෙහිව අපරාධ නඩු පැවරීමේ හැකියාව ගැන නීතිපති සලකා බැලිය යුතු බවට කොමිසම නිර්දේශ කරයි. එසේම ඒ හිමියන් නායකත්වය දරන බොදුබල සේනා සංවිධානයේ ක්‍රියාකාරකම් ආගමික සමගියට තර්ජනයක් බැවින් එම සංවිධානය තහනම් කළ යුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි.

19) රිෂාඩ් බදියුදීන් - හමුදාපතිවරයාට කතා කර යම් පුද්ගලයකු ගැන තොරතුරු සොයාබැලීම ගැන බදියුදීන් මහතාට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ සුදුසු විධිවිධාන ප්‍රකාරව අපරාධ චෝදනා ගොනු කිරීමට නීතිපතිවරයා සලකා බැලිය යුතු බව පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි.

20) කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ සභාපති ගාමිණී ජිනසේන - කර්මාන්ත අමාත්‍යාංශයට අයත් කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් ප්‍රශ්නගත කාල සීමාව තුළ අත්තනෝමතික ලෙස විශාල ප්‍රමාණයේ සුන්බුන් ලෝහ කොලොසස් පුද්ගලික සමාගමට

නිකුත් කර ඇති බව සහ සමහර අවස්ථාවල කොලොසස් පුද්ගලික සමාගමේ ඉල්ලීම සභාපතිවරයා සෘජුවම අනුමත කර ඇත්තේ අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ විකිණුම් අධ්‍යක්ෂගේ එකඟතාව ලබානොගෙන බවත් පරීක්ෂණ කොමිෂන් සභාව සඳහන් කරයි. ඒ අනුව රජයට රුපියල් මිලියන 4.6ක පාඩුවක් සිදුකිරීම සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යොමු කළ යුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි.

21) රියාජ් බදියුදීන් - ඔහු සහ කොලොසස් පුද්ගලික සමාගමේ හිමිකරු ඉන්ෂාෆ් නම් බෝම්බකරු අතර දුරකතන ඇමතුම් කිහිපයක් සිදුවී ඇති බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැනුම් දී ඇති හෙයින්, ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වීම සඳහා පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි.

22) වෛද්‍ය මුහම්මද් සූෆියන් මුහමද් සෆ්රාස් - 2018දී බෝම්බ අත්හදාබැලීමකදී තුවාල ලැබූ සහරාන්ගේ සහෝදරයා රිල්වාන් කොළඹ ජාතික රෝහලට ප්‍රතිකාර සඳහා යොමු කළ බව පැවසෙන්නේ ඔහු ය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 5 වැනි වගන්තිය යටතේ තොරතුරු ලබාදීමට අපොහොසත්වීම සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව අපරාධ නඩු පැවරීමේ හැකියාව නීතිපති විසින් සලකා බැලිය යුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි.

23) රාසික් රෆිදීන් නොහොත් අබ්දුල් රාසික් - ඔහුට එරෙහිව අපරාධ චෝදනා ගොනු කළ හැකිද යන්න කඩිනමින් සලකා බැලිය යුතු බව කොමිසම නිර්දේශ කරයි.

24) රෂීඩ් හජ්ජුල් අක්බාර් - ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීමට කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් අපරාධ නඩු පැවරීම පිළිබඳ නීතිපති සලකා බැලිය යුතු බවට කොමිසම නිර්දේශ කරයි.

**මෙම කොමිෂන් සභාව සහ එහි නිර්දේශ ගැන සමාජය හා සාමයික කේන්ද්‍රයේ මතය**


දීර්ඝ කාලයක් පුරා දහසකට වැඩි පිරිසකගෙන් ප්‍රකාශ සටහන් කරගනිමින් සහ 400කට වැඩි පිරිසකගෙන් සාක්ෂි සටහන් කරගනිමින් මෙම කොමිෂන් සභාව සංකීර්ණ විමර්ශනයක් සිදු කර තිබේ. ඒ අනුව කොමිසම වැදගත් නිර්දේශ ගණනාවක් ලබා දී තිබේ. එම නිර්දේශ අතරින්, නිර්දේශ කිහිපයක් සමග සමාජය හා සාමයික කේන්ද්‍රයට එකඟවීමට හැකියාවක් නැත. ඊට හේතුව ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල පක්ෂපාතී සහ දේශපාලනික දුෂ්-අරමුණු සාක්ෂාත් කරගැනීමට කරනු ලබන අත්තනෝමතික කටයුතු වේ. පුරවැසියන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පනවා ඇති සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුති පනත එහි අරමුණින් පරිබාහිරව, පුරවැසියන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් මර්දනය කිරීම සඳහා බහුල වශයෙන් යොදාගැනිණි. එම පනත යටතේ ක්‍රියා කළ යුතු පිරිසට එරෙහිව සත්‍ය වශයෙන්ම පනත භාවිත කර නැති බව මෙම පරීක්ෂණ කොමිෂන් සභාවේ ඇතැම් නිර්දේශ අනුව ද පෙනී යයි. එසේම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ද පුරවැසි අයිතිවාසිකම් මර්දනය කිරීම සඳහා යොදාගන්නා මෙවලමක් බවට දැන් පත්වී තිබේ. පරිගණක අපරාධ පනත, ජාතික මංමාවත් පනත, පොදු දේපොළ පනත, අත්‍යවශ්‍ය සේවා පනත, මහජන ආරක්ෂක ආඥා පනත සහ නිරෝධායන ආඥා පනත වැනි නීති පවා පුරවැසි අයිතිවාසිකම් මර්දනය කිරීම සඳහා යොදාගන්නා පසුබිමක් ඇති ශ්‍රී ලංකාවේ ඉහත සඳහන් කළ ඇතැම් නිර්දේශ ක්‍රියාත්මක කිරීම මගින් ඇතැම් විට බරපතළ අයිතිවාසිකම් මර්දනයක් සිදුවිය හැකි බව සමාජය හා සාමයික කේන්ද්‍රයේ අදහසයි. ඒ හැර සෙසු නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු අතර, මෙම වාර්තාව බාර දී මේ වන විට වසර 05ක් පමණ ගතවී ඇතත් තවමත් එහි නිර්දේශ අතිවිශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරීමට රජය සමත් වී නැත.

එසේම මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දුන් ඇතැම් සාක්ෂිකරුවන්ගෙන් ඉතා වැදගත් කරුණු අනාවරණය වී ඇතත්, එම ඇතැම් කරුණු අවසන් වාර්තාවට ඇතුළත් වී නැති බව සමාජය හා සාමයික කේන්ද්‍රය නිරීක්ෂණය කරයි.

ඒ අනුව මෙම පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව පමණක් නොව එහි සියලුම වෙළුම් උනන්දුවක් දක්වන පාර්ශ්වවල දැනගැනීම සඳහා ප්‍රසිද්ධ කළ යුතු බව සමාජය හා සාමයික කේන්ද්‍රයේ ස්ථාවරයයි.

## පස් වැනි පරිච්ඡේදය

## චූදිතයන්ගෙන්ම සාක්ෂි අසා චූදිතයන් නිදහස් කරලා - විනිසුරු එස් අයි ඉමාම් කමිටුවේ කතාව




ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසයේ සිදු වූ විශාලතම කුමන්ත්‍රණයක් ගැන විශේෂ හෙළිදරව්වක් 2023 සැප්තැම්බර් 05 වැනිදා බ්‍රිතාන්‍යයේ චැනල් ෆෝ නාලිකාව වාර්තාමය වැඩසටහනකින් ඉදිරිපත් කළේය.[34][vi] ඒ, 2019 අප්‍රේල් 21 වැනිදා සිදු වූ ප්‍රහාරය හුදු සහරාන් කල්ලිය විසින් එල්ල කරන ලද ප්‍රහාරයන් නොව, දේශපාලන බලපෙරළියක් අරමුණු කර ගත් දේශපාලන සහ බුද්ධි අංශ සබඳතා සහිත සංවිධානාත්මක කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් බවයි. එසේම ඒ පිටුපස යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂවරයකුව සිටි සහ එම චැනල් ෆෝ හෙළිදරව්ව කරන කාලයේදී රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂව සිටි සුරේෂ් සලේ ද සිටින බව කියැවිණි.

චැනල් ෆෝ නාලිකාවේ වාර්තාමය වැඩසටහන පාදක වී තිබුණේ හන්සීර් අසාද් මවුලානා නම් පුද්ගලයකු විසින් කියනු ලබන ප්‍රකාශයකි.

චැනල් ෆෝ හෙළිදරව්ව ගැන පරීක්ෂණයක් පැවැත්වීමටත් ප්‍රථමයෙන්ම ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යංශය එම චෝදනා ප්‍රතික්ෂේප කරමින් සහ එම චෝදනා හෙළා දකිමින් 2023 සැප්තැම්බර් 09 වැනිදා නිවේදනයක්[vii] නිකුත් කළේය. එම නිවේදනයේ මෙසේ ද සඳහන් විය.

'මෙම ප්‍රහාරය මෙහෙයවීම සහ බෝම්බකරුවන්ට සහාය වීම යන චෝදනාව වසර 36ක් පුරා රට වෙනුවෙන් සේවයට කැපවූ ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරියකුට එරෙහිව සිදුකිරීම ආරක්ෂක අමාත්‍යාංශය තරයේ හෙළාදකියි. මේජර් ජෙනරාල් සුරේෂ් සලේ 2016 දෙසැම්බර් සිට 2018 දෙසැම්බර් දක්වා මැලේසියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ අමාත්‍ය - උපදේශකවරයා ලෙස සේවය කළේය. ඔහු 2019 ජනවාරි 3 වැනි දින ඉන්දියාව බලා පිටත්ව ගොස් දිල්ලිහි ජාතික ආරක්ෂක

---

[34] 2023 සැප්තැම්බර් 05 වැනිදා, https://www.channel4.com/

විද්‍යාලයේ පාඨමාලාව අවසන් කර, 2019 නොවැම්බර් 30 දින නැවත ශ්‍රී ලංකාවට පැමිණියේය. Channel 4 නාලිකා වාර්තාවේ සඳහන් කාල සීමාව තුළ මෙම නිලධාරියා කිසිදු දිනෙක ශ්‍රී ලංකාවේ සිටියේ නැත. තවද, ඉහත සඳහන් කාල සීමාව තුළ (2016 දෙසැම්බර් සිට 2019 නොවැම්බර් දක්වා) මෙම නිලධාරියා මෙරට බුද්ධි හා ආරක්ෂක අංශවල සේවය නොකළ අතර, එම ක්ෂේත්‍රවල නිලතල හා වගකීම් දරා නැත. පාස්කු ඉරිදා ප්‍රහාරයට සම්බන්ධ කිසිදු ත්‍රස්තවාදියකු රජයේ වැටුප් ලේඛනයේ නොසිටි බව ද ආරක්ෂක අමාත්‍යාංශය යළි අවධාරණය කරයි. එබැවින්, මෙම සාහසික චෝදනා ආරක්ෂක අමාත්‍යාංශය තරයේ ප්‍රතික්ෂේප කරන අතර, එවැනි ද්වේෂසහගත සහ තහවුරු නොකළ ආඛ්‍යානයක් ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් Channel 4 නාලිකාව වෙත සිය බලවත් අප්‍රසාදය ප්‍රකාශ කරයි.'




චැනල් ෆෝ නාලිකාව අදාළ අනාවරණය සිදුකරන කාලවකවානුව වන විට ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා මෙන්ම ආරක්ෂක අමාත්‍යවරයා වූයේ ද රනිල් වික්‍රමසිංහ මහතා ය. ඒ අනුව ආරක්ෂක අමාත්‍යවරයා වූ රනිල් වික්‍රමසිංහ මහතා යටතේ වූ අමාත්‍යාංශය මගින් චැනල් ෆෝ චෝදනා ප්‍රතික්ෂේප කරමින් භාෂා ත්‍රිත්වයෙන්ම නිවේදන නිකුත් කිරීමෙන් පසුව, ඔහු විසින් ම 2023 සැප්තැම්බර් 11 වැනිදා චැනල් ෆෝ චෝදනා ගැන සෙවීමට කමිටුවක් පත්කළේය. එම කමිටුව මෙසේ ය.

1) විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එස් අයි ඉමාම් - සභාපති
2) විශ්‍රාමික ගුවන් හමුදාපති ජයලත් වීරක්කොඩි - සාමාජික
3) ජනාධිපති නීතිඥ හර්ෂ ඒ ජේ සෝසා - සාමාජික

මෙම කමිටුවට චැනල් ෆෝ වීඩියෝව ඇතුළත් සීඩී තැටියක් ද ජනාධිපති ලේකම් කාර්යාලයෙන් පත්වීම් ලිපි සමග ලබා දී තිබුණු අතර, අදාළ චෝදනා ගැන සොයා බලා වාර්තාව 2023 ඔක්තෝබර් 31 දින වන විට ජනාධිපතිවරයාට බාර දිය යුතු බව පත්වීම් ලිපියේ සඳහන් විය.

මෙම කමිටුව මුල්වරට රැස්වූයේ 2024 සැප්තැම්බර් 14 වැනිදා ය. මෙම කමිටුව යම් නීතියක් යටතේ බලය පැවරූ කමිටුවක් නොවූ අතර, එම කමිටුව තම වාර්තාවේ ඒ ගැන සඳහන් කරන්නේ මෙසේ ය.

"අපි 2023 සැප්තැම්බර් 14 වැනි දින අපගේ පළමු රැස්වීම පැවැත්වූවෙමු. අපගේ වරමෙහි විෂය පථය අපි සලකා බැලූ අතර, අපගේ වරම (Y ලෙස සලකුණු කර ඇති ඇමුණුම බලන්න) සීමිත බවත්, අපි කරුණු සෙවීමේ කමිටුවක් බවත් සොයා ගත්තෙමු. අප ඉදිරියේ සාක්ෂි දීමට කිසිවකුට බලකිරීමට අපට බලයක් නොතිබුණි. කමිටුවේ රැස්වීම් සෑමවිටම ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවැත්විණි." ("We had our first meeting on September 14, 2023. We considered the scope and ambit of our mandate and found that our mandate (vide annex marked Y) is limited, and that we were a fact-finding committee. We had no power to compel the attendance of anyone to testify before us. The meetings of the committee were invariably at the Presidential Secretariat.")


කමිටුව තමන්ට අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා 12 දෙනකුට දැනුම්දීම් කළේය. එහෙත් එම දැනුම්දීම් අනුව පැමිණ ප්‍රකාශ ලබාදීම සිදුකළේ කිහිපදෙනකු පමණි. එසේම මෙම කමිටුව සඳහා හන්සීර් අසාද් මවුලානාගේ ලිපිනය සහ ඔහු සිටින ස්ථානය අවශ්‍යව ඇති බවත්, එම චැනල් ෆෝ චෝදනාවලට අදාළ ව තොරතුරු දන්නේ නම් ලබාදෙන ලෙසත් මහජනතාවගෙන් ඉල්ලමින් 2023 ඔක්තෝබර් 29 වැනිදා පුවත්පත් දැන්වීමක් පළකළේය. එනම් ජනාධිපතිවරයා විසින් කමිටු වාර්තාව බාරදෙන ලෙස පත්වීම් ලිපියේ සඳහන් දිනට දෙදිනකට පෙර එම දැන්වීම පළකිරීම විශේෂත්වයක් විය. එසේම ආරක්ෂක අමාත්‍යාංශය ඒ වන විටත් අදාළ චෝදනා ප්‍රතික්ෂේප කර ඇති බව ද කමිටුව තම වාර්තාවේ සඳහන් කළේය.

චැනල් ෆෝ නාලිකාව හරහා අදාළ චෝදනාව ඉදිරිපත් කරන හන්සීර් අසාද් මවුලානාගෙන් ප්‍රකාශ ලබාගැනීමට මෙම කමිටුව අපොහොසත්වීම ගැන ඔවුන් සඳහන් කරන්නේ මෙසේ ය.

'අසාද් මවුලානා සිටින ස්ථානය සොයාගැනීමට අපි සෑම උත්සාහයක්ම ගත්තෙමු. නමුත් අපි සාර්ථක වී නැත. ඔහුගේ දන්නා, අවසන් ලිපිනයට ඔහුට යවන ලද විද්‍යුත් තැපැල් ලිපිනය පවා විවෘත කර නොමැත. චැනල් 4 විකාශනයේදී ඔහු කළ චෝදනා සම්බන්ධයෙන් අප ඉදිරියේ පෙනීසිටීමට සහ සාක්ෂි දීමට අසාද් මවුලානා අපොහොසත් වී ඇත.'

ඇත්ත වශයෙන්ම සිදුවී ඇත්තේ අසාද් මවුලානා සිටින ස්ථානයක් සොයාගෙන නිසි දැනුම්දීමක් කිරීමට මෙම කමිටුව අසමත්වීම මිස, කමිටුව ඉදිරියේ පෙනීසිටීම අසාද් මවුලානා ප්‍රතික්ෂේප කිරීම නොවේ.

චැනල් ෆෝ නාලිකාව හරහා අසාද් මවුලානා විසින් ඉදිරිපත් කළ චෝදනා 24ක් මෙම කමිටුව හඳුනා ගත්තේය. එම චෝදනා 24 සරලව පහත දැක්වේ.




(i) ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ බුද්ධි නිලධාරියකු සහ බෝම්බ ප්‍රහාර එල්ල කළ ත්‍රස්තවාදී කණ්ඩායම අතර සෘජු සම්බන්ධයක් තිබිණි.

(ii) වසර කිහිපයකට පෙර බලයෙන් ඉවත් කරන ලද, දශකයක් පුරා ශ්‍රී ලංකාව පාලනය කළ මහින්ද රාජපක්ෂ සහ ගෝඨාභය රාජපක්ෂ යන සොහොයුරන් දෙදෙනා නැවත බලයට ගෙන ඒම සඳහා රට තුළ ව්‍යාකුලත්වයක් සහ බියක් ඇතිකිරීමට සැලසුමක් දියත් විය.

(iii) පාස්කු ඉරිදා ප්‍රහාරයට පෙර ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ බුද්ධි නියෝජිතයකු මරාගෙන මැරෙන බෝම්බකරුවන් මුණගැසුණු බවත්, තමන් එම හමුව දුටු බවත් අසාද් මවුලානා පවසයි.

(iv) මෙම ප්‍රහාරය දිනක හෝ දෙකක කාලයකදී සැලසුම් කළ එකක් නොව, එය වසර දෙක-තුනක සිට සැලසුම් කළ ඉතා විශාල සැලසුමකි.

(v) ආගමික අන්තවාදය සම්බන්ධයෙන් සයිනි හෂීම් මවුලවි බන්ධනාගාරගතව සිටි අතර, ඔහුගේ සහෝදරයා වූ සහරාන් සැඟවී සිටිමින් ජාතික තවුහිද් ජමාත් (NTJ) සඳහා අනුගාමිකයන් බඳවා ගනිමින් සිටියේය. ශ්‍රී ලංකාව කාලිෆේට් රාජ්‍යයක් බවට පත්කිරීමට අවශ්‍ය වූ NTJ යනු මරණය ම පතන ඉස්ලාමීය අන්තවාදී කණ්ඩායමක් වූ අතර, මෙම කණ්ඩායම ලෝකයේ වෙනත් කිසිමදෙයකට උනන්දුවක් නොදක්වන බැවින් ඔවුන් ව ප්‍රයෝජනයට ගත හැකි බව පිල්ලෙයාන් ප්‍රකාශ කර තිබේ. ඉන් මාස 03කට පසු ඔවුන් නිදහස් කරන ලදි.

(vi) 2018 ජනවාරි මාසයේදී පිල්ලෙයාන්ගේ නියෝග මත සුරේෂ් සලෙයි සහ ඉහත කණ්ඩායම අතර හමුවක් සංවිධානය කර තිබිණි.

(vii) සුරේෂ් සලෙයි යනු ඔත්තුකරුවකු බවට පත්වූ සෙබළකු වන අතර, රාජපක්ෂවරු ඔහුගේ වෘත්තීය ජීවිතයට විශාල සහයෝගයක් ලබා දුන්හ. පසුව ඔහුව හමුදා බුද්ධි අංශයේ අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදි. 2015 මැතිවරණයෙන් පසු නව රජය ඔහුව මැලේසියාවට මාරුකළද, ඔහු තවමත් තිරය පිටුපස සිට තමන්ට බලපෑම් කළ පැරණි ප්‍රධානීන්ට ඇඩි ලෙස පක්ෂපාතීව සිටියේය.

(viii) මවුලානා විමර්ශකයන්ට පැවසූ පරිදි, පිල්ලෙයාන් විසින් සුරේෂ් සලෙයි සහ තමන් බන්ධනාගාරයෙන් නිදහස් කරගැනීමට උදව් කළ පුද්ගලයා (සයිනි හෂීම් මවුලවි) අතර හමුවක් පිළියෙළ කරන ලෙස ඉල්ලා තිබිණි.

(ix) මෙම හමුව පැවැත්වීමට නියමිතව තිබුණේ කරදියපුවල්හි පිහිටි විශාල පොල් වත්තක වන අතර, 2018 පෙබරවාරි මාසයේදී මෙම රැස්වීම පැවති බව කියනු ලැබේ.

(x) මවුලානා එහි යන විට බුද්ධි නිලධාරි සුරේෂ් සලෙයි එහි සිටි අතර, ඔවුන් සුදු පැහැති වෑන් රථයකින් පැමිණෙන NTJ සාමාජිකයන් එනතුරු බලා සිටියහ.

(xi) එම රථයෙන් පුද්ගලයන් හයදෙනකු බැස ගත් අතර, සයිනි හෂීම් මවුලවි විසින් අසාද් මවුලානාට අතට අත දී සිය සහෝදරයා වූ සහරාන් ඔවුන්ගේ කණ්ඩායමේ 'අමීර්' (නායකයා) ලෙස හඳුන්වා දුන් අතර මවුලානා විසින් සලෙයිව හඳුන්වා දෙන ලදි.

(xii) පැය 03ක් පුරා පැවති එම රැස්වීමෙන් පසු සුරේෂ් සලෙයි පවසා ඇත්තේ රාජපක්ෂවරුන්ට ශ්‍රී ලංකාව තුළ අනාරක්ෂිත තත්ත්වයක් පැවතීම අවශ්‍ය බවත්, ගෝඨාභයට ජනාධිපති විය හැකි එකම ක්‍රමය එය බවත් ය.

(xiii) මෙම රැස්වීම පැවති ස්ථානයේ විශාල පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණයක් ගබඩා කර තිබූ අතර, කිලෝග්‍රෑම් 100කට අධික බරින් යුත් 'යූරියා නයිට්‍රේට්' නම් ප්‍රබල පුපුරණ ද්‍රව්‍ය එහි තිබී සොයාගන්නා ලදි.

(xiv) සහරාන් විසින් පවත්වාගෙන ගිය ඉහත සඳහන් කළ ආරක්ෂිත නිවස හෝ පුහුණු කඳවුරේ සිටියේ NTJ කණ්ඩායමේ සාමාජිකයෝ වෙති.

(xv) සහරාන් සහ ඔහුගේ NTJ අනුගාමිකයන් අත්අඩංගුවට ගැනීමට පොලිසියට ප්‍රමාණවත් තොරතුරු තිබුණද, පදනම් විරහිත හමුදා බුද්ධි අංශ වාර්තා මගින් එම විමර්ශන සෑම අවස්ථාවකදීම අඩපණ කරන ලදි.

(xvi) හමුදා බුද්ධි අංශ විසින් විමර්ශකයන් නොමග නොයැවූයේ නම්, පාස්කු ඉරිදා ප්‍රහාරයට NTJ සම්බන්ධ බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) අනිවාර්යයෙන්ම සොයා ගනු ඇත.

(xvii) ප්‍රහාරයක් එල්ල වන බවට විදේශයන්හි කටකතා පැතිර ගිය අතර, බෝම්බ ප්‍රහාරයට සති 02කට පෙර සහරාන් ප්‍රහාරයක් සැලසුම් කරන බවට ඉන්දීය බුද්ධි අංශ සිය ශ්‍රී ලංකා පාර්ශ්වකරුවන්ට අනතුරු අඟවා තිබිණි.

(xviii) උසස් පොලිස් නිලධාරියකු මෙම අනතුරු ඇඟවීම් පිළිබඳ ආරක්ෂක අංශ වෙත නිවේදනයක් යවා තිබූ අතර, එහි කතෝලික පල්ලි ඉලක්ක විය හැකි බවට ද සඳහන් කර තිබිණි. කෙසේ වෙතත් ප්‍රහාරයෙන් පසු රජයේ ඉහළ නිලධාරීන් පැවසුවේ එම අනතුරු ඇඟවීම් තමන්ට හෝ ජනාධිපතිවරයාට නොලැබුණු බවයි.

(xix) පාස්කු ඉරිදා උදෑසන අසාද් මවුලානාට සුරේෂ් සලෙයිගෙන් අනපේක්ෂිත දුරකතන ඇමතුමක් ලැබුණු අතර, ඔහුට ටාජ් සමුද්‍රා හෝටලයට ගොස් එහි රැඳීසිටින පුද්ගලයකු තම රථයට නංවාගෙන ඔහුට අවශ්‍ය තැනට ගෙන යන ලෙස උපදෙස් දී තිබිණි. නමුත් මවුලානා තමන් මඩකලපුවේ සිටින බව සලෙයිට දන්වා තිබිණි.

(xx) ටාජ් සමුද්‍රා හෝටලයේ CCTV දර්ශනවල සහරාන්ගේ NTJ කණ්ඩායමේ සාමාජිකයකු පුපුරණ ද්‍රව්‍ය පිරවූ බෑගයක් රැගෙන උදෑසන 8.50ට ආපනශාලාවේ සිටිනු දක්නට ලැබුණු අතර, සුරේෂ් සලෙයිට තමන්ට මුණගැස්වීමට අවශ්‍ය වූයේ එම පුද්ගලයා බව මවුලානා දැන් විශ්වාස කරයි.

(xxi) ටාජ් සමුද්‍රා හෝටලයේ සිටි එම පුද්ගලයා පසුව දෙහිවල ට්‍රොපිකල් ඉන් හෝටලයේදී බෝම්බය පුපුරුවා ගනිමින් තමන් සහ තවත් දෙදෙනකු මරා දැමීය.

(xxii) සුරේෂ් සලෙයි යනු ගෝඨාභය රාජපක්ෂගේ වඩාත්ම විශ්වාසවන්ත බුද්ධි නිලධාරියා වූ බැවින් ඔහුගෙන් ප්‍රශ්න කිරීම හමුදා බුද්ධි අංශ විසින් වළක්වන ලදි.

(xxiii) සුරේෂ් සලෙයි පාස්කු බෝම්බ ප්‍රහාරයට විශාල සහායක් ලබා දුන් අතර, ඔහු සහරාන් සහ ඔහුගේ මැදිහත්වීම පිළිබඳව දැන සිටියේය.

(xxiv) ජනාධිපති ධුරයට පත්වීමෙන් පසු ගෝඨාභය රාජපක්ෂ විසින් බෝම්බ ප්‍රහාරය පිළිබඳ විමර්ශන පීල්ලෙන් පිටතට යවන ලදි.

මෙම කමිටුව විසින් ඉහත සඳහන් කළ චෝදනා ගැන මූලික වශයෙන් සොයාබලනු ලැබුවේ එම චෝදනාව එල්ල වන ප්‍රධාන පුද්ගලයන් දෙදෙනාගේ ප්‍රකාශවලින්ම වීම විශේෂත්වයකි. ඒ ගැන කමිටුව තම වාර්තාවේ මෙසේ සඳහන් කර තිබේ.

‘2019 අප්‍රේල් මස එල්ල වූ පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් අදාළ චැනල් 4 **(Channel-4)** විකාශය මගින් ඉදිරිපත් කරන ලද ඉහත කී චෝදනා සලකාබැලීමේදී, එම චෝදනා ඍජුවම සහ නිශ්චිතවම එල්ල වී ඇති පුද්ගලයන් වන්නේ **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් (පිල්ලෙයාන්)** සහ **සුරේෂ් සලෙයි** බව අපට පෙනී යයි. අසාද් මවුලානාගේ එම ප්‍රකාශයට අනුව, අදාළ පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ සැලසුම් මෙහෙයවා ඇත්තේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ජනාධිපතිවරණය ජයග්‍රහණය කිරීම සඳහා වාසි සහගත වන අයුරිනි. ගෝඨාභය මහතාට ජනාධිපති වීමට නම් රාජපක්ෂවරුන්ට රට තුළ අනාරක්ෂිත තත්ත්වයක් අවශ්‍ය වූ බවට වන කටකතා ප්‍රකාශ හැරෙන්නට, 2019 අප්‍රේල් පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර සැලසුම් සඳහා **ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සම්බන්ධයක් ඇති බවට කිසිදු සාක්ෂියක්** අසාද් මවුලානාගේ ප්‍රකාශය මගින් අනාවරණය නොවුණි. අසාද් මවුලානා තම ප්‍රකාශය පැහැදිලි කිරීමට හෝ විස්තර කිරීමට අප හමුවේ පෙනීසිටියේ නැත. පිල්ලෙයාන් සහ සුරේෂ් සලෙයි ලබා දුන් සාක්ෂි මගින් අසාද් මවුලානාගේ චෝදනා සනාථ නොවුණි. එබැවින් සාක්ෂි ලබාදීම සඳහා අප හමුවේ පෙනීසිටින ලෙස දන්වමින් හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත අප කිසිදු නිවේදනයක් යැවූයේ නැත. ඔහු සාමාන්‍ය පුවත්පත් නිවේදනවලට ද ප්‍රතිචාර දැක්වූයේ නැත. කෙසේ වෙතත්, අප පිල්ලෙයාන් සහ සුරේෂ් සලෙයි වෙත නිවේදන යැවූ අතර, ඔවුහු අප හමුවේ පෙනී සිට සාක්ෂි ලබාදුන්හ.’

මෙම කමිටු වාර්තාව අනුව පෙනීයන්නේ කමිටුව ප්‍රධාන වශයෙන් චැනල් ෆෝ චෝදනා විමර්ශනය කිරීමට උත්සාහ කර ඇත්තේ චෝදනා එල්ල වන පුද්ගලයන් දෙදෙනාගේ සාක්ෂි මගින්ම වීමයි. මෙවැනි බරපතළ කාරණයකට සම්බන්ධ වූ පුද්ගලයකු එම චෝදනා සත්‍ය වුවද පිළිගනු ඇතැයි කිසිසේත්ම අපේක්ෂා කළ නොහැකිය.

අසාද් මවුලානාගේ පසුබිම පිල්ලෙයාන්ගේ සාක්ෂි මගින් ද කමිටුවේදී තහවුරු විය. එනම් අසාද් මවුලානා ප්‍රකාශ කළ පරිදිම ඔහු පිල්ලෙයාන්ගේ ලේකම්වරයකුව සිට ඇති බව පිල්ලෙයාන් පිළිගත්තේය. පිල්ලෙයාන් සහ අසාද් මවුලානා සමීපව ඇසුරු කර ඇති බව ද පිල්ලෙයාන්ගෙන් කියැවී තිබිණි. ඒ සම්බන්ධයෙන් විනිසුරු ඉමාම් කමිටු වාර්තාවේ මෙසේ සඳහන් වේ.

'පිල්ලෙයාන් මහ ඇමතිවරයාව සිටි කාලයේ අසාද් මවුලානා ඔහුගේ සම්බන්ධීකරණ ලේකම්වරයා ලෙස කටයුතු කර තිබුණි. ඔහුගේ පෞද්ගලික ලේකම්වරයා වූයේ නන්දකෝවන් වන අතර, ඔහු පසුව වෙඩි තබා ඝාතනය කරන ලදි. නන්දකෝවන්ගේ මරණයෙන් පසුව අසාද් මවුලානා පිල්ලෙයාන්ගේ පෞද්ගලික ලේකම්වරයා බවට පත් විය. පිල්ලෙයාන්ගේ සාක්ෂිවලට අනුව ඔහු 2012 දක්වා මහ ඇමතිවරයා ලෙස කටයුතු කර ඇති බව පෙනී යයි. අසාද් මවුලානා 2012 සිට 2022 දක්වා TMVP හි විධායක කමිටු සාමාජිකයකු ලෙස කටයුතු කර ඇත. අසාද් මවුලානා 2022 වසරේදී මෙරටින් පිටව ගොස් තිබේ. පිල්ලෙයාන් ලබා දුන් සාක්ෂියට අනුව අසාද් මවුලානා නැගෙනහිර පළාතේ ඇමරිකානු American Waters නියෝජිතයකු ලෙස ද කටයුතු කර ඇත.

අසාද් මවුලානාගේ නමේ විවිධ වෙනස්කම් සම්බන්ධයෙන් පිල්ලෙයාන්ගෙන් ප්‍රශ්න කරන ලදි. හන්සීර් අසාද් මවුලානා යන නම සහ එහි විවිධ වෙනස්කම්වලින් හැඳින්වෙන්නේ එකම පුද්ගලයා බව ඔහු තහවුරු කළේය. චැනල් 4 වැඩසටහන තමන් නරඹා නොමැති බව පිල්ලෙයාන් ප්‍රකාශ කළේය. චැනල් 4 විකාශනයේ දෙමළ භාෂාවට පරිවර්තනය කර ලියන ලද පිටපත තමන් කියවා ඇති බව ඔහු පවසයි. චැනල් 4 වැඩසටහනේ සංයුක්ත තැටියක (CD) කොටසක් තිරය මත ප්‍රදර්ශනය කරන ලද අතර, එහිදී ඔහු හන්සීර් අසාද් මවුලානා හඳුනාගත්තේය. 2015 සිට 2020 දක්වා කාලය තුළ හන්සීර් අසාද් මවුලානා කිහිපවරක් විදේශගත වී ඇති බව පිල්ලෙයාන් පැවසීය. පිල්ලෙයාන් පවා හන්සීර් අසාද් මවුලානා සමඟ විදේශගත වී ඇත. සාක්ෂිවලට අනුව පෙනීයන්නේ පිල්ලෙයාන් සහ හන්සීර් අසාද් මවුලානා එකිනෙකාට සමීපව කටයුතු කර ඇති බවයි.'

මෙහි විශේෂත්වයක් වන්නේ හන්සීර් අසාද් මවුලානාට සහරාන්ලා සමග සබඳතා තිබුණු බව පිල්ලෙයාන් ප්‍රතික්ෂේප කිරීම ය. පිල්ලෙයාන් කමිටුව හමුවේ ප්‍රකාශ කර ඇත්තේ අසාද් මවුලානා ශ්‍රී ලංකාවෙන් පිටව යන්නට ඇත්තේ පවුල් ප්‍රශ්නයක් හේතු කරගෙන බවයි. කෙසේ වෙතත් කමිටුව සඳහන් කරන්නේ සහරාන්ගේ සහෝදරයාට ප්‍රතිකාර කළ වෛද්‍ය ශෆ්රාස් සමග අසාද් මවුලානාගේ හිතවත්කම් තිබුණු බවයි. ඒ දෙදෙනාම මරදමුණේ මෙන්ම දෙහිවල එබනිසා පෙදෙසේ ද අසල්වාසීන් බව කමිටුව සඳහන් කරයි. අසාද් මවුලානා රටින් පිටවීමට හේතුව පිල්ලෙයාන් සමග සබඳතා තිබීම බව ද කමිටුව සඳහන් කරයි.

'අසාද් මවුලානාට සහරාන් සමඟ සම්බන්ධකම් ඇති බව පිල්ලෙයාන්ට හැඟී නොතිබුණද, සහරාන්ගේ සහෝදරයා වූ රිල්වාන් සම්බන්ධ වූ බෝම්බ පිපිරීමක් සිදුවූ අතර, මවුලානා පදිංචි ගම්මානයේ ම වෛද්‍යවරයකු තුවාල ලැබූ රිල්වාන්ට ප්‍රතිකාර කර තිබුණි. අසාද් මවුලානා එම වෛද්‍යවරයාට ශ්‍රී ලංකාවෙන් පළායෑමට උදව් කර ඇති බව පෙනී යයි. රිල්වාන් යනු සහරාන්ගේ බාල ම සහෝදරයා ය. මඩකලපුවේදී යතුරුපැදියක් පරීක්ෂා කරමින් සිටියදී බෝම්බයක් පිපිරීමෙන් ඔහුට අතක් අහිමි විය. පිල්ලෙයාන්ට අනුව, පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් දින පහකට පසු සයින්දමරුදු පිපිරීමෙන් සහරාන්ගේ පවුලේ අය සහ දරුවන් සමඟ රිල්වාන් ද මිය ගොස් ඇත. අසාද් මවුලානා සහ රිල්වාන්ට ප්‍රතිකාර කළ වෛද්‍යවරයා මරදමුණේ ගම්මානයේ පදිංචිකරුවෝ වෙති. එම වෛද්‍යවරයාගේ නම වෛද්‍ය ෂෆ්රාස් ය. ඔහු දෙහිවල එබනිසා පාරේ සහ කාත්තන්කුඩි ප්‍රදේශයේදී අසාද් මවුලානාගේ අසල්වැසියෙකි. එබැවින් අසාද් මවුලානා බොහෝ විට සහරාන් සමඟ සම්බන්ධ වී සිටි බව ප්‍රකාශ කිරීම සාධාරණ වේ. අසාද් මවුලානා ශ්‍රී ලංකාවේ පදිංචියට අකමැති වීමට මෙය එක් හේතුවක් විය හැකිය.'

අසාද් මවුලානා ගැන බොහෝ තොරතුරු දන්නා පිල්ලෙයාන්, අසාද් මවුලානාගේ ඉහත සඳහන් කළ සබඳතා ගැන නොදැන සිටියා යැයි උපකල්පනය කළ නොහැකිය. මෙම කමිටුව වැඩිදුර සොයාබැලීම් කළ යුතුව තිබුණේ පිල්ලෙයාන් අසාද් මවුලානාගේ ඉහත සබඳතා ගැන සඳහන්

නොකළේ සහ මවුලානාට සහරාන්ලා සමග සබඳතා ඇතැයි නොහිතන බව පිල්ලෙයාන් කියන්නේ අසාත් මවුලානා චැනල් ෆෝ හරහා හෙළිදරව් කළ කාරණය හෙළි වන බැවින් ද යන්න ගැනයි. එහෙත් කමිටුව එසේ වැඩිදුර සොයා නොබලා පිල්ලෙයාන්ගේ ප්‍රකාශ කෙරෙහි විශ්වාසය තබා ඇති බව නිරීක්ෂණය වෙයි.

මෙම කමිටුව තම වාර්තාව මගින් පිල්ලෙයාන්ගේ ප්‍රකාශය විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව කර ඇත්තේ චෝදනා එල්ල වන අනෙක් පුද්ගලයා වන තුවාන් සුරේෂ් සලේගේ ප්‍රකාශය විස්තර කිරීම ය. කෙසේ වෙතත් එම විශ්ලේෂණයේ වැඩියෙන් ඇත්තේ මෙම සිද්ධියට සෘජුවම අදාළ නොවන සලේ විසින් ප්‍රකාශ කළ සිදුවීම් ය. එම ඇතැම් කරුණු ගැන සලේ ප්‍රකාශ ලබාදී ඇතත්, ඒවා ඔහුට සෘජුවම සම්බන්ධ කාරණා ද නොවේ. උදාහරණයක් ලෙස නිලන්ත ජයවර්ධන මහතාට ලැබුණු බුද්ධි තොරතුර අනෙකුත් අයට සම්ප්‍රේෂණය කිරීම ගැන ද සලේ සාක්ෂි ලබාදී ඇත. කමිටුවට එම සාක්ෂි අවශ්‍ය නම් ඊට අදාළ පුද්ගලයන්ගෙන් ගත යුතුව තිබිණි. එසේ තිබියදී ඒවා සුරේෂ් සලේගෙන් ලබාගැනීම ද ගැටලු සහගත ය.

චැනල් ෆෝ චෝදනාවලට සෘජුව අදාළ නැති කරුණු ගණනාවක් ගැන සඳහන් කර, අවසානයේදී කමිටුව සුරේෂ් සලේ සම්බන්ධයෙන් මෙසේ සඳහන් කරයි.

‘Sallay was out of the country from 2016 to 2019 November.Sallay's alibi is an irreversible fact. There is no evidence at all to show anyinvolvement on the part of Sallay with Zahran or the members of the National TawheedJamaat whose mission in life is death during the aforesaid period and thereafter.’


එසේම වීඩියෝවේ නැවත නිර්මාණය කරන ලද දර්ශනයක් බව පෙනෙන දර්ශනයක ඇතුළත් පොල්වත්ත සහ එහි සඳහන් පුද්ගලයන් අතර සලේ නොසිටීම ගැන ද කමිටුව සඳහන් කරයි.

‘අදාළ කාල සීමාව තුළ සලෙයි ශ්‍රී ලංකාවේ සිටි බව පවසමින් චෝදනා ඉදිරිපත් කිරීමෙන් අසාද් මවුලානා බරපතළ වැරැද්දක් කර ඇත. කරදියපුවල්හි පොල් වත්තක පැවැත්වූ බව කියන රැස්වීම පැහැදිලිවම ගෙතූ කතාවකි. චැනල් 4 විකාශයේ වීඩියෝ දර්ශනවල කරදියපුවල්හි පැවැත්වූ රැස්වීමේදී සලෙයි සිටින බවක් හෝ විශාල පොල් වත්තක් හෝ පෙන්නුම් නොකරයි. එම වීඩියෝ දර්ශනවල කිසිදු ස්ථානයක සහරාන් හෝ ජාතික තව්හිද් ජමාත් සාමාජිකයන් සමඟ සලෙයි සංවාදයක යෙදෙනු හෝ සබඳතාවක් පවත්වනු දක්නට නොලැබේ. 2019 අප්‍රේල් මාසයේ බෝම්බ ප්‍රහාරය එල්ල වන අවස්ථාවේදී සලෙයි ආරක්ෂක අධ්‍යයන පාඨමාලාවක් හදාරමින් නවදිල්ලියේ රැඳී සිටියේය.’

මෙම කමිටුව සලේ නිදහස් කරන්නේ එසේ සඳහන් කරමිනි. සුරේෂ් සලේ මහතා 2018 දෙසැම්බර් මාසයේදී ලංකාවට පැමිණි බව ද මෙම වාර්තාවේ ම එක් තැනක සඳහන් විය. සමාජය හා සාමයික කේන්ද්‍රයේ පර්යේෂණ කණ්ඩායම කළ සොයාබැලීම් අනුව සුරේෂ් සලේ ලංකාවට පැමිණ ඇත්තේ දින 52 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුදය පැවැති සමයේදී ය. එනම් 2018 දෙසැම්බර් මැලේසියාවේ සිට ශ්‍රී ලංකාවට පැමිණි සුරේෂ් සලේ 2019 ජනවාරි 03 වැනිදා ඉන්දියාව බලා පිටත්ව ගොස් තිබේ. ඊට පෙර 2017 නොවැම්බර් 04 වැනිදා සිට 2017 නොවැම්බර් 13 වෙනිදා දක්වා කාලයේ ද සුරේෂ් සලේ ශ්‍රී ලංකාවේ සිට තිබේ. අඩු තරමේ චැනල් ෆෝ චෝදනාවේ දිනය දා සලේ මොනයම් හෝ ක්‍රමයකට ලංකාවට පැමිණ ඇත්දැයි සෙවීම කෙසේ වෙතත් සලේ ශ්‍රී ලංකාවේ සිටි මෙම කාලයේදී ඔහු මෙවැනි සාකච්ඡාවක නිරතවී තිබේද යන්න ගැනවත් කමිටුව සොයා බැලිය යුතුව තිබුණද, එවැනි සොයාබැලීමක් ද කමිටුව කර නැත.

මෙම කමිටුව අසාද් මවුලනා සහ පිල්ලෙයාන් අතර දුරකතන ඇමතුම් සහ අසාද් මවුලානා සහ සහරාන් අතර දුරකතන ඇමතුම් තොරතුරු ගැන සොයා බලා ඇතත්, කුමන කාලයකට අදාළව එසේ දුරකතන විශ්ලේෂණ වාර්තා බැලුවේදැයි කිසිම සඳහනක් නැත. විශේෂත්වය වන්නේ මෙම කමිටුව සහරාන් සහ සුරේෂ් සලේ අතර මෙන්ම අසාද් මවුලානා සහ සුරේෂ් සලේ අතර දුරකතන සංවාද ගැන පරීක්ෂා කළ බවක් කමිටු වාර්තාවේ සඳහන් නොකිරීම ය.  එම කමිටු වාර්තාවේ මෙසේ සඳහන්වෙයි.

"ත්‍රස්තවාදය වැළැක්වීමේ සහ විමර්ශන අංශයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක විජයලත් ආරච්චිගේ සුජීව ගුණවර්ධන කැඳවනු ලැබුවේ සහරාන් සහ අසාද් මවුලානා අතර මෙන්ම පිල්ලෙයාන් සහ අසාද් මවුලානා අතර සිදු වූ දුරකතන ඇමතුම්වල වාර ගණන, එම ඇමතුම් ලබාගත් සහ ලැබුණු ස්ථාන සහ කාලසීමාවන් තහවුරු කරගැනීම සඳහා ය. එම ප්‍රයත්නයෙන් කොමිසමේ වගකීමට අදාළ ප්‍රයෝජනවත් කිසිවක් අනාවරණය නොවීය."




මීළඟට වනාතවිල්ලුව ඉඩම ගැන මෙම කමිටුව ප්‍රකාශ ලබාගෙන ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අදාළ විමර්ශනය කළ පොලිස් නිලධාරියාගෙන් හෝ විමර්ශන අධීක්ෂණය කළ නිලධාරියාගෙන් නොව, එහි පොලිස් සැරයන්වරයකුගෙනි. ඔහුගේ ප්‍රකාශය විශ්ලේෂණය කරමින් කමිටුව සඳහන් කරන්නේ පොලිසිය වනාතවිල්ලුවට ගියේ මුෆීස් සහ හමාස් නම් දෙදෙනකු සිටින්නේදැයි සොයාබැලීමට බවයි. කෙසේ වෙතත් ජනාධිපති කොමිෂන් සභාවේදී හෙළිදරව් වූ කරුණු අනුව රහස් පොලිසිය වනාතවිල්ලුවට ගොස් තිබුණේ මාවනැල්ල බුදු පිළිම සිදුවීමේ ප්‍රධාන සැකකරුවන් දෙදෙනා වන සාදික් අබ්දුල්ලා සහ සාහිඩ් අබ්දුල්ලා ගැන විමර්ශනය කිරීම සඳහා ය. එසේම අදාළ පොල්වත්තේ නිවස ඉදි කළ කාලවකවානුව ගැන එම පොලිස් සැරයන්වරයාගෙන් ප්‍රකාශ ලබාගැනීමෙන් අනතුරුව එම නිවස සාදා ඇත්තේ අසාද් මවුලානා චෝදනා කරන කාලයට පසුව බව නිගමනය කරමින් මවුලානාගේ ප්‍රකාශය අසත්‍යයක් බව කමිටුව සඳහන් කරයි. කෙසේ වෙතත් එම ඉඩම සම්බන්ධ සාක්ෂිකරුවන් සිටියදී කමිටුව ඔවුන්ගෙන් ප්‍රකාශ සටහන් කරගෙන නැත. එසේම අසාද් මවුලානා චෝදනා කරන අදාළ ස්ථානය සහ

වනාතවිල්ලුව ඉඩම යන දෙක ම එකක්ද යන්න ගැන තහවුරු කරගැනීමට මෙම කමිටුව නිසි සොයාබැලීමක් කළ බවක් නිරීක්ෂණය නොවේ.

මෙසේ චෝදනා එල්ල වන පාර්ශ්වවලින් සහ අදාළ නොවන පාර්ශ්ව කිහිපයකින් ප්‍රකාශ සටහන් කර ගැනීමෙන් අනතුරුව මෙම කමිටුව නිර්දේශ 05ක් ඉදිරිපත් කර තිබේ. එම නිර්දේශ 05 මෙසේ ය.

(i) නියමිත සාමාජික සංයුතියෙන් යුත් ආරක්ෂක මණ්ඩලය (Security Council) රටේ ආරක්ෂක තත්ත්වය ඇගයීම සඳහා හැකි සෑමවිටම රැස්විය යුතුය.

(ii) ජාතික ආරක්ෂාවට බලපාන ක්‍රියාකාරකම් පිළිබඳ ඕනෑම තොරතුරක් කිරා මැන බැලීම සහ සලකා බැලීම සඳහා ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලට පෙර නියමිත සාමාජික සංයුතියෙන් යුත් බුද්ධි අංශ ඒකක (Intelligence Units) රැස්විය යුතුය.

(iii) චැනල් 4 විකාශය තුළ අසත්‍ය චෝදනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අසාද් මවුලානාට එරෙහිව සුදුසු පියවර ගත යුතුය. අසාද් මවුලානා මරාගෙන මැරෙන බෝම්බකරුවන් සමඟ සබඳතා පැවැත්වූයේද යන්න තහවුරු කර ගැනීම සඳහා විමර්ශන සිදු කළ යුතුය.

(iv) ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන තොරතුරු පවතින විට, හානි, විනාශයන් සහ ජීවිත හානි වැළැක්වීම සඳහා ආරක්ෂක අංශ නියමිත වේලාවට පියවර ගත යුතු අතර, හානි, විනාශයන් සහ ජීවිත හානි වැළැක්වීමට පියවර ගැනීම සඳහා අදාළ ඉලක්කගත ආයතන සහ මණ්ඩල දැනුවත් කළ යුතුය. තවද අවදානමට ලක්විය හැකි ස්ථානවලට ආරක්ෂාව සැපයිය යුතුය.

(v) ජාතික ආරක්ෂාවට අදාළ තොරතුරු සහ වාර්තා සම්බන්ධයෙන් ඉහළ මට්ටමේ බුද්ධි සේවාවල (Intelligence Services) ක්‍රියා පටිපාටි සහ වගකීම් පැහැදිලිව නිර්වචනය කර ස්ථාපිත කළ යුතු අතර, වගකිවයුතු නිලධාරීන් එම නීතිරීතිවලට අනුකූල වන බව සහතික කිරීම සඳහා පියවර ගත යුතුය.

කමිටුව තමන්ගේ විෂයපථයට අදාළ ව නිර්දේශ ලබාදී ඇත්තේ ඉහත නිර්දේශ 05න් එකක් පමණි. ඒ තුන් වැනි නිර්දේශය වන අසාද් මවුලානාට මරාගෙන මැරෙන බෝම්බකරුවන් සමග සබඳතා තිබුණේද යන්න තහවුරු කරගැනීමට විමර්ශන සිදුකිරීම සහ චැනල් 4 මගින් අසත්‍ය චෝදනා ඉදිරිපත් කිරීමට එරෙහිව අසාද් මවුලානාට සුදුසු පියවර ගත යුතුය යන්නයි. සෙසු නිර්දේශ 4ම මෙම කමිටුවේ විෂයපථයට අදාළ නිර්දේශ නොවේ.

## සාරාංශ සටහන: චූදිතයන්, නිගමන සහ ඉදිරි පියවර

| පුද්ගලයා | චෝදනාව | කමිටුවේ නිගමනය | නිර්දේශය |
|---|---|---|---|
| ගෝඨාභය රාජපක්ෂ | දේශපාලන කුමන්ත්‍රණයේ ප්‍රධාන ප්‍රතිලාභියා | කිසිදු සාක්ෂියක් නැත (සාක්ෂි විමසීමට කැඳවූයේ ද නැත) | කිසිවක් නැත (නිදොස්) |
| මේජර් ජෙනරල් සුරේෂ් සලේ | සහරාන් සමග ඍජු සබඳතා සහ විමර්ශන යටපත් කිරීම | අදාළ කාලයේ විදේශගතව සිටි බැවින් චෝදනා අසත්‍යයි | කිසිවක් නැත (නිදොස්) |
| සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් (පිල්ලෙයාන්) | ත්‍රස්තවාදීන් සහ බුද්ධි අංශ සම්බන්ධීකරණය කිරීම | අසාද් මවුලානාගේ චෝදනා සනාථ නොවුණි | කිසිවක් නැත (නිදොස්) |
| හන්සීර් අසාද් මවුලානා (තොරතුරු හෙළිකරන්නා) | චැනල් ෆෝ හරහා රහස් හෙළි කිරීම | අසත්‍ය චෝදනා ඉදිරිපත් කර ඇත | ඔහුට එරෙහිව විමර්ශන සිදුකොට නීතිමය පියවර ගැනීම |

**මෙම කමිටුව ගැන සමාජය හා සාමයික කේන්ද්‍රයේ ස්ථාවරය**

මෙම කමිටුව පත්කරනු ලැබුවේ ම ජනාධිපතිවරයා යටතේ පවතින අමාත්‍යාංශයක් විසින් අදාළ නිශ්චිත චෝදනා ගැන පූර්ව ස්ථාවරයකට එළඹීමෙන් පසුව ය. එසේම මෙම කමිටුවට විමර්ශනය කිරීම සඳහා පුද්ගලයන් කැඳවීමට බලයක් නැති බව කමිටුව විසින් ම සඳහන් කර තිබේ. කමිටුව චෝදනා ලත් තැනැත්තන් දෙදෙනාගේ ප්‍රකාශ සහ වෙනත් අදාළ නොවන පාර්ශ්ව තුනක ප්‍රකාශ මත අදාළ චෝදනා අසත්‍ය බව ප්‍රකාශ කර තිබේ. එසේ හෙයින් මෙම කමිටුව සම්බන්ධයෙන් සමාජය හා සාමයික කේන්ද්‍රය සෑහීමකට පත්වන්නේ නැත. චැනල් ෆෝ චෝදනා ගැන පූර්ණ අපරාධ විමර්ශනයක් සිදු කළ යුතු බව සමාජය හා සාමයික කේන්ද්‍රයේ ස්ථාවරය වේ. එසේම මෙම කමිටු වාර්තාව රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාට බාර දී ඇතත් ඔහු විසින් ප්‍රසිද්ධියට පත් කළේ නැත. එසේම වර්තමාන ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා ද මෙම වාර්තාව ප්‍රසිද්ධ නොකළ අතර, එය ප්‍රසිද්ධියට පත් කළේ හිටපු මන්ත්‍රී උදය ප්‍රභාත් ගම්මන්පිල විසිනි. ඒ අනුව මෙම වාර්තාව මෙන්ම මෙම කමිටුව ඉදිරියේ අදාළ පාර්ශ්ව ලබා දුන් සියලුම ප්‍රකාශ සහ ලේඛන ද ඇතුළුව මෙම කමිටුවට අදාළ සියලුම කොටස් මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධියට පත් කළ යුතුය යන්න සමාජය හා සාමයික කේන්ද්‍රයේ ස්ථාවරය වේ.

## අවසන් තීන්දුව: සමාජය හා සාමයික කේන්ද්‍රයේ (CSR) ස්ථාවරය

"බලයක් රහිත කමිටුවක් විසින්, චූදිතයන්ගෙන්ම ප්‍රශ්න කොට, අදාළ චෝදනා අසත්‍ය බවට කළ නිගමනය සම්බන්ධයෙන් කිසිසේත් සෑහීමකට පත්විය නොහැක. මෙය පූර්ව නිගමනයකට එළඹ සිදුකළ ව්‍යාජ විමර්ශනයකි."

### 1. පූර්ණ අපරාධ විමර්ශනයක්


චැනල් ෆෝ හෙළිදරව්ව සම්බන්ධයෙන් ස්වාධීන, පුළුල් අපරාධ විමර්ශනයක් වහාම සිදු කළ යුතුය.

### 2. සම්පූර්ණ වාර්තාව ප්‍රසිද්ධ කිරීම

හිටපු ජනාධිපතිවරුන් විසින් සඟවාගෙන සිටි, (දැනට උදය ගම්මන්පිල මහතා විසින් පමණක් ඉදිරිපත් කළ) කමිටු වාර්තාවට අදාළව ලබා දුන් සියලුම මුලික ප්‍රකාශ සහ ලේඛන මහජනතාවගේ දැනගැනීම සඳහා වහාම ප්‍රසිද්ධ කළ යුතුය. සත්‍යය තවදුරටත් වසන් කළ නොහැක.

## 06 වැනි පරිච්ඡේදය

## සහරාන් - පිල්ලෙයාන් ගැන මුල්ම තොරතුර ලැබුණේ 2019 මැයි මාසයේ - 2019 අප්‍රේල් සිට 2019 නොවැම්බර් දක්වා වූ අපරාධ විමර්ශනයේ කතාව




අප්‍රේල් 21 වැනිදා ප්‍රහාරයෙන් පසු මූලික වශයෙන් අපරාධ විමර්ශනය සිදු වූයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කේන්ද්‍ර කර ගනිමිනි. ඊට අමතරව එම ප්‍රහාරයට අදාළ වෙනත් යම් අවස්ථාවෝචිත පරිදි වාර්තාගත වන සිදුවීම් සම්බන්ධයෙන් විවිධ පොලිස් ස්ථාන මගින් විමර්ශන සිදු කළේය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශනවල මූලික අදියරේදී එම දෙපාර්තමේන්තුවේ ව්‍යුහය මෙසේ ය.

1) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
2) නියෝජ්‍ය පොලිස්පති සුදත් නාගහමුල්ල - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු දිසාව බාර නියෝජ්‍ය පොලිස්පති
3) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ශානි අබේසේකර - අධ්‍යක්ෂ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව

මේ තිදෙනා අතරින් මෙම විමර්ශනවල ප්‍රධාන අධීක්ෂණ නිලධාරියා ලෙස කටයුතු කළේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශානි අබේසේකර මහතා ය. ඒ අනුව ඔහුගේ අධීක්ෂණය යටතේ විමර්ශන සිදු කළ නිලධාරීන් මෙසේ ය.

1) ශැංග්‍රිලා හෝටලයේ පිපිරීම ගැන විමර්ශනය - පොලිස් අධිකාරි පී අම්පාවිල
2) මීගමුව කටුවාපිටිය දේවස්ථානයේ පිපිරීම ගැන විමර්ශනය - පොලිස් අධිකාරි ජේ පී ඩී ජයසිංහ

3) සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ පිපිරීමට අදාළ විමර්ශනය - පොලිස් අධිකාරි නුවන් අසංක
4) කිංග්ස්බරි හෝටලයේ පිපිරීමට අදාළ විමර්ශනය - සහකාර පොලිස් අධිකාරි බී ඩී එච් කළනසිරි
5) කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ පිපිරීමට අදාළ විමර්ශනය - සහකාර පොලිස් අධිකාරි බී එස් තිසේරා
6) මඩකලපුව සියෝන් දේවස්ථානයේ පිපිරීමට අදාළ විමර්ශනය - සහකාර පොලිස් අධිකාරි එම් එල් සිරිවර්ධන
7) මහවිල උද්‍යානයේ පිපිරීමට අදාළ විමර්ශනය - සහකාර පොලිස් අධිකාරි අයි යූ කේ ලොකුහෙට්ටි

අප්‍රේල් 21 වැනිදා පිපිරීම් අතරින් දෙහිවල ට්‍රොපිකල් ඉන් ලැගුම්හලේ බෝම්බ පිපිරීම ගැන විමර්ශනය පොලිස්පතිවරයා විසින් බාර දී තිබුණේ ත්‍රස්තවාදී ක්‍රියා විමර්ශන කොට්ඨාසය (TID) වෙත ය.




අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරන ලද මූලික විමර්ශනවල උඩෘත එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශානි අබේසේකර 2019 ජූලි 01 වැනිදා නීතිපති වෙත යොමු කළේය. විමර්ශනවලට අදාළ ව අත්අඩංගුවට ගත් සැකකරුවන් 23 දෙනකු ගැන තොරතුරු එම මූලික විමර්ශන වාර්තාවට ඇතුළත් විය.

1) මොහොමඩ් ඊබ්‍රහිම් මොහොමඩ් නවුෆර් - කොළඹ මහාධිකරණයේ HC TAB 2972/21 අංකයෙනුත්, කෑගල්ල මහාධිකරණයේ HC 4485/21 අංකයෙනුත්, පුත්තලම මහාධිකරණයේ HC 107/21 අංකයෙනුත් අධිචෝදනා ගොනු කර ඇත.
2) මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා - කොළඹ මහාධිකරණයේ HC TAB 2972/21 අංකයෙනුත්, කෑගල්ල මහාධිකරණයේ HC 4409/20 අංකයෙනුත්, කෑගල්ල මහාධිකරණයේ HC 4485/21 අංකයෙනුත්, පුත්තලම මහාධිකරණයේ HC 107/21 අංකයෙනුත් අධිචෝදනා ගොනු කර ඇත.
3) මොහොමඩ් ඊබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් - කොළඹ මහාධිකරණයේ HC TAB 2972/21 අංකයෙනුත්,කෑගල්ල මහාධිකරණයේ HC 4485/21 අංකයෙනුත් අධිචෝනා ගොනු කර ඇත.
4) මොහොමඩ් ෂරීෆ් ආදම් ලෙබ්බේ නොහොත් ගෆූර් මාමා - කොළඹ මහාධිකරණයේ HC TAB 2972/21 අංකයෙනුත්, මඩකලපුව මහාධිකරණයේ HC 3421/21 අංකයෙනුත්, කෑගල්ල මහාධිකරණයේ HC 4409/20 අංකයෙනුත්, පුත්තලම මහාධිකරණයේ HC 107/21 අංකයෙනුත් අධිචෝදනා ගොනු කර ඇත.
5) මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් - කොළඹ මහාධිකරණයේ HC TAB 2972/21 අංකයෙන් අධිචෝදනා ගොනු කර ඇත.

6) මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනාස්දීන් - කොළඹ මහාධිකරණයේ HC TAB 2972/21 අංකයෙන් අධිචෝදනා ගොනු කර ඇත.
7) මොහොමඩ් රමේෂ් මොහොමඩ් සාජිද් - කෑගල්ල මහාධිකරණයේ HC 4485/21 අංකයෙන් ද, පුත්තලම මහාධිකරණයේ HC 107/21 අංකයෙන් ද, කොළඹ මහාධිකරණයේ HC TAB 2972/21 අංකයෙන් ද අධිචෝදනා ගොනු කර ඇත.
8) අබ්දුල් මනාස් මොහොමඩ් පිරිදාවුස් - මඩකලපුව මහාධිකරණයේ HC 3421/21 අංකයෙනුත්, කොළඹ මහාධිකරණයේ HC TAB 2972/21 අංකයෙනුත් අධිචෝදනා ගොනු කර ඇත.
9) මොහොමඩ් සවායිර් මොහොමඩ් හසන් - කොළඹ මහාධිකරණයේ HC TAB 2972/21 යටතේ අධිචෝදනා ගොනු කර ඇත.
10) ෆාතිමා ශිෆානා උමර්කාතා - නඩු පැවරීමක් ගැන තොරතුරු සොයා ගත නොහැක.
11) උමර් මොහොමඩ් ඉක්බාල් - නඩු පැවරීමක් ගැන තොරතුරු සොයා ගත නොහැක.
12) අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි - කොළඹ මහාධිකරණයේ HC TAB 2972/21 යටතේ අධිචෝදනා ගොනු කර ඇත.
13) අබ්දුල් කාදර් ෆාතිමා හාදියා - කල්මුණේ මහාධිකරණයේ HC 653/21 යටතේ අධිචෝදනා ගොනු කර ඇත.
14) ෆස්රුල් රහමන් මොහොමඩ් සහරාන් - නඩු පැවරීමක් ගැන තොරතුරු සොයා ගත නොහැකිය.
15) හුසේනුර් රිස්වි කාලිත් සමීර් - කොළඹ මහාධිකරණයේ HC TAB 2972/21 යටතේ අධිචෝදනා ගොනු කර ඇත.
16) මොහොමඩ් අක්‍රම් අහක්කම් - කොළඹ මහාධිකරණයේ HC TAB 2972/21 යටතේ අධිචෝදනා ගොනු කර ඇත.
17) ඉන්සාෆ් ඉෆ්තිකාර් - කොළඹ මහාධිකරණයේ HC TAB 2972/21 යටතේ අධිචෝදනා ගොනු කර ඇත.
18) එම් එම් යූ රහුමාන් - නඩු පැවරීමක් ගැන තොරතුරු සොයා ගත නොහැකිය.
19) එම් එෆ් එම් ඩුෂාන් - නඩු පැවරීමක් ගැන තොරතුරු සොයා ගත නොහැකිය.
20) මොහොමඩ් යූසුෆ් අල්තාෆ් අහමඩ් - නඩු පැවරීමක් ගැන තොරතුරු සොයා ගත නොහැකිය.
21) අප්තාබ් අහමඩ් - නඩු පැවරීමක් ගැන තොරතුරු සොයා ගත නොහැකිය.
22) යූසුෆ් මොහොමඩ් ඊබ්‍රහිම් - කොළඹ මහාධිකරණයේ HC 3072/22 යටතේ අධිචෝදනා ගොනු කර ඇත.
23) මොහොමඩ් ඊබ්‍රහිම් ඉජාස් - කොළඹ මහාධිකරණයේ HC 3072/22 යටතේ අධිචෝදනා ගොනු කර ඇත.

මෙම මූලික වාර්තාවෙන් පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තවත් සැකකරුවන් සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවට කරුණු වාර්තා කර තිබේ.

චැනල් ෆෝ නාලිකාව මගින් අනාවරණය කරන ලද සහරාන් හෂීම්ගේ සහ පිල්ලෙයාන්ගේ ගනුදෙනුවට අදාළ මූලික කරුණු කිහිපයක් ම, එනම් මඩකලපුව බන්ධනාගාරයේදී පිල්ලෙයාන් සහ සහරාන්ගේ සහෝදරයා ශයිනි දැන හඳුනාගැනීම ගැනත්, ඔවුනොවුන් උදව් ඉල්ලා සිටීම ගැනත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මූලික තොරතුරු ලැබෙන්නේ මෙම අපරාධ විමර්ශනය ආරම්භ කර කෙටි කාලයක් ඇතුළතදී ය. එනම් 2019 මැයි මාසයේදී ය. අපරාධ

පරීක්ෂණ දෙපාර්තමේන්තුවට එම තොරතුර ලැබෙන්නේ එවකට අත්අඩංගුවට ගෙන සිටි (මේ වන විට මහාධිකරණයේ නඩු පවරා ඇත.) සැකකරුවකුගෙන් ප්‍රකාශයක් සටහන් කරගැනීමේදී ය.




අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂව සිටි ශානි අබේසේකර මහතා ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම අනුවත්, ඔහු සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතා ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ ලබා දුන් සාක්ෂි අනුවත්, සමාජය හා සාමයික කේන්ද්‍රයේ පර්යේෂණ කණ්ඩායම වෙනත් මූලාශ්‍ර මගින් කළ තහවුරු කරගැනීම් අනුවත්, පාස්කු ප්‍රහාරයේ සහරාන්ට ඉහළින් යම් මෙහෙයවීමක් තිබුණු බවටත්, යම් සැකකටයුතු සිදුවීම් සිදුවී ඇති බවටත් මූලික විමර්ශන අවදියේ ම අනාවරණය වී තිබේ.

කෙසේ වෙතත් 2019 නොවැම්බර් මාසයේදී පැවැති ජනාධිපතිවරණයෙන් ගෝඨාභය රාජපක්ෂ බලයට පත්වූ පසු, රටේ අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලය පත්කිරීමටත් පෙරාතුවම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශානි අබේසේකර එම තනතුරෙන් ඉවත් කෙරිණි. එසේම ඇතැම් විමර්ශකයන් ද වෙනස් කෙරිණි. ඒ ගැන මීළඟ පරිච්ඡේදයේ සඳහන් කරනු ඇත.

## හත් වැනි පරිච්ඡේදය

## වසර දෙකට CID අධ්‍යක්ෂවරු 05ක් ! - 2019 නොවැම්බර් සිට 2024 ඔක්තෝබර් දක්වා අපරාධ විමර්ශනයේ කතාව

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කරගෙන ආ විමර්ශනවල යම් තීරණාත්මක වෙනසක් සිදු වූයේ 2019 නොවැම්බර් මාසයේ පැවැති ජනාධිපතිවරණයෙන් ගෝඨාභය රාජපක්ෂ මහතා ජයග්‍රහණය කිරීමත් සමග ය. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරමින් ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ ගෝඨාභය රාජපක්ෂ මහතා ඡන්ද 69,24,255ක් සහ 52.25%ක ප්‍රතිශතයක් ලබාගනිමින් ජයග්‍රහණය කළේය. ඔහුගේ ප්‍රධානතම ප්‍රතිවාදියා වූ සජිත් ප්‍රේමදාස මහතාට ඡන්ද 55,64,239ක් හිමි විය.[35viii]

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ජයග්‍රහණයෙන් පසු එවකට වැඩ බලන පොලිස්පති චන්දන වික්‍රමරත්න මහතා 2019 නොවැම්බර් 20 වැනි දාතමින් යුත් ලිපියක් මගින් ඒ වන විට ශ්‍රී ලංකා පොලිසියේ සිටි ජ්‍යෙෂ්ඨතම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා වූ ශානි අබේසේකර මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරින් ඉවත් කර, මහනුවර දිසා බාර නියෝජ්‍ය පොලිස්පතිගේ පුද්ගලික සහකාර ලෙස ස්ථාන මාරු කිරීමට නිර්දේශ කර ආරක්ෂක අමාත්‍යාංශය වෙත සහ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ලිපියක් යොමු කළේය. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් එම නිර්දේශය සැලකිල්ලට ගෙන ශානි අබේසේකර මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් කිරීමට තීරණය කළේය. එහෙත් පොලිස්පති නිර්දේශ කළ මහනුවර නියෝජ්‍ය පොලිස්පතිගේ පුද්ගලික සහකාර ලෙස පත්කිරීම වෙනුවට ගාල්ල නියෝජ්‍ය පොලිස්පතිගේ පුද්ගලික සහකාර ලෙස ස්ථාන මාරු කිරීම සිදු කළේය.[36ix]ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතා 2019 දෙසැම්බර් 31 වැනිදා විශ්‍රාම ගියේය.

ශානි අබේසේකර එතෙක් දැරූ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ධූරයට අලුතින් පත්කරනු ලැබුවේ මහින්ද රාජපක්ෂ මහතාගේ ආරක්ෂක අංශයේ දීර්ඝ කාලයක් සේවය කළ ඩබ්ලිව් තිලකරත්න මහතා ය. විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා 2024 අප්‍රේල් 24 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළේ ආණ්ඩු මාරුවෙන් පසු පාස්කු ඉරිදා විමර්ශනයට සම්බන්ධ නිලධාරීන් 30 දෙනකු මාරු කර යැවූ බවයි.

ගෝඨාභය රාජපක්ෂ රජය සමයේ පොලිසිය බාර අමාත්‍යවරයා ලෙස පත්කරනු ලැබුවේ සරත් වීරසේකර මහතා ය. එහි අමාත්‍යාංශ ලේකම් වූයේ යුද හමුදාවේ විශ්‍රාමික මේජර් ජෙනරාල්වරයකු වූ ජගත් අල්විස් මහතා ය. අනතුරුව අමාත්‍යාංශ ලේකම්ගේ උපදේශක/සම්බන්ධීකාරක ලෙස පත්කරනු ලැබුවේ මාවනැල්ල බුදු පිළිම කඩා දැමීමේ සිදුවීම වන අවස්ථාවේ එම ප්‍රාදේශය බාරව සිටි නියෝජ්‍ය පොලිස්පති පාලිත සිරිවර්ධන මහතා ය. ඔහු කිලිනොච්චි කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාව සිටි අතර, පුදුකුඩිඉරිප්පු නීතිවිරෝධී කැණීමක් සම්බන්ධයෙන් කරන ලද මූලික විමර්ශනයකින් පසු නැගෙනහිර පළාත බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සරත් කුමාර මහතා පොලිස්පතිට නිර්දේශ කළේ ඔහු කොට්ඨාස බාර නිලධාරි තනතුරකට නුසුදුසු පුද්ගලයකු බවයි.[37] එසේම ඔහු සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ද


---

[35]සමස්ත ලංකා ප්‍රතිඵලය, 2019 ජනාධිපතිවරණය, මැතිවරණ කොමිෂන් සභාව.

[36]2019 නොවැම්බර් 21 වැනිදා, අසාම් අමීන්.

[37] 2017 ජනවාරි 25 වැනිදා, එච් ඒ සරත් කුමාර විසින් පොලිස්පතිට යොමු කරන ලද වාර්තාව.

විමර්ශනයක් සිදු කළේය. කෙසේ වෙතත් 2018 ඔක්තෝබර 26 වැනිදායින් ඇරැඹි දින 52 ආණ්ඩු සමයේ ජාතික පොලිස් කොමිෂන් සභාව එ මහතා කෑගල්ල දිසා බාර නියෝජ්‍ය පොලිස්පති ලෙස පත් කළේය. ඔහු විශ්‍රාම ගොස් සිටියදී 2020 වසරේදී පමණ ඒ මහතා මහජන ආරක්ෂක අමාත්‍යංශයේ තනතුරක පිහිටුවිය. ඔහු එම තනතුරට පැමිණි පසු සේවයට පැමිණි පසු පාස්කු විමර්ශන ගොනු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ගෙන්වාගෙන පරීක්ෂා කළ අතර, විමර්ශන ගැන නිලධාරීන් සමග සාකච්ඡා කළේය.[x]




විවිධ චෝදනා සහ විමර්ශන මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉවත් කරනු ලැබූ නිලධාරීන් පිරිසක් සහ තවත් අලුත් නිලධාරීන් කණ්ඩායමක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අලුතින් අනුයුක්ත කරනු ලැබිණි. ඉන් ප්‍රධාන ම කිහිපදෙනකු මෙසේ ය.

1) සහකාර පොලිස් අධිකාරි මෙරිල් රංජන් ළමාහේවා - දුමින්ද සිල්වා අත්අඩංගුවට පත්වූ භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර ඝාතනය ගැන පැවති බී 3932 දරන මහේස්ත්‍රාත් අධිකරණ නඩුවට 2012. 04 .04 දින පෙනීසිටීමට යන බවට සටහන් යොදා නඩුව අධිකරණයේ කැඳවන අවස්ථාවේ නොසිටීම ගැන 2012 මැයි 11 වැනිදා එවකට පොලිස්පති එන් කේ ඉලංගකෝන් මහතා චෝදනා පත්‍රයක් නිකුත් කර තිබිණි. චෝදනා පත්‍ර ලබාදීමට පෙරාතුව එම සිද්ධියට අදාළ ව 2012 අප්‍රේල් 10 වැනිදා පොලිස් නීති දිසාව බාර නියෝජ්‍ය පොලිස්පති ගාමිණී දිසානායක විසින් ඔහුගේ වැඩ තහනම් කළේය.[38] එම විමර්ශනවලින් පසු නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඔහු පැමිණි අතර, ඉන්පසු ඇවන්ගාඩ් විමර්ශනයට අදාළ ව ඔහුගේ අපකීර්තිදායක හැසිරීම හේතුවෙන් එවකට නීතිපති ජයන්ත ජයසූරිය මහතාගේ නිර්දේශ මත ඔහු විමර්ශනවලින් ඉවත් කර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ද ඉවත් කර තිබේ. 2019 ජනාධිපතිවරණයෙන් පසු නැවත වරක්

---

[38] 2012 අප්‍රේල් 10 වැනිදා දිනැති 'ප්‍රධාන පොලිස් පරීක්ෂක මෙරිල් රංජන් ළමාහේවා නිලධාරියාගේ වැඩ තහනම් කිරීම' නම් ලිපිය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඔහු කැඳවා තිබුණු අතර පාස්කු ප්‍රහාරයට අදාළ විමර්ශනයක් ද ඔහුට බාර කෙරිණි.




2) පොලිස් පරීක්ෂිකා නිරෝෂිනී හේවාපතිරණ - ඇය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිටියදී එල්ල වූ චෝදනා සම්බන්ධයෙන් එවකට එහි අධ්‍යක්ෂ ශානි අබේසේකර ඇයට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් (බීසී/2768/2019) කර තිබේ.[39] එසේම තවත් කාරණා කිහිපයක් සම්බන්ධයෙන් ඇයට එරෙහිව විමර්ශනයක් සිදුවූ අතර, ඇය දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු කරනු ලැබිණි. කෙසේ වෙතත් 2019 ජනාධිපතිවරණයෙන් පසු ඇය ද යළි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා පාස්කු විමර්ශන බාර කෙරිණි. ඇය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනියුක්ත කරනු ලැබුවේ 2020 දෙසැම්බර් 31 දින අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඇය සම්බන්ධ විමර්ශන අවසන් නොමැති බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම්දී ඇති පසුබිමකය.[40]
3) පොලිස් පරීක්ෂක ඉන්දුක සිල්වා - මීට පෙර පාලිත සිරිවර්ධන මහතා ගැන සඳහන් කරද්දී සඳහන් කළ විමර්ශනය පසුව පොලිස්පතිවරයා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට බාර දුන් අතර, එම විමර්ශනය ඒ අනුව ඉන්දුක සිල්වා නිලධාරියාට බාර කෙරිණි. ඔහු එම විමර්ශනයට පිටව යන බව සටහන් කර විමර්ශනයට පිටව ගොස් නැතිවීම ගැන විමර්ශනයක්[41] ආරම්භ වූ අතර, ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරු කෙරිණි. ඊට එරෙහිව ඔහු ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම ද ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රතික්ෂේප කළේය. ඔහු සම්බන්ධයෙන් 2019 මාර්තු 05 වැනිදා අල්ලස් කොමිසමට පැමිණිල්ලක් ද යොමු කර ඇති අතර, ඔහුගේ අපකීර්තිදායක හැසිරීම ගැන ඔහුගේම බිරිඳ ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට

---

[40] 2020 දෙසැම්බර් 31 වැනිදා,'කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක නිරෝෂිනී හේවාපතිරණ සම්බන්ධ' මැයෙන් යොමු කළ ලිපිය.
[41] 2017 මාර්තු 23 වැනිදා, එස්/ඩීඅයිජී/සීඅයිඩී/අයිජීපී/237/17(873/17) දරණ ලිපිය

ලිපියක්[42] එවා තිබිණි. ඔහුගේ නැගණිය හෙරොයින් සමග අත්අඩංගුවට පත්වීම සහ ඔහුගේ මස්සිනා හෙරොයින් නඩු 07කට වැරදිකරු වීම ගැන ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළ පොලිස් ස්ථානය මගින් දැනුම් දුන්නේය.[43] එසේම මෙම නිලධාරියා වැලිකඩ පොලිසියට අසත්‍ය පැමිණිල්ලක් කිරීම සම්බන්ධයෙන් කරුණු අනාවරණය වන බවට 2016 නොවැම්බර් 19 වැනිදා නුගේගොඩ කොට්ඨාස බාර පොලිස් අධිකාරිවරයා විසින් බස්නාහිර දකුණ නියෝජ්‍ය පොලිස්පතිට වාර්තාවක් ලබාදී තිබේ.[44] අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරු කළ මෙම නිලධාරියා 2019 ජනාධිපතිවරණයෙන් පසු එම දෙපාර්තමේන්තුවට නැවත කැඳවා ඔහුට පාස්කු විමර්ශන බාරදීම සිදු විය. ආන්දෝලනයට තුඩු දුන් සාරා ජස්මින්ගේ තුන්වැනි ඩී එන් ඒ පරීක්ෂණයට අදාළ ව මූලික කටයුතු සිදුකළේ ද මෙම නිලධාරියා විසින් වන අතර, ශානි අබේසේකර සහ රවී සෙනෙවිරත්න යන දෙදෙනා ජාතික ජන බලවේගයේ විශ්‍රාමික පොලිස් සාමූහිකයට එක්වීමෙන් පසු ඔවුන් දෙදෙනාට එරෙහිව විමර්ශනයක් ආරම්භ කර අධිකරණයට කරුණු වාර්තා කළේ ද මෙම නිලධාරියා විසිනි.

ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති ධුරය දැරූ ඉතා කෙටි කාලසීමාවේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරුන් කිහිපදෙනකු ම ස්ථාන මාරුවීම විශේෂත්වයකි.

1) ශානි අබේසේකර
2) ඩබ්ලිව් තිලකරත්න
3) ප්‍රසන්න අල්විස්
4) නිශාන්ත සොයිසා
5) රොහාන් ප්‍රේමරත්න




අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරුන් මේ ආකාරයට ඉවත් කිරීම ගැන 2020 ඔක්තෝබර් 17 වැනිදා MediaLK වෙබ් අඩවිය මෙසේ වාර්තා කළේය.

*'ජාතික පොලිස් කොමිෂන් සභාව මගින් වසරක් ඇතුළත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තුන් වැනි අධ්‍යක්ෂවරයා ද ඉවත් කර හතර වැනි අධ්‍යක්ෂවරයා පත් කර තිබේ.*

---

[42] 2017 ඔක්තෝබර 23 වැනිදා, 'මාගේ ස්වාමිපුරුෂයා හා සම්බන්ධව පසුවන මානසික පීඩනයෙන් මුදවාලීම සම්බන්ධවයි' මැයෙන් වූ ලිපිය.

[43] 2017 නොවැම්බර් 10 වැනිදා, '2017.09.23 වන දින සිදුකරන ලද හෙරොයින් වැටලීම සම්බන්ධව' මැයෙන් වූ ලිපිය.

[44] 2016 නොවැම්බර් 19 වැනිදා, එස්පී/එන්යූ/ඊ13/01/433/2016

*වසරක් ඇතුළත පත්කරන ලද හතර වැනි අධ්‍යක්ෂවරයා වන්නේ නීතිවිරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසයේ අධ්‍යක්ෂ ලෙස සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජී නිශාන්ත ද සොයිසා මහතා ය.පසුගිය බ්‍රහස්පතින්දා (15) පැවැති ජාතික පොලිස් කොමිෂන් සභාවේදී ගත් තීරණයක් අනුව මෙම පත්කිරීම සිදු කර තිබේ. පොලිස් කොමිෂන් සභාව ගත් එම තීරණය ඊයේ (16) දිනයේ ම පොලිස් කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් NPC/ED/GO/TR/5/01/20-iv දරණ ලිපිය මගින් වැඩ බලන පොලිස්පතිවරයා වෙත දැනුම් දී තිබේ.*

*මීට පෙර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාව සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඒ ආර් ප්‍රසන්න ජේ ද අල්විස් මහතා ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කර තිබේ. ප්‍රසන්න අල්විස් මහතා ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාසයේ සහකාර පොලිස් අධිකාරිවරයකු ලෙස සේවය කරමින් සිටියදී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයකු ලෙස උසස් කිරීමට පසුගිය කාලයේ ජාතික පොලිස් කොමිෂන් සභාව කටයුතු කර තිබුණු අතර, පසුව මීට මාස කිහිපයකට පෙර ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත්කරනු ලැබීය. ඔහුගේ උසස්වීමට එරෙහිව පොලිස් අධිකාරිවරුන් කිහිපදෙනකු සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන් කිහිපදෙනකු මූලික අයිතිවාසිකම් පෙත්සම් ද ගොනු කර තිබේ.*

*2017 සැප්තැම්බර් 17 වැනිදා සිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කළේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ශානි අබේසේකර මහතා ය. පසුගිය නොවැම්බර් 21 වැනිදා හදිසියේම ඒ මහතා එම තනතුරින් ඉවත් කර ගාල්ල නියෝජ්‍ය පොලිස්පතිගේ පෞද්ගලික සහකාර ලෙස පත්කරනු ලැබීය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරට පත්කරනු ලැබුවේ කාලයක් ජනපති ආරක්ෂක කොට්ඨාසයේ ද රාජකාරි කළ ඩබ්ලිව් තිලකරත්න මහතා ය. පසුගිය මැයි මාසයේදී තිලකරත්න මහතා ද එම ධුරයෙන් ඉවත් කර ප්‍රසන්න අල්විස් මහතා පත්කරනු ලැබීය.*

*මෙම නිලධාරීන් අදාළ තනතුරුවලින් ඉවත් කළේ ඔවුන් ආණ්ඩුවේ ඕනෑ-එපාකම් අනුව වැඩ නොකරන නිසා ද, එසේත් නැතිනම් ඔවුන් නිසි ආකාරයට රාජකාරි නොකරන නිසාද යන්න පොලිස් කොමිෂන් සභාව ප්‍රකාශ කළ යුතු බවත්, ඔවුන් ඉවත් කළේ රාජකාරි හරිහැටි ඉටු නොකිරීම නිසා නම් ඔවුන්ට යළි වෙනත් කොට්ඨාසවල අධ්‍යක්ෂ තනතුරු ලබාදීම ගැටලු සහගත බවත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් MediaLK වෙත සඳහන් කළේය. පොලිස් කොමිෂන් සභාව නිලධාරීන්ට අපක්ෂපාතීව රාජකාරි ඉටුකිරීමට ඉඩ නොදී පක්ෂග්‍රාහීව කටයුතු කිරීමට බලපෑම් කරනවාදැයි සැකසහිත බවත්, උසස් නිලධාරීන් ස්ථාන මාරු කිරීමේ ක්‍රමවේදයක් සකස් කර තිබියදීත් එය ක්‍රියාත්මක නොකර හිතුමතේ ස්ථාන මාරුවීම් ලබාදීම සැකසහිත බවත් එම නිලධාරියා ප්‍රකාශ කළේය. මේ සම්බන්ධයෙන් විමසීමට ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම්වරයා සම්බන්ධ කරගැනීමට උත්සාහ කළත් එය අසාර්ථක විය.'*

2021 අප්‍රේල් 21 දිනට ඔන්න-මෙන්න කියා තිබියදී නිශාන්ත සොයිසා ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් කර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි රොහාන් ප්‍රේමරත්න පත්කිරීම සිදු විය.


මෙම කාලය තුළදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ආන්දෝලනාත්මක අත්අඩංගුවට ගැනීම් කිහිපයක් සිදු කළේය.

1) හිජාස් හිස්බුල්ලා
2) රියාජ් බදියුදීන්
3) රිෂාඩ් බදියුදීන්

4) අසාත් සාලි

මෙම ඇතැම් අත්අඩංගුවට ගැනීම් ප්‍රමාද වීම ගැන බුද්ධි සමාලෝචන මණ්ඩල රැස්වීම්වලදී එවකට රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ තුවාන් සුරේෂ් සලේ මහතා කරුණු විමසීම් කර ඇති බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව බාරව සිටි නියෝජ්‍ය පොලිස්පති ප්‍රසාද් රණසිංහ මහතාගේ ප්‍රකාශ උපුටා දක්වමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කොළඹ - කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර තිබේ.[45] එම කරුණු වාර්තා කිරීමේ මෙසේ ද සඳහන් විය.

'එහිදී එම සාකච්ඡාව මෙහෙයවූ සුරේෂ් සලේ මහතා දන්වා සිටියේ එවකට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා එම කාරණයට අදාළ ව රිෂාඩ් බදියුදීන් අත්අඩංගුවට ගැනීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දොස් නැගූ බවයි.'




2019 නොවැම්බර් ආණ්ඩු මාරුවෙන් පසු පාස්කු ඉරිදා ප්‍රහාරයට අදාළ විමර්ශනවල තීරණාත්මක සංධිස්ථානයක් වූයේ සාරා ජස්මින් සයින්දමරුදු ප්‍රහාරයෙන් මිය ගිය බවට පොලිස් මාධ්‍ය ප්‍රකාශකව සිටි නිහාල් තල්දූව විසින් 2023 මාර්තු 29 වැනිදා හදිසි මාධ්‍ය නිවේදනයක් නිකුත් කිරීමයි.

2024 සැප්තැම්බර් මාසයේ ජනාධිපතිවරණය ආසන්න වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පාස්කු විමර්ශන සම්බන්ධයෙන් වැඩි අවධානය යොමු වී තිබුණේ ජාතික ජන බලවේගයේ විශ්‍රාමික පොලිස් සාමූහිකයට එක්වූ රවී සෙනෙවිරත්න සහ ශානි අබේසේකර සම්බන්ධයෙන් කරන විමර්ශනයකට ය. එම විමර්ශනයට අදාළ පැමිණිලිකරු වූයේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාව සිටියදී නීතිය හා සාමය අමාත්‍යාංශයේ කටයුතු කළ සහ ඒ කාලයේ පාස්කු විමර්ශන අධීක්ෂණය කළ විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති පාලිත සිරිවර්ධන මහතා ය. පැමිණිල්ල විමර්ශනය කිරීමට බාර දී තිබුණේ පාලිත සිරිවර්ධන මහතාට එරෙහි විමර්ශනයකදී නිසි ආකාරයට රාජකාරි නොකිරීම මත ශානි අබේසේකර සහ රවී සෙනෙවිරත්න විසින් ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉවත් කිරීමට නිර්දේශ කළ ඉන්දුක සිල්වා නම් නිලධාරියාට ය.

[45] 2026 මාර්තු 11 වැනිදා, බී 35882/24

# අට වැනි පරිච්ඡේදය

## යුක්තිය කෙරෙහි බලාපොරොත්තුව - 2024 ඔක්තෝබර්වලින් පසු විමර්ශනයේ කතාව

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයට අදාළ ව යුක්තිය කෙරෙහි වන බලාපොරොත්තුව ඉටුවන සේයාවක් හෝ පෙනෙන්නට පටන්ගත්තේ 2024 වසරේ ඔක්තෝබර් මාසයේදී සමාජය හා සාමයික කේන්ද්‍රය විසින් චැනල් ෆෝ නාලිකාවේ අනාවරණය ගැන කරන ලද පැමිණිල්ලට අදාළ ව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශන ආරම්භ කිරීමත් සමග ය.

සමාජය සහ සාමයික කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ රොහාන් සිල්වා පියතුමා විසින් අදාළ පැමිණිල්ල මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමුකළේ 2024 ඔක්තෝබර් මස 04 වැනිදා ය. එම පැමිණිල්ල එවකට වැඩ බලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතාට යොමුකිරීමෙන් පසු වැඩිදුර විමර්ශන සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කෙරිණි. ඒ අනුව අදාළ පැමිණිල්ල ගැන විමර්ශනයක් සිදුකරන බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක පී වී මාධව ගුණවර්ධන මහතා 2024 නොවැම්බර් 11 වැනිදා බී/35882/24 යටතේ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කළේය. ඉන්පසු විමර්ශනයට අදාළ ව නොවැම්බර් 15 වැනිදා වැඩිදුර කරුණු වාර්තා කිරීමක් සිදු කර චැනල් ෆෝ නාලිකාවේ අනාවරණය මගින් චෝදනා එල්ල කෙරෙන සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් නොහොත් පිල්ලෙයාන්ට සහ රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ තුවාන් සුරේෂ් සලේට අධිකරණයේ අවසරයක් නොමැතිව විදෙස්ගත වීම වළක්වාලමින් නියෝගයක් ලබාගැනීමට කටයුතු කළේය.[46]

අනතුරුව දීර්ඝ ලෙස විමර්ශන සිදු කළ අපරාධ පරීක්ෂණ දෙපාර්මේන්තුව 2025 පෙබරවාරි 18, 2025 අප්‍රේල් 12, 2025 අප්‍රේල් 22, 2025 අප්‍රේල් 29, 2025 ජූලි 07, 2025 ජූලි 21, 2025 ජූලි 23, 2025 අගෝස්තු 04, 2025 අගෝස්තු 18, 2025 සැප්තැම්බර් 01, 2025 සැප්තැම්බර් 10, 2025 සැප්තැම්බර් 15, 2025 ඔක්තෝබර් 01, 2025 ඔක්තෝබර් 17, 2025 ඔක්තෝබර් 28, 2025 නොවැම්බර් 12, 2025 නොවැම්බර් 23, 2025 දෙසැම්බර් 23, 2026 ජනවාරි 07, 2026 ජනවාරි 21, 2026 පෙබරවාරි 11, 2026 මාර්තු 05, 2026 මාර්තු 11 වැනිදා සහ 2026 මාර්තු 26 දින විමර්ශනයේ ප්‍රගතිය ගැන අධිකරණයට කරුණු වාර්තා කළේය.

මෙම විමර්ශනයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කරුණු කිහිපයක් ගැන අවධානය යොමු කර ඇති බව අධිකරණයට කළ කරුණු වාර්තා කිරීම් අනුව පෙනී යයි.

1) වව්නතිව්හිදී පොලිස් නිලධාරීන් ඝාතනයට අදාළ විමර්ශන නොමග යැවීම
2) සයින්දමරුදු ප්‍රහාරය
3) සයින්දමරුදු ප්‍රහාරයෙන් පසු සාරා ජස්මින්ට අත්වූ ඉරණම
4) සාරා ජස්මින්ගේ තුන්වැනි ඩී එන් ඒ පරීක්ෂණය
5) පාස්කු ඉරුදින ප්‍රහාරයට අදාළ කුමන්ත්‍රණ සිදුවීම්
6) සුරේෂ් සලේගේ සම්බන්ධතාව

46 2024 නොවැම්බර් 15 වැනිදා, බී/35882/24.

මෙම විමර්ශනයට අදාළ ව මේ වන විට සැකකරුවෝ තිදෙනෙක් අත්අඩංගුවට ගෙන සිටිති. අධිකරණයට කර ඇති කරුණු දැක්වීම් අනුව සහ පොලිසිය කළ නිවේදන අනුව එම සැකකරුවන් සහ ඔවුන් අත්අඩංගුවට ගැනීමට හේතු මෙසේ ය.

1) රාජ්‍ය බුද්ධි සේවයේ පොලිස් සැරයන් යාසින්බාවා ජෙගීල්පාස් - වව්නතිව් ඝාතන සිදුවීමට අදාළ ව ජැකට්ටුවක් හඳුන්වාදීමේ සිදුවීම සම්බන්ධයෙන්
2) මඩකලපුව කොට්ඨාස බුද්ධි අංශයේ හිටපු ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සුවඳරාල සුදුනිලමේගේ සරත් සමන්ත - වව්නතිව් ඝාතන සිදුවීමට අදාළ ව ජැකට්ටුවක් හඳුන්වා දීම
3) යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂ සහ රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ තුවාන් සුරේෂ් සලේ - පාස්කු ප්‍රහාරයට අදාළ ව ආධාර අනුබල දීම සහ විමර්ශන නොමග යැවීමට බලපෑම් කිරීම

මෙම විමර්ශනයට අදාළ ව මේ වන විට 100කට අධික පිරිසකගෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඇති බව අධිකරණයට කළ කරුණු වාර්තා කිරීම් නිරීක්ෂණය කිරීමේදී පෙනී යයි. එසේම මෙතෙක් කාලයක් විමර්ශනයට ලක් නොවූ බොහෝ කරුණු ගැන යළිත් විමර්ශන ආරම්භ වී ඇති බව ද නිරීක්ෂණය වේ.

ඒ අනුව පාස්කු විමර්ශන කෙරෙහි සහ අපරාධ යුක්තිය කෙරෙහි යම් බලාපොරොත්තුවක සේයාවක් පෙන්නුම් කෙරේ.

# 09 වැනි පරිච්ඡේදය

## නඩු 41ක් !

පාස්කු ඉරිදා එල්ල කෙරුණු ත්‍රස්ත ප්‍රහාරය සහ ඊට අනුෂාංගික කරුණුවලට අදාළ ව මහාධිකරණවල නඩු 41ක් ගොනු කර ඇති බව සමාජය හා සාමයික කේන්ද්‍රය නීතිපති දෙපාර්තමේන්තුවට යොමුකරන ලද තොරතුරු ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් නීතිපති දෙපාර්තමේන්තුව දැනුම් දුන්නේය.

| අනුඅංකය | නඩුඅංකය | සැකකරුවන්ගණන |
|---|---|---|
| **1** | Batticaloa HC 3421/21 | 4 |
| **2** | Kegalla HC 4409/20 | 3 |
| **3** | Kandy HC 32/21 | 1 |
| **4** | Puttalam HC 78/21 | 2 |
| **5** | Puttalam HC 148/21 | 1 |
| **6** | Nuwara Eliya HC 69/21 | 1 |
| **7** | Negombo HC 308/21 | 2 |
| **8** | Kaluthara HC 268/21 | 1 |
| **9** | Nuwara Eliya HC 75/21 | 1 |
| **10** | Galle HC 5673/21 | 1 |
| **11** | Nuwara Eliya HC 78/21 | 1 |
| **12** | Kalmunai HC 658/21 | 1 |
| **13** | Nuwara Eliya HC 88/21 | 1 |
| **14** | Kandy HC 301/21 | 1 |
| **15** | Batticaloa HC 3437/21 | 1 |
| **16** | Puttalam HC 188/21 | 3 |
| **17** | Vavuniya HC 3058/22 | 1 |
| **18** | Galle HC 5749/22 | 1 |
| **19** | Kandy HC 95/22 | 1 |
| **20** | Kuliyapitiya HC 73/22 | 1 |
| **21** | Kurunegala HC 237/20 | 1 |
| **22** | Gampaha HC 251/20 | 1 |
| **23** | Nuwaraeliya HC 57/22 | 1 |
| **24** | Kegalla HC 4485/21 | 16 |
| **25** | Puttalam HC 107/21 | 6 |
| **26** | Batticaloa HC 3487/22 | 1 |
| **27** | Kalmunai HC 653/21 | 1 |
| **28** | Colombo HC TAB 2972/21 | 25 |
| **29** | Colombo HC 3885/22 | 1 |
| **30** | Colombo HC 3886/22 | 6 |
| **31** | Hambantota HC 44/22 | 1 |

| | | |
|---|---|---|
| **32** | Nuwaraeliya HC 52/22 | 1 |
| **33** | Nuwaraeliya HC 51/22 | 1 |
| **34** | Kandy HC 142/22 | 1 |
| **35** | Kalmunai HC 688/22 | 1 |
| **36** | Hambantota HC 02/23 | 1 |
| **37** | Hambantota HC 61/22 | 1 |
| **38** | Batticaloa HC 3476/22 | 1 |
| **39** | Hambantota HC 64/22 | 1 |
| **40** | HC Colombo HC.TAB 2899/21 | 1 |
| **41** | HC Colombo HC.TAB 2900/21 | 1 |

එම නඩු අතරින් වැඩිම විත්තිකරුවන් පිරිසක් සිටින නඩුව වන්නේ කොළඹ ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයක් ඉදිරියේ විභාග වන චූදිතයන් 25 දෙනකුට එරෙහි නඩුවයි.

චූදිතයන් 25 දෙනකුට එරෙහිව 2021 අගෝස්තු 10 වැනිදා නීතිපතිවරයා ගොනු කළ අධිචෝදනාපත්‍රය සම්බන්ධ නඩුවේ කටයුතු ඇරඹෙන්නේ 2021 සැප්තැම්පර් මස පළමුවැනිදාය. ඒ ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයක් ඉදිරියේදීය. 2021ඔක්තෝබර් 04 වැනිදා මෙම නඩුවට අදාලව චූදිතයන් 25 දෙනාගෙන් 24 දෙනකු බන්ධනාගාරය මගින් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ අතර ඔවුන්ට අධිචෝදනා බාරදීම සිදුවිය. චූදිතයන් 13 දෙනකුට නීතිඥවරුන් නොමැති බව ඔවුහු දැනුම් දුන්හ. නැවත 2021 නොවැම්බර් 23 වැනිදා නඩුව කැඳවූ අවස්ථාවේ සියලුම චූදිතයන් අධිකරණයට දිරිපත් කර තිබුණු අතර ඊට පෙර දින අධිකරණයට ඉදිරිපත් නොකළ 15 වැනි චූදිත මොහොම්මදු හනීෆා සෙයිනුල් ආබ්දීන් හෙවත් අබු හිනා ද අධිකරණයට ඉදිරිපත් කර තිබිණි. ඒ අනුව ඔහුට අධිචෝදනා බාරදීම සිදුවිය. යළි මෙම නඩුව කැඳවූයේ 2022 ජනවාරි මස 12 වැනිදාය. නීතිඥ නියෝජනයක් නොමැති චූදිතයන් 09 දෙනකුට එදින රජයේ වියදමින් නීතිඥවරු පත් කළ අතර එම නඩුවේ 09 වැනි චූදිත මොහමෙඩ් සාජිත් හෙවත් අබු නජා හෙවත් සාජිත් මවුලවි වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා දන්වා සිටියේ පොලිසියෙන් යැයි කියන පිරිසක් චූදිතගේ නිවසට ගොස් නීතිඥවරයා ගැන සොයා බලා ඇති බවයි.

මෙම නඩුවේ චෝදනා පත්‍ර සහ අදාල ගොනු ඉතා විශාල ප්‍රමාණයකින් යුක්ත වූ අතර චෝදනා සියල්ල එකිනෙක වෙන්ව සම්පූර්ණයෙන්ම කියවා දීම ප්‍රායෝගික නොවන බව කියමින් චෝදනාවල සාරාංශ බාරදීමට අධිකරණය අවසර දුන් අතර ඒ අනුව 2022 මාර්තු මස 03 වැනිදා එම සාරාංශ බාරදීම සිදුවිය. නඩුව මුලින්ම කොළඹ මහාධිකරණයේදී විභාග වූ අතර පසුව එම ත්‍රිපුද්ගල මහාධිකරණ නඩු විභාගය සඳහා කොළඹ බෞද්ධාලෝක මාවතේ ස්ථානයක් ලබාදීම සිදුවිය. එහෙත් එම ස්ථානයේද ඉඩකඩ සීමිත වීම නිසා ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩු විභාගය කොළඹ 12අධිකරණ මාවතේ පිහිටි ස්ථානයක (ශ්‍රේෂ්ඨාධිකරණයේ අලුත්වැඩියා කටයුතු යන අවස්ථාවේ තාවකාලිකව ශ්‍රේෂ්ඨාදිකරණය ක්‍රියාත්මක වූ ගොඩනැගිල්ල) යළි මාරු කරනු ලැබිණි. ඒ අනුව මේ වන විට මෙම නඩු විභාගය පවත්වන්නේ එම ස්ථානයේදීය.

මෙම නඩුවේ චූදිතයන්ට එරෙහිව චෝදනා නගා ඇත්තේ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේය. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ ප්‍රතිපාදන අනුව මෙන්ම සහ අධිකරණ සංවිධාන පනතේ ප්‍රතිපාදන අනුව මෙම නඩුව දිනපතා විභාග කිරීමට ත්‍රිපුද්ගල මහාධිකරණය තීන්දු කළේය මීට මාස කිහිපයකට ඉහතදීය. ඒ සමග චූදිතයන්ගේ නීතිඥවරුන් දන්වා සිටියේ තමන් බාරගෙන ඇති අනිකුත් නඩුවලට දැඩි අසාධාරණයක් සිදුවන බැවින් තමන්ට දිනපතා නඩු විභාග කරන්නේ

නම් නඩු විභාගයට සම්බන්ධ විය නොහැකි බවයි. ඒ අනුව ඔවුන් නඩු විභාගයෙන් ඉවත් වූහ. දැන් චූදිතයන් දෙදෙනකුට නීතිඥ නියෝජනයක් තිබෙන අතර සෙසු චූදිතයන්ට නීතිඥ නියෝජනයක් නැත.

මෙම නඩුවේ මුල්ම සාක්කිකරුවන් ලෙස නම් කර තිබුණේ සුරේෂ් සලේ සහ රොහාන් ගුණරත්න යන දෙදෙනා වුවද, නීතිපතිවරයා ඔවුන් දෙදෙනාගේ සාක්කි මෙහෙයවීම සිදු කළේ නැත. ඊට අදාලව මේ වන විට සැලකියයුතු පිරිසකගෙන් සාක්කි ලබාගෙන තිබේ. මේ අතර චූදිතයන් විසින් ත්‍රස්තවාදය වැලැවීමේ පනතත යටතේ ලබා දුන්නේයැයි කියන පාපොච්චාරණ ස්වයංව ලබා දුනාදැයි බලන පරීක්ෂණය කිහිපයක්ම ද තිබිණි.

මෙම නඩු විභාගය අතරතුර එහි එක් චූදිතයකු මරණයට පත්වූ අතර මේ වන විට එම නඩුව විභාග වන්නේ චූදිතයන් 24 දෙනකුට එරෙහිවය. HC (TAB) 2972/21 අංක දරන එම නඩුවේ වර්තමාන විනිසුරු මඩුල්ල මෙසේ ය.

- මහාධිකරණ විනිසුරු නවරත්න මාරසිංහ - සභාපති
- මහාධිකරණ විනිසුරු සුජීව නිශ්ශංක - සාමාජික
- මහාධිකරණ විනිසුරු රාමනාදන් කන්නන් - සාමාජික

මෙම මහාධිකරණ නඩුව 2026 අප්‍රේල් 10 වැනිදා දින සිංහල-දෙමළ අලුත් අවුරුදු නිවාඩුවට අදාළ ව කල් තබන අවස්ථාව වන විට දින 170ක් විභාගය කැඳවා තිබිණි.

මීට අමතරව පසුගිය කාලයේ වඩාත් කතාබහට ලක්වූ සිදුවීමක් වූයේ ප්‍රසිද්ධ කුළුබඩු ව්‍යාපාරිකයකු වූ මොහොමඩ් යූසුෆ් මොහොමඩ් ඊබ්‍රහිම්ගේ සිද්ධියයි. ඔහුගේ දරුවන් දෙදෙනකු අප්‍රේල් 21 වැනිදා ප්‍රහාර මාලාවේ මරාගෙන මැරුණු බෝම්බකරුවන් දෙදෙනකු බවත්, ඔහුගේ ලේලිය මහවිල උද්‍යානයේදී බෝම්බ පුපුරුවාගෙන මිය ගිය බව කියන කාන්තාව බවත් විමර්ශකයෝ සඳහන් කරති. එම සිද්ධියෙන් පසු මොහොමඩ් යූසුෆ් මොහොමඩ් ඊබ්‍රහිම් සහ ඔහුගේ පවුලේ තවත් දෙදෙනකු අත්අඩංගුවට පත් විය.

ඔවුන්ට එරෙහිව කොළඹ මහාධිකරණයේ HC 3072 යටතේ අධිචෝදනා ගොනු කර, මේ වන විට නඩු විභාගය පැවැත්වේ. එහි චූදිතයෝ මෙසේ ය.

- මොහොමඩ් යූසුෆ් මොහොමඩ් ඊබ්‍රහිම්
- මොහොමඩ් ඊබ්‍රහිම් ඉජාස් අහමඩ්
- මොහොමඩ් ඊබ්‍රහිම් ඉස්මයිල් අහමඩ්

මෙම නඩුව අවසන් වරට 2026 ජනවාරි 30 වැනිදා කැඳවන ලදි. එදින පෙනී සිටි සාක්ෂිකරුවන් දෙදෙනකුට මීළඟ දිනයේ නැවත පෙනීසිටින ලෙස අවවාද කෙරිණි. මීළඟ නඩු විභාගය 2026 මැයි මස 26 වැනිදා කැඳවීමට නියමිත ය.

මීට අමතරව වැල්ලම්පිටිය තඹ කර්මාන්ත ශාලාවට අදාළව ද HC 3886/22 යටතේ කොළඹ මහාධිකරණයේ නඩු පවරා තිබේ. එහි විත්තිකරුවන් ගණන 06 දෙනෙකි. මෙම නඩුව 2026 පෙබරවාරි මස 03 වැනිදා අවසන් වරට කැඳවූ අතර, මීළඟට එම නඩුව 2026 මැයි 14 වැනිදා කැඳවීමට නියමිත ය.

වනාතවිල්ලුව ප්‍රදේශයේ පුපුරණ ද්‍රව්‍ය සඟවා තැබීම සම්බන්ධයෙන් ද නීතිපතිවරයා විසින් පුද්ගලයන් හයදෙනකුට එරෙහිව ත්‍රිපුද්ගල මහාධිකරණයක නඩු පවරා තිබේ. එම නඩුව විභාගයට

ගැනෙන්නේ පුත්තලම මහාධිකරණයේදී ය. නඩු විභාගය යළිත් 2026 අප්‍රේල් මස 30 වැනිදා කැඳවීමට නියමිත ය.

මහාධිකරණයේ විභාග වන නඩුවලට අමතරව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේදී චැනල් ෆෝ පැම්ණිල්ලට අදාළ ව තුවාන් සුරේෂ් සලේ මහතා සැකකරුවකු ලෙස නම් කළ නඩුව ද පසුගිය කාලයේ වැඩි කතාබහකට ලක්විය. එම විමර්ශනයට අදාළ ව ප්‍රකාශ ලබාගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවූ යුද හමුදා බුද්ධි නිලධාරියකු විසින් තමන් අත්අඩංගුවට ගැනීම වළක්වන ලෙස ඉල්ලමින් අභියාචනාධිකරණයේ රිට් පෙත්සමක් ගොනු කර තිබේ. ඊට අමතරව තමන් සැකකරුවකු ලෙස නම් කිරීම අත්හිටුවන ලෙස ඉල්ලමින් තුවාන් සුරේෂ් සලේ මහතා ද අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ගොනු කර තිබේ.

## 10 වැනි පරිච්ඡේදය

## තවදුරටත් විමර්ශනය කළ යුතුව ඇති කරුණු

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයට අදාළ ව තවදුරටත් විමර්ශනය කළ යුතු කරුණු ගණනාවක් තිබේ. ඊට අදාළ ව නව කරුණු සහ සොයාගැනීම් සමාජය හා සාමයික කේන්ද්‍රය වෙනම වාර්තාවකින් ප්‍රකාශ කරන අතර, මීට වසරකට පෙර, එනම් 2025 අප්‍රේල් 17 වැනිදා සමාජය හා සාමයික කේන්ද්‍රය පෙන්වා දුන් කරුණු සහ ඊට අදාළ ව විමර්ශන ආරම්භ වූ කරුණු ගැන මෙහි සඳහන් කෙරේ.

එම වාර්තාවේදී මෙතෙක් අපරාධ විමර්ශනයකට ලක් නොවූ තොරතුරු කරුණු 05 ඔස්සේ දීර්ඝ ලෙස ඉදිරිපත් කෙරිණි,

1) දෙහිවල ට්‍රොපිකල් ඉන් ලැගුම්හලේදී බෝම්බ පිපිරීමෙන් මරණයට පත්වූ අබ්දුල් ලතීෆ් මොහොමඩ් සම්බන්ධ කරුණු
2) සහරාන් සමග සම්බන්ධ වූ අබු-හින්ද් සම්බන්ධ කරුණු
3) කල්මුණේ සයින්දමරුදු බොලිවේරියන් ග්‍රාමයේ ප්‍රහාරයේදී පළාගියා යැයි සැකකරන පුලස්තිනී මහේන්ද්‍රන් නොහොත් සාරා ජස්මින් සම්බන්ධ කරුණු සහ සයින්දමරුදු පිපිරීම ගැන
4) විදේශගතව සිටිමින් චැනල් ෆෝ නාලිකාව ඔස්සේ අනාවරණයක් කළ හන්සීර් අසාද් මවුලානාගේ ප්‍රකාශවලට අදාළ කරුණු.
5) ප්‍රහාරයට පෙර අනතුරු ඇඟවීම් අනුව කටයුතු නොකිරීම

මෙම කරුණු පහෙන් මේ වන විට තුන් වැනි සහ හතර වැනි කරුණු ගැන විමර්ශන ආරම්භ වී තිබේ. කෙසේ වෙතත් සෙසු කරුණු සම්බන්ධයෙන් තවදුරටත් විමර්ශන කළ යුතුව තිබේ.

එසේම මෙම කරුණුවලට අමතරව පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් වන සම්බන්ධතා අනාවරණය කරගැනීම සඳහා තවදුරටත් විමර්ශනය කළ යුතු කරුණු රැසක් තිබේ. ඊට අමතරව තවත් කාරණා ගණනාවක් සම්බන්ධයෙන් සමාජය හා සාමයික කේන්ද්‍රය ගවේශනය කරමින් සිටී.

මීට වසරකට පෙර සමාජය හා සාමයික කේන්ද්‍රය තවදුරටත් විමර්ශනය කළ යුතු කරුණු සම්බන්ධයෙන් පළ කළ අදාළ සම්පූර්ණ වාර්තාව පහත දැක්වේ.

**අබ්දුල් ලතීෆ් මොහොමඩ් ජමීල්**

පාස්කු ඉරිදා එල්ල වූ ම්ලේච්ඡ ප්‍රහාර මාලාවේදී ටාජ් සමුද්‍රා හෝටලයේ බෝම්බය පුපුරුවා ගැනීමට උත්සාහ කර පසුව දෙහිවල ට්‍රොපිකල් ඉන් ලැගුම්හලේදී බෝම්බය පිපිරී මරණයට පත්වූ අබ්දුල් ලතීෆ් මොහොමඩ් ජමීල්ට අදාළ ව සැකකටයුතු කරුණු ගණනාවක් තිබේ.

ජමීල් සම්බන්ධයෙන් බුද්ධි අංශ අවධානය යොමු වී ඇත්තේ 2015 වසරේ සිට බව ජනාධිපති කොමිෂන් සභාවේදී හෙළිදරව් විය. මෙම ප්‍රහාරයට පෙර ජමීල් සම්බන්ධයෙන් සොයා බැලීම / පරීක්ෂණ පැවැත්වීම / ආවේක්ෂණය කිරීම දැනට වාර්තා වී ඇති පරිදි රාජ්‍ය බුද්ධි සේවය, යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය සහ ත්‍රස්තවාදී ක්‍රියා විමර්ශන කොට්ඨාසය (ටීඅයිඩී) යන

ආයතනවලින් සිදු කර තිබේ. ජමීල් සම්බන්ධයෙන් දැනට හෙළිදරව් වී ඇති පරිදි ඉහත ආයතන / අංශ තුන මගින් සොයාබැලීම් කළ ද, මෙම ප්‍රහාරය ගැන පූර්ව අනතුරු ඇඟවීම් ඔහු හරහා ලබාගැනීමට හෝ ප්‍රහාරය වළක්වාගැනීමට අපොහොසත් විය. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේදී ද, විජිත් මලල්ගොඩ විනිසුරුවරයාගේ ප්‍රධානත්වයෙන් පත්කළ ජනාධිපති කමිටුවේදී ද, පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේදී ද හෙළිදරව් වූ කරුණු සහ වෙනත් මූලාශ්‍රවලින් සොයාගැනීමට හැකිවූ තොරතුරු අනුව පහත ජමීල්ට අදාළ ව පහත සඳහන් කරුණු ගැන වැඩිදුර විමර්ශනය සිදු කර යුතුව තිබේ.

1) සෑම දිනකම උදෑසන 7ත් 8ත් අතර, ඊට පෙර දින රාත්‍රී 12 වන විට හෝටලයට පැමිණි පුද්ගලයන්ගේ නම් ලැයිස්තුවක් රාජ්‍ය බුද්ධි සේවයට සහ ජනාධිපති ආරක්ෂක අංශයට යැවීම සාමාන්‍ය පුරුද්දක් බව ටාජ් සමුද්‍රා හෝටලයේ ආරක්ෂක කළමනාකරු ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේදී සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේය. 2019 අප්‍රේල් 20 වැනිදා සවස ජමීල් පැමිණ ටාජ් සමුද්‍රා හෝටලයේ කාමරයක් වෙන්කරවා ගත්තේය. 2019 අප්‍රේල් 20 වැනිදා රාත්‍රී 12 වන විට කාමර වෙන්කරවා ගත් ලැයිස්තුව ඔහු විසින් 21 වැනිදා උදෑසනම අදාළ අංශ වෙත යොමුකර තිබේ. ඒ අනුව මෙම ලැයිස්තුවේ තමන් විසින් තොරතුරු රැස්කරමින් සිටින පුද්ගලයකු වන ජමීල්ගේ නම තිබෙනු රාජ්‍ය බුද්ධි සේවය උදෑසනම හඳුනාගත්තේ ද සහ එසේ හඳුනාගත්තේ නම් ඊට අදාළ ව ගත් පියවර කුමක්ද යන්න ගැන විමර්ශනය කළ යුතු ව තිබේ.

2) හෝටලයේ කාමර වෙන්කර ගන්නා සියලුමදෙනාගේ ජාතික හැඳුනුම්පත් අංක හෝටල් දත්ත පද්ධතියට ඇතුළත් කිරීම සාමාන්‍යයෙන් - අනිවාර්යයෙන් සිදුකරන බව හෝටලයේ ආරක්ෂක කළමනාකරු ජනාධිපති කොමිසමේදී ප්‍රකාශ කළේය. එහෙත් ජමීල්ගේ ජාතික හැඳුනුම්පත් අංකය එම පද්ධතියේ නොමැති බව පසුව අනාවරණය විය. ජමීල්ගේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර නැද්ද, නැත්නම් ඇතුළත් කිරීමෙන් පසු කිසිවකු විසින් මකා ඇද්ද යන්න ගැනත්, ජාතික හැඳුනුම්පත් අංකය මුල් අවස්ථාවේදී ම ඇතුළත් කර නැත්නම් එය අතපසුවීමකින් සිදුවූවක් ද, නැත්නම් කිසිවකුගේ දැනුම්දීම මත හෝ බලපෑමක් මත සිදුවූවක් ද යන්න ගැනත්, දත්ත පද්ධතියට ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර, පසුව ඉවත් කර ඇත්නම් එය කවුරුන් විසින් කුමන හේතුවක් නිසා සිදුකරන ලද්දක් ද යන්න ගැනත් විමර්ශනයක් කළ යුතුව තිබේ.

3) 2019 අප්‍රේල් 20 වැනිදා ටාජ් සමුද්‍රා හෝටලයට ජමීල් පැමිණීමට පෙර 2019 අප්‍රේල් 17 වැනිදා සැකකටයුතු පුද්ගලයකු හෝටලයට පැමිණි බවට ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේදී කරුණු ඉදිරිපත් විය. දහවල් 1.45ට පැමිණි ඔහු ඉන්ෂාස් බව පසුව හඳුනා ගැනිණි. ඒ අනුව අප්‍රේල් 17 වැනිදා ඉන්ෂාස් පැමිණීමට අමතරව තවත් සැකකටයුතු පුද්ගලයන් මෙම ප්‍රහාරයට පෙර සහ පසුව හෝටලයට පැමිණියේද යන්න ගැන නිසි විමර්ශනයක් වී නොමැති බැවින් ඒ ගැන තවදුරටත් විමර්ශනය කළ යුතුය.

4) 2019 අප්‍රේල් 20 වැනිදා සවස 4.17ට පමණ කාමරයක් වෙන්කරවාගෙන, හෝටල් කාමරයට ගොස් යළි හෝටලයෙන් පිටත්වී ඇති ජමීල් නැවත පැමිණ ඇත්තේ 2019 අප්‍රේල් මස 21 වැනිදා උදෑසන ය. උදෑසන පැමිණි ඔහු කාමරය අසලට ගොස් නැවත පැමිණ කාමරය විවෘත කිරීමට අලුත් කාඩ්පතක් ඉල්ලා ඇති බව ජනාධිපති කොමිසමේදී අනාවරණය විය.

ඔහුට මුල් අවස්ථාවේ නිකුත් කළ කාඩ්පතට කුමක් සිදුවීද යන්න ගැන වැඩිදුර විමර්ශනයක් සිදුවී නැත. ඒ අනුව මෙම කරුණ ගැන ද විමර්ශනය කළ යුතුව තිබේ.

5) 2019 අප්‍රේල් 21 වැනිදා උදෑසන ටාජ් සමුද්‍රා හෝටලයට ජමීල් යළි පැමිණ (බෝම්බය පුපුරා නොයෑම නිසා හෝ වෙනත් කරුණක් මත) ඔහු හෝටලයෙන් පිටත්වීමට මොහොතකට පෙර, එනම් උදෑසන 8.51ත් 8.54ත් අතර ජමීල්ට දුරකතන ඇමතුමක් ආ බව සීසීටීවී කැමරාවල සටහන් විය. ජමීල්ට එසේ ඇමතුම් ලබාදුන් පුද්ගලයා කවුරුන්ද යන්න ගැන මෙතෙක් අනාවරණය කරගෙන නැති බැවින් ඒ ගැන විමර්ශනය කළ යුතුය.

6) තමා හිජ්රා යන බව පවසමින් 2019 අප්‍රේල් 20 වැනිදා උදෑසන 8.30ට ජමීල් විසින් ඔහුගේ බිරිඳ ෆාතිමා ෂිෆානා උමර්කාතාට වොයිස් පණිවුඩයක් යවා ඇති බව විමර්ශනවලදී උමර්කාතා ප්‍රකාශ කර තිබිණි. එසේ යැව්වේ යැයි උමර්කාතා විසින් ප්‍රකාශ කරනු ලැබූ වොයිස් පණිවුඩවල කුඩා ළමයින්ගේ ශබ්ද ඇසෙන බව ජනාධිපති කොමිසමේදී අනාවරණය විය. එම වොයිස් පණිවුඩයේ පසුබිමින් කඩහඬ ඇසෙන ළමයින් කවුරුන්ද සහ එම වොයිස් පණිවුඩ පටිගත කළේ කුමන ස්ථානයකදීද, කුමන දිනයකදීද යන්න විමර්ශනය කළ යුතුය.

7) එම වොයිස් පණිවුඩය එවූයේ යැයි කියන ජංගම දුරකතන අංකය මකා දැමූ බව ජමීල්ගේ බිරිඳ උමර්කාතා විමර්ශනවලදී ප්‍රකාශ කර තිබේ. එම වොයිස් පණිවුඩය පැමිණියේ ජමීල්ගේ සාමාන්‍ය දුරකතන අංකයෙන් නොවන බව ද ඇය සඳහන් කර තිබේ. ඒ අනුව මෙම වොයිස් පණිවුඩය එවන ලද්දේ ජමීල් විසින්මද, නැත්නම් කලින් පටිගත කළ හඬපටයක් වෙනත් පුද්ගලයකු විසින් එවන ලද්දේද යන්න ගැනත්, එලෙස එවන ලද අංකය කුමක්ද යන්න ගැනත් මෙතෙක් විමර්ශන මගින් අනාවරණය කරගෙන නැති බැවින් ඒ ගැන විමර්ශනය කළ යුතුය.

8) 2019 අප්‍රේල් 19 වැනිදා ජමීල් නිවසින් පිටවූ මොහොතට අදාළ ව සීසීටීවීවල සටහන් වූ දර්ශන 2019 අප්‍රේල් 21 සවස ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් පරීක්ෂා කර ඇති අතර, එම දර්ශන ඇතුළත් ඩීවීආර් යන්ත්‍රය ත්‍රස්ත මර්දන අංශයේ නිලධාරීන් රැගෙන ගොස් තිබිණි. එසේ රැගෙන යන විට 2019 මාර්තු 31 වැනිදා සිට අප්‍රේල් 21 සවස යන්ත්‍රය ගලවන අවස්ථාව වන තෙක් දර්ශන පටිගත වී තිබී ඇත. එලෙස රැගෙන ගිය ඩීවීආර් යන්ත්‍රයේ 2019 අප්‍රේල් 19 වැනිදා උදෑසන 8.00 සිට 2019 අප්‍රේල් 21 වැනිදා සවස 2.30 දක්වා වූ වීඩියෝ කොටස පමණක් නොමැති බව ජනාධිපති කොමිසමේදී අනාවරණය විය. නිලධාරීන් කොමිසම හමුවේ ප්‍රකාශ කර තිබුණේ ඩීවීආර් යන්ත්‍රය ගලවාගෙන ගොස් අදාළ විමර්ශන සිදුකරන අවස්ථාවේදී අදාළ වීඩියෝ දර්ශන මැකීයන්නට ඇති බවයි. මුලින් අදාළ දර්ශන තිබී ඇති අතර, පසුව සමස්ත සීසීටීවී දර්ශනවලින් ජමීල් නිවසින් පිටත් වන දිනයේ සිට ටීඅයිඩී නිලධාරීන් යන්ත්‍රය ගලවාගන්නා අවස්ථාව වන තෙක් කොටස පමණක් මැකී ගියේ කෙසේද යන්න ගැන විමර්ශනය කළ යුතු අතර, එලෙස මැකී ගිය දර්ශන යළි ප්‍රතිශ්ඨාපනය කර එම දර්ශන ආශ්‍රයෙන් ජමීල්ගේ, ජමීල්ගේ නිවසේ සාමාජිකයන්ගේ සහ නිවසට මෙම කාලය තුළ පැමිණි පිරිස ගැන විමර්ශනය කළ යුතුව ඇත.

9) 2019 අප්‍රේල් 20 වැනිදා සවස ටාජ් හෝටලයට ගොස් ඉන් පිටත්වී ඇති ජමීල්, ඉන්පසු පානදුර පිහිටි නිවසකට ගොස් ඇති අතර, එතැන් සිට සවස 7ට පමණ පිටත් වී ගල්කිස්ස ටෙම්ප්ලර්ස් පාරේ ස්පෑම් ටවර් වෙත සවස 7.33ට තවත් දෙදෙනකු සමග ගොස් ඇති බවට කරුණු අනාවරණය වුවද එලෙස ගිය දෙදෙනා කවුරුන්ද යන්න ගැන විමර්ශන පවත්වා නැත. එසේ හෙයින් ඒ සම්බන්ධයෙන් ද විමර්ශන පැවැත්විය යුතුය.

10) 2019 අප්‍රේල් 21 වැනිදා ජමීල් එබනිසා පල්ලිය තුළ සිටියදී ඔහුගේ අතේ ජංගම දුරකතනයක් තිබෙනු පල්ලියේ මවුලවිවරයා නිරීක්ෂණය කර තිබිණි. කෙසේ වෙතත් පල්ලියෙන් පිටතට යන ඔහුව පරීක්ෂා කරද්දී ජංගම දුරකතනයක් නොතිබූ බව අමීර් නම් පෞද්ගලික ආරක්ෂක අංශ නිලධාරියා ඔහු පරීක්ෂා කිරීමෙන් පසු ප්‍රකාශ කර තිබේ. එබනිසා පල්ලිය තුළදී ඔහු සතුව තිබූ ජංගම දුරකතනය පල්ලියෙන් පිටතට පැමිණීමේදී නොතිබීමට හේතුව සහ ඔහු සතු වූ ජංගම දුරකතනය කිසියම් පුද්ගලයකු ලබාගෙන ඇද්ද, එසේ ලබාගෙන ඇත්නම් ඒ කවුරුන්ද යන්න සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතුය.

11) ටාජ් සමුද්‍රා හෝටලයේදී ජමීල් අත වූ ජංගම දුරකතනය සහ එබනිසා පල්ලිය තුළදී ජමීල් සතු වූ ජංගම දුරකතනය එකම ජංගම දුරකතනය ද යන්න ගැන විමර්ශනය කළ යුතුය.

12) තමන් පල්ලියේ රැඳීසිටින්නේ වෙනත් කෙනකු එන තෙක් බවට ජමීල් ප්‍රකාශ කළේ යැයි ජනාධිපති කොමිසමේදී අනාවරණය විය. මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර ඔහු එලෙස රැඳී සිටියේ කුමන පුද්ගලයකු පැමිණෙන තෙක් ද යන්න විමර්ශනය කළ යුතුය.

13) 2019 අප්‍රේල් 21 වැනිදා බෝම්බ ප්‍රහාර මාලාවෙන් සුළු වේලාවකට පසු යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂවරයා විසින් ජමීල්ගේ නිවස වෙත යුද හමුදා බුද්ධි නිලධාරීන් පිරිසක් යොමු කර ඇතැයි ජනාධිපති කොමිසමේදී අනාවරණය විය. එබනිසා පල්ලිය අසලදී ජමීල්ව පරීක්ෂා කළ පෞද්ගලික ආරක්ෂක අංශ සාමාජිකයාට එලෙස ගිය බුද්ධි නිලධාරීන් දුරකතන ඇමතුමක් ලබාදී හැව්ලොක් බුදු පිළිමයක් අසලට පැමිණෙන ලෙස දැනුම් දී ඇති බවත්, ඔහු එහි ගියද අදාළ පිරිස නොපැමිණි නිසා ඔවුන් අනතුරක් කිරීමට උත්සාහ කළේද යන්න ගැන සැක මතුවී වහාම වැල්ලවත්ත පොලිසියට ආරක්ෂක නිලධාරියා ගොස් ඇති බවත් ජනාධිපති කොමිසමේදී අනාවරණය විය. මේ සම්බන්ධයෙන් මෙතෙක් විමර්ශනයක් සිදු කර නැති හෙයින් ඒ ගැන විමර්ශනයක් කළ යුතුය.

14) ජමීල්, සහරාන් ඇතුළු පිරිස 2019 අප්‍රේල් 20 වැනිදා දහවල් ගිනි අවි සහ වෙනත් ආයුධ රැගෙන පටිගත කළේ යැයි කියනු ලබන දර්ශනවල ඇති ටී 56 ගිනිඅවියට කුමක් සිදුවීද, එය කිසියම් තැනකට ගෙන ගොස් දැමුවේ නම් ඒ කවුරුන් විසින්ද යන්න ගැන විමර්ශනයක් කළ යුතුය.

15) එසේම එලෙස පටිගත කළ දර්ශන පසු අවස්ථාවකදී කල්මුණේ ප්‍රදේශයේ තිබී සොයාගෙන අක්කරෙයිපත්තු පොලිසියේ නිලධාරීන් විසින් ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයට බාර දෙනු ලැබ තිබේ. එම දර්ශන අදාළ ප්‍රදේශයට රැගෙන ගියේ කවුරුන්ද යන්න ගැන විමසද්දී

ජනාධිපති කොමිසමට ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් ප්‍රකාශ කළේ මඩකලපුව බෝම්බකරු එලෙස රැගෙන යන්නට ඇතැයි සැකකරන බවයි. කෙසේ වෙතත් මඩකලපුව බෝම්බකරු සම්බන්ධ විමර්ශනයේදී ඒ බව අනාවරණය වී නැත. එසේ හෙයින් මෙම දර්ශන ඇතුළත් උපකරණ අදාළ ප්‍රදේශයට රැගෙන ගියේ කවුරුන්ද යන්න ගැන විමර්ශන කළ යුතුය. එසේම මෙම පටිගතකිරීම්වල පසු තලයේ දැක්වෙන බැනරය කල්මුණේ ප්‍රදේශයෙන් 2019 අප්‍රේල් 26 වැනිදා සොයාගැනුණු අතර, එම බැනරය අදාළ ප්‍රදේශයට ගෙන ගියේ කවුරුන් විසින්ද යන්න ගැන විමර්ශනය කළ යුතුය.

16) ජමීල් සාමාජිකත්වය දැරූ (තවත් බෝම්බකරුවන් තිදෙනකු සාමාජිකත්වය දැරූ) ජේඑම්අයි සංවිධානයට සුරේෂ් සලේ මහතා බුද්ධි අධ්‍යක්ෂව සිටියදී යුද හමුදා බුද්ධි අංශ ඒජන්තයකු යොමු කර ඇති බවත්, එම ඒජන්තයාට ජේඑම්අයි සංවිධානයේ සාමාජිකයකුව සිටිමින් ජේඑම්අයි සංවිධානයේ සාකච්ඡා පැවැත්වීම සඳහා විදේශ බුද්ධි අංශයක සහයෝගයෙන් යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයෙන් නිවසක් ලබාදී ඇති බවත් ජනාධිපති කොමිසමේදී අනාවරණය විය. එම ඇතැම් සාකච්ඡා පටිගත කර ඇති බව ද විමර්ශනවලදී අනාවරණය විය. එම සාකච්ඡාවල කතා කළ කරුණු සම්බන්ධයෙනුත්, ජේඑම්අයි සංවිධානයේ සාමාජිකයකු ලෙස ඒජන්තවරයකු යොදවා සිටියදීත් ඔවුන්ගේ සැලසුම් ගැන අනාවරණය කරමින් එය ව්‍යර්ථ කිරීමට අපොහොසත්වීම සම්බන්ධයෙනුත් විධිමත් විමර්ශනයක් මේ වන තෙක් සිදුවී නැත. එසේ හෙයින් ඒ සම්බන්ධයෙන් ද විධිමත් විමර්ශනයක් සිදු කළ යුතුය.

17) 2018 දෙසැම්බර් මාසයේදී සහරාන් ඉන්දියාවට ගිය බවට යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය යුද හමුදාපතිට සහ ආරක්ෂක මණ්ඩලයට දැනුම් දී ඇතැයි ජනාධිපති කොමිසමේදී අනාවරණය විය. සත්‍ය වශයෙන්ම සහරාන් ඉන්දියාවට ගොස් තිබේද, එසේ නැතිනම් සහරාන් අදාළ මාසයේදී ලංකාවේ සිදු කළ කාර්යයන් (සාකච්ඡා ඇතුළුව) ගැන කරුණු අනාවරණය වීම වැළැක්වීම සඳහා එම කතාව ගොතා ඇත්දැයි යන්න ගැන විමර්ශනය කළ යුතුය. ඔහු ඉන්දියාවට ගියේ නම් ගියේ කොහේටද, කා හමුවීමටද යන්න ගැන විමර්ශනය කළ යුතුය.

18) ජමීල් සාමාජිකත්වය දැරූ ජේඑම්අයි සංවිධානයේ සාමාජිකයකු වූ මොහොමඩ් ඉල්හාම්ගේ බිරිඳ ෆාතිමා ජිෆ්රියා මහවිල උද්‍යානයේදී සිදු කර ගත් බව කියන පිපිරීමකින් ඇයත්, ඇගේ දරු තිදෙනාත්, කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් තිදෙනකුත් මරණයට පත් විය. මෙම පිපිරීමට පෙර අදාළ නිවසේ සිට පුද්ගලයකු පළාගිය බවට කතාබහක් පැවැති බව ජනාධිපති කොමිසමේ සාක්ෂි විභාගයේදී කියැවිණි. ඒ සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් කර එලෙස පුද්ගලයකු පළාගොස් ඇද්ද, පළාගියේ නම් ඒ කවුරුන්ද, ඔහු එම නිවසේ කුමක් කළේද යන්න ආදිය ගැන විමර්ශනයක් සිදු කළ යුතුය.

19) ඉහත කී ෆාතිමා ජිෆ්රියාගේ ජංගම දුරකතනය තලා දමා වෙනත් නිවසක තිබියදී විමර්ශන කණ්ඩායම් විසින් සොයා ගනු ලැබූ අතර, එම දුරකතනය ඔස්සේ විමර්ශන සිදු කළ යුතුය.

20) ජමීල් සහ ඉල්හාම් ආශ්‍රය කිරීමට පටන්ගෙන ඇත්තේ 2014 වසරේදී වන අතර, ඉල්හාම් වෙනස් වී ඇත්තේ ජමීල්ගේ ආශ්‍රයෙන් පසුව බවත්, එසේ හෙයින් ජමීල්ට ඉල්හාම් සිටි

නිවසට පැමිණීම ඉල්හාම්ගේ පියා වන ඊබ්‍රහිම් නම් ව්‍යාපාරිකයා තහනම් කර ඇති බවත් පාස්කු කොමිසමේදී අනාවරණය විය. ජමීල් සහ ඉල්හාම් ඇතුළු පිරිස මෙම කාලවකවානුවේදී මරදානේ පිහිටි ශ්‍රී ලංකා තවුහිද් ජමාත් පල්ලියට ගොස් ඇති බව ද අනාවරණය විය. කටුවාපිටිය පල්ලියේ බෝම්බකරු වූ හස්තුන් සහ ඔහුගේ බිරිඳ පුලස්තිනී මහේන්ද්‍රන් යන දෙදෙනාගේ ආරම්භය ද ශ්‍රී ලංකා තවුහිද් ජමාත් පල්ලිය වේ. ශ්‍රී ලංකා තවුහිද් ජමාත් නායක අබ්දුල් රාසික් 2015 යහපාලන ආණ්ඩුව බලයට පැමිණීමට පෙර බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායකගේ කාර්යාලයට කැඳවා යුද හමුදා බුද්ධි අංශ නිලධාරීන් සාකච්ඡා කර ඇති අතර, ආරක්ෂක අමාත්‍යංශයට කැඳවා ද සාකච්ඡා කර ඇති බව ජනාධිපති කොමිසමේදී අනාවරණය විය. ඒ බව නියෝජ්‍ය පොලිස්පති පාලිත සිරිවර්ධන මහතා ප්‍රසිද්ධ සාකච්ඡාවකදී ද තහවුරු කළේය. පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරය සහ ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානයේ ක්‍රියාකාරිත්වය අතර ඇති සම්බන්ධතාව 2013 වසරේ සිට පූර්ණ විමර්ශනයකට ලක් කළ යුතු වුවද, මේ දක්වා එවැනි විමර්ශනයක් සිදුවී නැත. එසේ හෙයින් මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කළ යුතුය.

**සහරාන් සමග සම්බන්ධ වූ අබු-හින්ද් සම්බන්ධ කරුණු**

අබු-හින්ද් මෙම ප්‍රහාරය අවුළුවාලීමට කටයුතු කරන්නට ඇති බවට ජාතික බුද්ධි ප්‍රධානී නිලන්ත ජයවර්ධන ජනාධිපති කොමිසම හමුවේ ප්‍රකාශ කර තිබිණි. සහරාන්ට අමතරව රිල්වාන් සහ නවුෆර් මවුලවි සමග ද අබු-හින්ද් කතා කළ බව ජනාධිපති කොමිසමේදී හෙළිදරව් විය. රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපතිවරයාව සිටි කාලයේදී පාර්ලිමේන්තුවේ පැවැති විවාදවලදී එවකට ආණ්ඩු පක්ෂයෙන් ප්‍රකාශ කළේ අබු-හින්ද් යනු තොරතුරු ලබාගැනීම සඳහා විදේශ ඔත්තු සේවාවක් මගින් භාවිත කළ අන්වර්ථ නාමයක් පමණක් බවයි. කෙසේ වෙතත් ජනාධිපති කොමිසමේදී අනාවරණය වූ පරිදි අබු-හින්ද් මෙම ප්‍රහාරයේ ප්‍රධාන කොටස්කරුවකු හෝ සාක්ෂිකරුවෙකි. කෙසේ වෙතත් අබු-හින්ද් යනු කවුරුන්ද යන්න ගැන මේ වන තෙක් අනාවරණය කරගෙන නැත. එසේ හෙයින් අබු-හින්ද් සම්බන්ධයෙන් විමර්ශනයක් කර ඔහු කවුරුන්ද යන්න ගැනත්, ඔහු වැඩ කළේ කවුරුන් යටතේද යන්න ගැනත් තොරතුරු අනාවරණය කර ගත යුතුය.

**කල්මුණේ, සයින්දමරුදු බොලිවේරියන් ග්‍රාමයේ ප්‍රහාරයේදී පළාගියා යැයි සැකකරන පුලස්තිනී මහේන්ද්‍රන් නොහොත් සාරා ජස්මින් සම්බන්ධ කරුණු සහ සයින්දමරුදු පිපිරීම ගැන**

කල්මුණේ සයින්දමරුදු බොලිවේරියන් ග්‍රාමයේ නිවසක පිපිරීම සිදුවූයේ 2019 අප්‍රේල් 26 වැනිදා ය. මෙම පිපිරීම සම්බන්ධ සමස්ත ක්‍රියාවලිය ඉතා සැකසහිත මෙතෙක් විමර්ශනය නොවූ කරුණු රැසකින් සමන්විත ය.

1) පළමු කාරණය වන්නේ මෙම නිවසේ සිදුවීම සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන් ප්‍රකාශ, ජනාධිපති කොමිසමට ලබා දුන් ප්‍රකාශ, උසස් නිලධාරීන්ගේ ගමන් සටහන් පොතේ යෙදූ සටහන්, තොරතුරු පොත්වල යෙදූ සටහන් සහ මානව හිමිකම් කොමිෂන් සභාවට ලබා දුන් ප්‍රකාශවල පරස්පරතා තිබීමයි.

ඒ අනුව එම සියලු ප්‍රකාශ අධ්‍යයනය කර එම පරස්පරතා සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතුය.

2) මෙම පිපිරීමෙන් පසු ඊළඟ දිනයේදී ම, එනම් 2019 අප්‍රේල් 27 වැනිදා මෙම ප්‍රදේශය අයත් වන පොලිස් ස්ථානය වන කල්මුණේ මූලස්ථාන පොලිසියේ මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා කල්මුණේ මහේස්ත්‍රාත් අධිකරණයට බී වාර්තාවක් ඉදිරිපත් කරමින් අදාළ පිපිරීමෙන් 16 දෙනකු මරණයට පත්වූ බව වාර්තා කළේය. කෙසේ වෙතත් ඊට දින 02කට පසු වෙනත් පොලිසියක ස්ථානාධිපතිවරයකු, එනම් අම්පාර මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා එම අධිකරණයටම කරුණු වාර්තා කරමින් සයින්දමරුදු පිපිරීමෙන් 17 දෙනකු මරණයට පත්වූ බව වාර්තා කළේය. මිය ගිය අය සම්බන්ධයෙන් අලුත් කිසිම තොරතුරක් සොයාගෙන නොමැති තත්ත්වයක් තුළ සහ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවල 16 දෙනකුගේ මරණ සම්බන්ධයෙන් පමණක් සවිස්තරාත්මකව ඇතුළත්ව තිබියදී 17 දෙනකු මරණයට පත්වූ බවට මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා කරුණු වාර්තා කළේ කුමන පදනමක් මත ද යන්න විමර්ශනය කළ යුතුය.

3) මෙම ප්‍රහාරයෙන් දිවි බේරාගත් බවට මුලින්ම වාර්තා වූයේ සහරාන් හෂීම්ගේ බිරිඳ වන ෆාතිමා හාදියා සහ සහරාන්ගේ හා හාදියාගේ දියණියයි. ප්‍රහාරයෙන් තුවාල ලබා ප්‍රතිකාර ලබමින් සිටියදී පොලිසිය මුල් වරට හාදියාගෙන් ප්‍රකාශ සටහන් කර ගන්නේ 2019 මැයි මස 03 වැනිදා උදෑසන 11.30ට ය. එම ප්‍රකාශය දින 03ක් සටහන් කර ගත් අතර, සාරා ජස්මින් සයින්දමරුදු නිවසේ පිපිරුම සිදුවන අවස්ථාවේ සිටි බවට අනාවරණය වූයේ 2019 මැයි මස 05 වැනිදා සවස 5.19ට ය. ඊට පෙර අම්පාර මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා විසින් 17 දෙනකු මරණයට පත්වූ බවට කරුණු වාර්තා කරනු ලැබුවේ සාරා ජස්මින් මිය ගිය බවට ඒත්තු ගැන්වීමට ද යන්න ගැනත්, හාදියාගෙන් සාරා සිටි බවට කරුණු අනාවරණය වීමට පෙර සාරා සිටි බව අනාවරණය කරගත්තේ නම් ඒ කෙසේද යන්න ගැනත් විමර්ශන කළ යුතුය.

4) එසේම සාරා මිය ගිය බවට කිසිම සාක්ෂියක් නොතිබියදී සහ සාරා සම්බන්ධයෙන් ඩී.එන්.ඒ තහවුරු වී නොතිබියදී ඇය මරණයට පත්වූ බව අම්පාර පොලිස් ස්ථානය අධිකරණයට වාර්තා කළේ කෙසේද යන්න ගැන විමර්ශන සිදු කළ යුතුය.

5) සයින්දමරුදු ප්‍රහාරයෙන් පසු සාරා ජස්මින්ගේ හැඩහුරුකම ඇති සහ ඇගේ කටහඬ ඇති කාන්තාවක් තමන්ට එම ස්ථානයේදී කතා කළ බවට සහරාන්ගේ බිරිඳ පාස්කු කොමිසම හමුවේ ප්‍රකාශ ලබාදෙමින් සඳහන් කර තිබේ. එසේම සහරාන්ගේ බිරිඳ මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉදිරියේ ද ප්‍රකාශ කර තිබේ. එසේ හෙයින් ඒ පිළිබඳව විධිමත් විමර්ශනයක් සිදු කළ යුතුය.

6) සයින්දමරුදු පිපිරීම අතරතුර අදාළ ප්‍රදේශයෙන් යතුරුපැදියක් පළාගිය බවට එම ස්ථානයේ සිටි නිලධාරීන් සහ සිවිල් ප්‍රජාව ප්‍රකාශ කර තිබේ. එසේ යතුරුපැදියකින් පළාගියේ කවුරුන්ද යන්න ගැන මෙතෙක් විමර්ශන සිදුකර නැත. ඒ සම්බන්ධයෙන් ද විමර්ශනය කළ යුතුය.

7) එසේම අදාළ පිපිරීමෙන් පසු යම් පුද්ගලයකු පළාගිය බවට සහ හමුදාව ඒ දෙසට වෙඩි තැබීමක් කළ ද ඔහු අල්ලාගැනීමට නොහැකි වූ බවද, යමකුගේ පළායෑමක් සීසීටීවී එකක පටිගත වී ඇති බව ද ජනාධිපති කොමිසමේ දී හෙළිදරව් විය. ඒ සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් සිදු කර සත්‍ය අනාවරණය කර ගත යුතුය.

8) එසේම බෝම්බ පිපිරීමෙන් පසු සහරාන්ගේ සහෝදරයකු ජීවතුන් අතර සිටි බවත්, පසුව වෙඩි හඬක් ඇසුණු බවත් සහරාන්ගේ බිරිඳ ෆාතිමා හාදියා ජනාධිපති කොමිසමේදී ප්‍රකාශ කර තිබේ. නිවසේ සිදුවූ බෝම්බ පිපිරීමෙන් සහරාන්ගේ සහෝදරයකු මරණයට පත් වී නොමැති තත්ත්වයක් තුළ, ඉන්පසුව එම ස්ථානයට ළඟා වූ කිසිවකු විසින් ඔහු ඝාතනය කර පිළිස්සීමට ලක්කළේද යන්න ගැන විධිමත් විමර්ශනයක් සිදු කළ යුතුව ඇත.

9) එසේම අදාළ දිනයේදී බොලිවේරියන් ග්‍රාමයට ඇතුළු වන පාලම මතදී හමුදාවේ වෙඩි ප්‍රහාරයකින් ත්‍රිරෝද රියක සිටි කාන්තාවක මරණයට පත්විය. බොලිවේරියන් ග්‍රාමයේ පුපුරා ගිය අදාළ නිවස සහරාන්ලාගේ කණ්ඩායමට සොයාදීමට ඇය යම් මැදිහත්වීමක් සිදු කළ බවට ඒ දිනවල ප්‍රදේශයේ රාවයක් ගියද, ඒ ගැන විධිමත් විමර්ශනයක් සිදු වූයේ නැත. අණ නොතකා ධාවනය කිරීම නිසා වෙඩි තැබීම කළ බවට අධිකරණයට කරුණු වාර්තා කර වැඩිදුර විමර්ශන අතරමග නතර කර තිබිණි. ඒ අනුව මෙම කාන්තාවගේ මරණය ගැන ද විධිමත් විමර්ශනයක් සිදු කළ යුතුය.

10) සයින්දමරුදු නිවස දෙස සිට එදින එල්ල කරන ලද වෙඩි ප්‍රහාරවලදී ට්‍රේසර් බුලට් නිකුත් වූ බව ජනාධිපති කොමිසමේදී අනාවරණය විය. හමුදා මෙහෙයුම්වලදී සිටින ස්ථානය හඳුනාගැනීම සඳහා වැඩි වශයෙන් යොදාගන්නා ට්‍රේසර් බුලට්ස් මෙම කණ්ඩායම අතට පත්වූයේ කෙසේද යන්න ගැන මෙතෙක් අනාවරණය වී නැත. එසේ හෙයින් ඒ ගැන විධිමත් විමර්ශනයක් සිදු කළ යුතුව ඇත.

11) මෙම සිදුවීමෙන් පසු සයින්දමරුදු නිවස ඉදිරිපිට මිය ගොස් සිටි පුද්ගලයාගේ අත තිබූ ගිනිඅවිය ශ්‍රී ලංකා පොලිසියට නිකුත් කළ ගිනිඅවියකි. එම ගිනිඅවිය අදාළ පුද්ගලයා අතට පත්වීම සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් සිදු කළ යුතුය.

12) සයින්දමරුදු පිපිරීම සිදුවන අවස්ථාවේදී කල්මුණේ සියාම් ද අදාළ නිවසේ සිට පැන ගිය බවට වන තොරතුරක් ජනාධිපති කොමිසමට ඉදිරිපත් වී තිබුණු අතර, එය සනාථ කෙරෙන සාක්ෂි හමුවී තිබුණේ නැති බව ද කියැවිණි. එසේ හෙයින් මෙම කරුණ සම්බන්ධයෙන් ද විමර්ශන සිදු කළ යුතුය.

13) සාරා ජස්මින්ගේ ජාතික හැඳුනුම්පතට 2020 වසරේදී සිම්පතක් ලබාගෙන ඇති බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කළ විමර්ශනවලදී අනාවරණය වී ඇතත්, 2020න් පසු එම විමර්ශන අතරමග නතර කර තිබේ. ඒ අනුව අදාළ සිම්පත මිලදී ගැනීම ගැන විමර්ශනය කළ යුතුය.

14) එසේම සාරා ජස්මින්ගේ ජාතික හැඳුනුම්පත සයින්දමරුදු ප්‍රහාරයෙන් දින කිහිපයකට පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ට අම්පාර කොට්ඨාස භාර නිලධාරි විසින් ලබාදී ඇත. අපරාධ ස්ථානයේ මුල් අවස්ථාවේදී හමුවූ භාණ්ඩ ලැයිස්තුවේ එවැනි ජාතික හැඳුනුම්පතක් හමුවූ බවට සඳහනක් නැත. මෙම ජාතික හැඳුනුම්පත පසුව ලබාදී ඇත්තේ සාරා එම ස්ථානයේ මිය ගිය බවට ඒත්තු ගැන්වීම සඳහා වන කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් ලෙස ද යන්න ගැන ද විමර්ශනය කළ යුතුය.

**විදේශගතව සිටිමින් චැනල් ෆෝ නාලිකාව ඔස්සේ අනාවරණයක් කළ හන්සීර් අසාද් මවුලානාගේ ප්‍රකාශවලට අදාළ කරුණු**

හන්සීර් අසාද් මවුලානාගේ ප්‍රකාශය ගැන සමාජය හා සාමයික කේන්ද්‍රය කළ පැමිණිල්ලක් මත මේ වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශන ආරම්භ කර තිබේ. ඔහුගේ ප්‍රකාශ ගැන සොයාබැලීමට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා පත් කළ කමිටු වාර්තාව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී උදය ගම්මන්පිල මහතා ප්‍රසිද්ධියට පත්කළේය. එම වාර්තාවේ අදාළ කමිටුව සඳහන් කර ඇත්තේ අසාද් මවුලානා හා සහරාන්ලාගේ කණ්ඩායම අතර සම්බන්ධතාවක් තිබුණු බවට සැකකරන බවයි. එසේම 2018 අගෝස්තු මාසයේදී සහරාන්ගේ සහෝදරයා වූ රිල්වාන්ට ප්‍රතිකාර කළ වෛද්‍යවරයා සහ අසාද් මවුලානා යන දෙදෙනාම එකම ගමේ (මරදමුණේ) ජීවත්වූවන් බවත්, වෛද්‍යවරයාට විදේශගතවීමට අසාද් මවුලානා උපකාර කර ඇති බවත්, දෙහිවල එබනිසා පෙදෙසේ ඒ දෙදෙනාටම නිවාස 02ක් ඇති බවත් එම වාර්තාවේ සඳහන් වේ. චැනල් ෆෝ සමස්ත අනාවරණය ගැන විමර්ශනය කරන අතරතුර පහත කරුණු ගැන ද විමර්ශනය කළ යුතුය.

1) අසාද් මවුලානා චෝදනා කරන්නේ යුද හමුදා හිටපු බුද්ධි අධ්‍යක්ෂ සුරේෂ් සලේ මහතා 2019 අප්‍රේල් 21 වැනිදා කතා කර, ජමීල්ව රැගෙන යන ලෙසට දැනුම් දුන් බවයි. මීට පෙර මෙම ලේඛනයේ සඳහන් කළ පරිදි 2019 අප්‍රේල් 21 වැනිදා ටාජ් සමුද්‍රා හෝටලයේදී බෝම්බය පිපිරී නොගිය අතර, එදින උදෑසන 8.51ත් 8.54ත් අතර ජමීල්ට දුරකතන ඇමතුමක් ලැබෙයි. එම ඇමතුමෙන් පසු ජමීල් හෝටලයෙන් පිටත්ව දෙහිවල ට්‍රොපිකල් ඉන් ලැගුම්හලට ගොස් බෑගය එහි තබා ඔහු යන්නේ දෙහිවල එබනිසා පෙදෙසේ මුස්ලිම් දේවස්ථානය වෙත ය. ඔහු පුද්ගලයකු එනතුරු දීර්ඝ වේලාවක් රැඳී සිටි අතර, තමන් රැඳීසිටින්නේ මිතුරකු එන තෙක් බව පල්ලියේ මවුලවිවරයාට ජමීල් ප්‍රකාශ කළ බව ජනාධිපති කොමිසමේදී අනාවරණය විය. චැනල් ෆෝ චෝදනා ගැන සෙවූ ජනාධිපති කමිටුව සඳහන් කරන පරිදි දෙහිවල එබනිසා පෙදෙසේ අසාද් මවුලානාට අයත් නිවසක් තිබේ. එසේ නම් ජමීල් ටාජ් හෝටලයේ සිට දෙහිවල එබනිසා පල්ලියට ගියේ අසාද් මවුලානා හමුවීමට ද, එසේ නැත්නම් ඔහුගේ නියෝජිතයකු හමුවීමට ද යන්න ගැන විමර්ශනය කළ යුතුය.

2) රිල්වාන්ට ප්‍රතිකාර කළ වෛද්‍ය ශෆ්රාස්ට 2018 අගෝස්තු 27 වැනිදා අලුයම 1.38ට මොහොමඩ් අල්ලියාර් මර්ෂුක් රිලා නම් පුද්ගලයකු විදේශ රටක සිට ඇමතුමක් ලබා දී ඇති බවත්, ඉන්පසු ලංකාවේ අංකයකින් තුවාල ලැබූ රිල්වාන්ගේ ඡායාරූප එවා ඇමතුමක් ගත් බවත්, වහාම ඔහු කොළඹ ජාතික රෝහලට ඇතුළත් කරන ලෙස වෛද්‍යවරයා උපදෙස් දුන් බවත් ජනාධිපති කොමිසමේදී අනාවරණය විය. එසේම සහරාන් හෂීම් ඉහත කී මර්ෂුක් රිලා සහ තවත් දෙදෙනකු සමග 2018 දෙසැම්බර් මාසයේදී වෛද්‍යවරයාගේ

නිවසට ගොස් ඇති බව ද ජනාධිපති කොමිසමේදී අනාවරණය විය. වෛද්‍යවරයාගේ ජංගම දුරකතනය 2019 සැප්තැම්බර් 19 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු බාරයට ගෙන තිබේ. ඒ අනුව වෛද්‍යවරයාට රිල්වාන්ගේ ප්‍රශ්නය සම්බන්ධයෙන් කතා කළ පුද්ගලයන් ගැනත්, 2018 දෙසැම්බර් මස සහරාන් සමග වෛද්‍යවරයාගේ නිවසට ගිය පිරිස ගැනත් විමර්ශනයක් සිදු කළ යුතුය.

**ප්‍රහාරයට පෙර ලැබුණු තොරතුරු අනුව කටයුතු නොකිරීම**

ඉහත සඳහන් කළ ප්‍රධාන කරුණු 4ට අමතරව 2019 අප්‍රේල් 21 වැනිදා ලැබුණු බුද්ධි තොරතුර අනුව කටයුතු නොකිරීම ගැන ද විමර්ශනයක් කළ යුතුය. 2019 අප්‍රේල් 21 වැනිදා කිතුණු දේවස්ථාන ඉලක්ක කරගෙන ප්‍රහාරයක් එල්ල වන බවට 2019 අප්‍රේල් 20 වැනිදා සවස ලැබුණු තොරතුර අනුව කොළඹ නියෝජ්‍ය පොලිස්පති ලලිත් පතිනායක මහතා එදින රාත්‍රී 7.19ට කොළඹ දකුණ බාර පොලිස් අධිකාරි නිශාන්ත සොයිසාට කතා කර පාස්කු ඉරිදා දිනයේදී කිතුණු දේවස්ථාන ඉලක්ක කරගෙන ප්‍රහාරයක් එල්ල විය හැකි බවත්, දේවස්ථානවලට ආරක්ෂාව ලබාදී ජංගම සංචාර වැඩි කරන ලෙසත් උපදෙස් දී ඇතැයි ජනාධිපති කොමිසමේදී අනාවරණය විය. කොළඹ අගරදගුරු නිල නිවස තිබෙන්නේ ද කොළඹ දකුණ කොට්ඨාසයේ ය. එසේ තිබියදී මෙම ප්‍රහාරය ගැන තොරතුර අගරදගුරු නිල නිවසට ලබානොදීම ගැන විශේෂ විමර්ශනයක් කළ යුතුය.

---

[i]https://www.adaderana.lk/news.php?nid=54534
[ii]https://www.newsfirst.lk/tag/supreme-court-judge-vijith-malalgoda
[iii]https://www.facebook.com/watch/?v=334608847185103
[iv]https://www.facebook.com/media/set/?vanity=PresidentsMediaSriLanka&set=a.2351484108421719
[v]https://www.bbc.com/sinhala/sri-lanka-50152073
[vi]https://www.channel4.com/news/sri-lanka-bombings-were-269-people-killed-for-political-power-dispatches-exclusive
[vii]https://www.defence.lk/Article/view_article/27512
[viii]https://elections.gov.lk/web/wp-content/uploads/election-results/presidential-elections/pre2019/PRE_2019_All_Island_Result.pdf

[ix]https://www.facebook.com/AzzamAmeenSL/posts/cid-director-ssp-shani-abeysekara-transferred-to-galle-as-the-personal-assistant/2147836982189616/

[x] මෙන්න සාක්කි! පාස්කු කතාවේ ඉතිරිය | Easter Attack | #Episode2 | Tharindu | Palitha Siriwardhana